

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

වාර්ෂික වාර්තාව 2021

පටුන

මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු බිඳක්	2
මෙහෙයුම් තොරතුරු	3
සභාපතිතුමාගේ සමාලෝචනය	4
අධ්‍යක්ෂක මණ්ඩලය	6
ආයතනික පාලනය	8
අවධානම් කළමණාකරණය	11
කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය	14
තිරසාර වාර්තාව	16
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්ෂික වාර්තාව	18
විගණන කමිටු වාර්තාව	20

මූල්‍ය ප්‍රකාශන

විගණකාධිපතිවරයාගේ වාර්තාව	23
විස්තීරණ ආදායම් ප්‍රකාශය	26
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	27
ස්කන්ධ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය	28
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය	29
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්	30
පස් අවුරුදු මූල්‍ය සාරාංශය සහ ප්‍රධාන දර්ශක	52
රැස්වීම් කැඳවීමේ නිවේදනය	54
ප්‍රොක්සි (පෙරකලාසි) ආකෘතිපත්‍රය	55
සමාගම පිලිබඳ තොරතුරු	පිටුපස කවරයේ ඇතුලත

චීන අවන්හල, *Emperor's Wok*, අවාහජ පෙරදිග ආහාර වේලක අත්දැකීම් සමගින් 2021 අප්‍රේල් මස නැවත විවෘත කරන ලදී.











මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් තොරතුරු

	2021	2020
කාමර ලබාදීමෙන් ආදායම ශ්‍රී ලංකා රු.'000	**236,944**	313,080
ආහාරපාන ආදායම ශ්‍රී ලංකා රු.'000	**925,077**	742,928
වෙනත් ආදායම් ශ්‍රී ලංකා රු.'000	**16,360**	25,127
මුළු ආදායම ශ්‍රී ලංකා රු.'000	**1,178,381**	1,081,135
දළ ලාභය රු.'000	**255,686**	270,043
දළ ලාභ ආන්තික %	**21.70**	24.98
බදු අයකිරීමට පෙර ලාභය/(අලාභය) ශ්‍රී ලංකා රු.'000	**(976,414)**	(877,343)
බදු පසු ලාභය/(අලාභය) ශ්‍රී ලංකා රු.'000	**(957,226)**	(918,107)
අදළ කාලය සඳහා සමස්ත විස්තීරණ ආදායම ශ්‍රී ලංකා රු.'000	**(934,596)**	(926,194)
කොටසක ඉපැයීම් (පාඩුව) ශ්‍රී ලංකා රු	**(0.46)**	(0.45)
සාමාන්‍ය කාමර ගාස්තු ප්‍රමාණය ශ්‍රී ලංකා රු.	**16,754**	20,681
කාමර පදිංචිව වෙන් කිරීමේ අනුපාතය %	**10**	11
පොලී සහිත දිගුකාලීන ණය ගැනීම් ශ්‍රී ලංකා රු.'000	**1,098,372**	72,156
කෙටි කාලීන ණය ශ්‍රී ලංකා රු.'000	**1,348,928**	1,124,519
මුළු ස්කන්ධ ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රු.'000	**13,164,918**	14,099,514
ණය/ස්කන්ධ අනුපාතය %	**18.59**	8.49
සමස්ත වත්කම් ශ්‍රී ලංකා රු.'000	**16,768,381**	16,295,030
ණය/සමස්ත වත්කම් අනුපාතය %	**14.59**	7.34
ජංගම වත්කම් ශ්‍රී ලංකා රු.'000	**941,469**	521,978
ජංගම වගකීම් ශ්‍රී ලංකා රු.'000	**2,000,706**	1,519,046
ජංගම අනුපාතය (වාර)	**0.47**	0.34
ක්ෂණික වත්කම් අනුපාතය (වාර)	**0.44**	0.31

මෙහෙයුම් තොරතුරු



අපගේ කාර්ය මණ්ඩලය

අපගේ කාර්ය මණ්ඩලය
557 සේවකයන් **(2020: 604)**

පුහුණු සහ සංවර්ධන පැය
18,909 වාර්ෂික පුහුණු පැය **(2020: 18,317)**

කාර්ය මණ්ඩලය සඳහා කළ ගෙවීම්
රු. 506 මිලියන **(2020: රු. 456 මිලියන)**



සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ සහතික

ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති
- ISO 22000:2018 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති
- HACCP

ආරක්ෂිත සහතිකය
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2021



සම්මාන සහ ප්‍රශංසා

2021 අප්‍රේල් 28 දින, Great Place To Work (GPTW) ආයතනය විසින් හිල්ටන් හෝටලය, **2021 වසරේ ශ්‍රී ලංකාවේ හොඳම සේවා ස්ථාන 40න් එකක් ලෙස හඳුනා ගන්නා ලදී.**

TripAdvisor විසින් 2021 මැයි 13 වැනි දින, අඛණ්ඩව දෙවන වරටත් හිල්ටන් කලම්බු වෙත ඉහළම 10% අතරට පැමිණීම වෙනුවෙන් "**Traveler's Choice Award 2021**" පිරිනැමීය.

Booking.com විසින් 8.4/10 ශ්‍රේණිගත කිරීම අගයමින් 2021 මැයි 17 දින හිල්ටන් කලම්බු වෙත **"Traveler Review" සම්මානය** පිරිනමන ලදී.

හිල්ටන් කලම්බු වෙත **"Loved by guests 2021, සම්මානය** අඛණ්ඩව දෙවනවරත් hotels.com වෙතින් 8.6/10 ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම වෙනුවෙන් 2021 මාර්තු මස පිරිනමන ලදී.

හිල්ටන් කලම්බු, **"ශ්‍රී ලංකාවේ වඩාත්ම ගෞරවනීය ආයතනය 2021"** ලෙස LMD සමීක්ෂණ ආයතනය විසින් 2022 දී සම්මාන සම්මානයට පාත්‍ර කරන ලදී.

සභාපතිතුමාගේ සමාලෝචනය

"අමුත්තන්ගේ කාමර නවීකරණය කිරීමේ කටයුතු 2023 වසරේ දෙවන කාර්තුවේදී නිම කිරීමටත් එමගින් නව සංචාරක කාලසීමාවේ දී ඇති වන තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට හැකිවනු ඇතැයි සමාගම අපේක්ෂා කරයි. ආහාර පාන ලබා ගැනීමේ නවීනතම පහසුකම් ඇතිව ජපන් අවන්හල නැවත හඳුන්වාදීම ද මධ්‍යම කාලීන සැලැස්මට අයත් වේ. ආහාර පාන ව්‍යාපාරයේ සීමාවන් තවදුරටත් පුලුල් කරමින් ශ්‍රී ලාංකීක ආහාර පාන සපයන "කරි ලීෆ්" අවන්හල වැඩිදියුණු කිරීමටත් සැලසුම් කර තිබේ. ගුණාත්මකභාවය සහ ලාභ ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් දැනට වෙළඳපොළේ ඇති කරගෙන තිබෙන කීර්තිය මත හිල්ටන් ආයතනයට ඉදිරියේදී වඩාත් කැපී පෙනන අන්දමින් කටයුතු කිරීමට හැකියාව පවතින බව අපි අවබෝධ කරගෙන සිටිමු. ආයෝජන මත ප්‍රතිලාභ මංසලකුණු කොටගත් නව ආයෝජන නිසැකවම කාර්යසාධනය පදනම් කරගත් ඒවා වන අතර එමගින් කොටස් හිමියන්ට උපරිම ප්‍රතිලාභ අත්කරදෙනු ඇත. හිල්ටන් ක්‍රීඩා මධ්‍යස්ථානය ඉදිකිරීමේ දීර්ඝකාලීන සැලැස්ම ක්‍රියාත්මක කිරීමටද සමාගම බලාපොරොත්තු වේ. මේ සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යනය නිම කර ඇති අතර මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා සුදුසු ආයෝජකයකු හඳුනා ගැනීමේ අපේක්ෂාවෙන් සිටී"

සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් ලංකා සමාගමේ 2021 දෙසැම්බර් 31 වැනි දින දක්වා වූ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය වාර්තාව මම ඔබ වෙත ඉදිරිපත් කරන්නේ මහත් සතුටිනි.

කර්මාන්තයේ ඉදිරි අභිවෘද්ධිය පිළිබඳව සැලකිල්ලට ගත්විට ඔබගේ සමාගම ඉදිරි වසර සඳහා හොඳින් සූදානම් වී ඇති බව මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමි. කොවිඩ් 19 වසංගතය මගින් ඇති වූ තත්වය නිසා අපි විසින් උපකල්පනය කරනු ලැබූ හා අපේක්ෂා කරනු ලැබූ ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමට මහත් බාධාවන් ඇති කරන ලදී. වසංගතය පාලනය කිරීම සඳහා රට වසා දැමීම සහ සංචාරයන් සීමා කිරීම සඳහා ලෝකය පුරාම ගනු ලැබූ ක්‍රියාමාර්ගයන් අපගේ ප්‍රගතියට බාධා කිරීමට ඉවහල් වූ ප්‍රධාන සාධක දෙකකි.

ගෝලීය වශයෙන් පනවන ලද සංචරණ සීමාවන් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වයට ඍණාත්මක බලපෑමක් ඇති කළ අතර එමගින් ජාතික ආර්ථිකයට අත්‍යාවශ්‍ය සහ අපේක්ෂිත විදේශ විනිමය අවම වීමට ප්‍රබල හේතුවක් විය.

අපගේ පාලනයෙන් ඔබ්බෙහි පවත්නා අභියෝගයන් ගණනාවක් හමුවේ වුවද අප සමාගම වඩාත් හොඳින් මෙම තත්වයන්ට මුහුණදී තිබෙන බව ඔබට පවසා සිටින්නේ ඉතාමත් සතුටිනි. මෙම වසංගත තත්වය නිසා අපගේ ක්‍රියාකාරිත්වයන් අපේක්ෂිත මට්ටමෙහි පවත්වා ගෙන යාමට නොහැකි තත්වයන් හමුවේ පවා, මෙහි මෙහෙයුම් පවත්වාගෙන යාමට කටයුතු කිරීම වෙනුවෙන් අපගේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ට සහ කළමනාකරණයට ඔවුන්ගේ අඛණ්ඩ අධිෂ්ඨානය, නීතිගරුකබව සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අපගේ ප්‍රණාමය හිමිවිය යුතුය.

කොවිඩ් 19 වසංගතය මගින් ඇති වූ බලවත් අභියෝගයන් ජයගෙන ඉදිරි වසරේදී වඩාත් හොඳින් කටයුතු කිරීමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය ලබාගැනීමට දැක්වූ විශ්වාසනීයත්වය ප්‍රයෝජනවත් වනු ඇතැයි මම තරයේ විශ්වාස කරමි. වසංගතය පැවැති කාලසීමාවේදී අමුත්තන්ගේ කාමර සහ ආපනශාලාවන් නවීකරණය කිරීම ආරම්භ කිරීමට ඔබ සමාගම අනුගමනය කරන ලද උපායමාර්ගය මම මෙහිදී විශේෂයෙන් අවධාරණය කරනු ලබන අතර මෙමගින් නිසැකවම හිල්ටන් සන්නාමයේ ඉහළ ගුණාත්මක ප්‍රමිතීන් කරා ලඟාවීම සඳහා හෝටලයට හැකි වනු ඇත.

මෙම ක්‍රියාමාර්ගය ඉදිරියේදී එළැඹෙන සංචාරක සමයේ මෙහෙයුම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපකාරවන අතර අපගේ ආදායම් උපරිම කරගැනීමට හේතු වනු ඇත. මෙහිදි දරණ ලද ප්‍රයත්නයන් සහ යොදාගන්නා ලද ව්‍යාපාරික ක්‍රමෝපායයන් ඔබගේ සමාගමට ධනාත්මක වර්ධන පථයකට ගමන් කිරීමටත් ශක්තිමත් අන්දමින් කටයුතු කරමින් ඉදිරියට යාමටත් උපකාර වනු ඇත.

මෙහෙයුම් සමාලෝචනය

සමාලෝචනය කරන ලද වසරේ වාර්තා ආදායම රුපියල් බිලියන 1.2 වූ අතර එය පසුගිය වසරට වඩා 9% ක වැඩි වීමකි.

සළකා බලන ලද වර්ෂයේ සිව්වන කාර්තුවේදී සීඝ්‍රවර්ධනයක් දක්නට ලැබුණු අතර කෙසේවෙතත් කොවිඩ් 19 වසංගතයෙන් පැනනැගුණු බලපෑම් මෙම මූල්‍ය වර්ෂය පුරාම සිදුකරන ලද මෙහෙයුම්වලට අහිතකර බලපෑමක් ඇති කළේය.

මෙසේ ආදායම් ලැබීමට ප්‍රධාන හේතුව වූයේ ආහාර පාන අංශයේ මෙහෙයුම් වන අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව 25% කින් වර්ධනය විය. මෙයට හේතු වූයේ දේශීය අමුත්තන් වැඩි වශයෙන් හෝටලට පැමිණීමයි. කෙසේවෙතත් කාමර වෙන් කර ගැනීම අඩු වීම නිසා කාමර අංශයේ ආදායම 25% කින් අඩු වී රුපියල් මිලියන 237 ලෙස වාර්තා විය.

සලකා බලන ලද වසර තුළදී හෝටලය එහි ආහාර පාන අංශයේ මෙහෙයුම් ඉහළ නැංවීම සඳහා කොවිඩ් සීමාවන්ට අනුගත වෙමින් වඩාත් නම්‍යශීලී ව්‍යාපාරික ආදර්ශයක් අනුගමනය කරන ලදී. ආහාර පාන අංශයේ ව්‍යාපාරික කටයුතු වර්ධනය කිරීම සඳහා දරන ලද ප්‍රයත්නයන්හිදී මාර්ගගත මිල දී ගැනීමේ වේදිකාවන් හඳුන්වාදීම ධනාත්මක ආකාරයෙන් දායකත්වය සැලසුවේය. අප විසින් අලුතින් හඳුන්වාදුන් නිවසටම ආහාර සැපයීමේ පහසුකම මෙහිදී අවධානය යොමුකළ යුතු අතර වෙනත් ව්‍යාපාරික ආදර්ශ සංකල්පීයකරණය සහ ක්‍රියාවට නැංවීම මෙම වසර පුරාම පැවැති මෙහෙයුම් අභියෝගයන් ජයගැනීමට උපකාරී විණි.

රට වසා දැමීම සහ රට තුළ සහ ගෝලීය වශයෙන් සංචරණ සීමාවන් පැනවීම සමගින් වුවද කාමර පහසුකම් ලබාදීමේ අංශයේ සැලකියයුතු වෙළඳපළ අවස්ථාවන් සුරක්ෂිත කර ගැනීමට හෝටලය සමත්විණි. මෙම තත්වය ලගා කර ගත්තේ ක්‍රියාවට නංවන ලද නේවාසික පහසුකම් ලබාදීමේ

නවොත්පාදන වැඩසටහන් මගින් සහ නව පීව බුබුලු සංකල්පය යටතේ පැමිණි අන්තර්ජාතික සංචාරකයින් ආකර්ශණය කර ගැනීම මගිනි.

බහුවිධ අභියෝගයන් හමුවේ වුව ද සමාගම මෙම වසරේ මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 455 ලෙස පවත්වා ගනිමින් පසුගිය වසරේදී මෙහෙයුම් අලාභය වන රුපියල් මිලියන 456 මට්ටමේ රඳවා ගන්නා ලදී.

ප්‍රාග්ධන ආයෝජන වැඩිවීම සහ වෙළඳපොළ පොලී අනුපාතිකයන් වෙනස් වීම නිසා මෙම වසේරීදී මූල්‍ය වියදම් සාපේක්ෂ වශයෙන් වැඩි බව මෙහිදී පෙන්වාදිය යුතුවේ. කෙසේවෙතත් සමාගමේ ශේෂ පත්‍රය ශක්තිමත් ලෙස පවතින අතර මෙහි මුලු වත්කම් රුපියල් බිලියන 16.7 වන අතර සමස්ථ වගකීම් රුපියල් බිලියන 3.6 ක් වේ. මෙම තත්වය මගින් පශ්චාත් කොවිඩ් වෙළඳපොළ අවස්ථාවන් මගින් ප්‍රයෝජන අත්පත් කර ගැනීමට අපිට හැකියාව ඇති බවට සුභවාදීව සිතීමට මඟ පාදයි.

මෙම වසරේ ප්‍රධාන ජයග්‍රහණ

වසංගතය මගින් ඇති කරන ලද අභියෝගයන් මගින් ක්‍රියාකාරකම් අඩාල කිරීමට හේතුවුවත් සමාගම එමගින් සංකල්පීයකරණය කරනු ලැබූ සැලසුම් ක්‍රියාත්මක කරමින් එහි ශක්තිය පවත්වාගෙන යාමට කටයුතු කළේය. සමාගම කොන්ත්‍රාත්කරුවන් පත්කරමින් හෝටලයේ කාමර නවීකරණය කිරීම සඳහා කටයුතු කළ අතර චීන අවන්හල නැවත විවෘත කිරීමට කටයුතු කිරීමත් හෝටලයේ කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරමින් රාත්‍රී සමාජශාලා සහ ආපන ශාලා සංකල්ප හඳුන්වා දීමටත් කටයුතු කළේය. ඉහතින් සඳහන් කළ ව්‍යාපෘති සමාගමේ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ආයෝජන ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භ කරන ලදී. වසංගතය නිසා ඇති වූ අභියෝගයන්, රට වසා දැමීම සහ සංචරණ සීමා යනාදිය අවස්ථාවන් බවට පත්කරගනිමින් හෝටලය තවදුරටත් නවීකරණය කිරීමටත් එහි ප්‍රමිතින් නංවාලීමටත් එමගින් අනෙකුත් අන්තර්ජාතික හෝටල් සමග සම තත්වයට පැමිණීමටත් කටයුතු කරන ලදී.

පසුගිය වසර 33 පුරවටම නවීකරණය නොකිරීම නිසා ආදායම් අඩු වෙමින් පැවැති හෝටල් කාමර නවීකරණය කිරීම මගින් හෝටලය කාමර ලබාදීම මගින් ලබාගන්නා ආදායම් උපරිම මට්ටමට ගෙන ඒමට හේතු වනු ඇත.

මෙහිදී යොදාගත් ක්‍රමවේදය මගින් අමුත්තන්ට නව අත්දැකීමක් සපයනු ලබන අතර මෙමගින් පශ්චාත් කොවිඩ් කාල සීමාවේදී ආදායම් ජනිත කිරීම සඳහා වැදගත් දායකත්වයක් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එසේම අලුතින් හඳුන්වාදුන් මාර්ගගත ආකාරයට ඇණවුම් කිරීමේ ක්‍රමවේදයට මහත් ප්‍රතිචාර ලැබී ඇති අතර එමගින් මෙම අභියෝගාත්මක කාලසීමාවේදී ද අපගේ ආදායම් පවත්වාගෙන යාමට හැකියාව ලබා දී තිබේ.

හිල්ටන් ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද අන්තර්ජාතික මට්ටමේ පුහුණු හා අත්දැකීම් ලබා ගැනීමේ සැසි මෙම කාලයේ අපට අනුගමනය කිරීමට සිදු වූ දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ න්‍යායය පත්‍රයන් හමුවේ අපගේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට මහත් දායකත්වයක් ලබා දුන්නේය.

ඉදිරි සැලසුම්

අමුත්තන්ගේ කාමර නවීකරණය කිරීමේ කටයුතු 2023 වසරේ දෙවන කාර්තුවේදී නිම කිරීමටත් එමගින් නව සංචාරක කාලසීමාවේ දී ඇති වන තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීමට හැකිවනු ඇතැයි සමාගම අපේක්ෂා කරයි. ආහාර පාන ලබා ගැනීමේ නවීනතම පහසුකම් ඇතිව ජපන් අවන්හල නැවත හඳුන්වාදීම ද මධ්‍යම කාලීන සැලැස්මට අයත් වේ. ආහාර පාන ව්‍යාපාරයේ සීමාවන් තවදුරටත් පුලුල් කරමින් ශ්‍රී ලාංකීක ආහාර පාන සපයන "කරි ලීෆ්" අවන්හල වැඩිදියුණු කිරීමටත් සැලසුම් කර තිබේ.

ගුණාත්මකභාවය සහ ලාභ ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් දැනට වෙළඳපොළේ ඇති කරගෙන තිබෙන කීර්තිය මත හිල්ටන් ආයතනයට ඉදිරියේදී වඩාත් කැපී පෙනෙන අන්දමින් කටයුතු කිරීමට හැකියාව පවතින බව අපි අවබෝධ කරගෙන සිටිමු. ආයෝජන මත ප්‍රතිලාභ මංසළකුණු කොටගත් නව ආයෝජන නිසැකවම කාර්යසාධනය පදනම් කරගත් ඒවා වන අතර එමගින් කොටස් හිමියන්ට උපරිම ප්‍රතිලාභ අත්කරදෙනු ඇත. හිල්ටන් ක්‍රීඩා මධ්‍යස්ථානය ඉදිකිරීමේ දීර්ඝකාලීන සැලැස්ම ක්‍රියාත්මක කිරීමටද සමාගම බලාපොරොත්තු වේ. මේ සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යනය නිම කර ඇති අතර මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා සුදුසු ආයෝජකයකු හඳුනා ගැනීමේ අපේක්ෂාවෙන් සිටී.

විවිධාංගීකරණ සැලසුම මගින් හෝටලයේ දිගු කාලීන ක්‍රමෝපායාත්මක සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා පාර්ශවකරුවකු සොයා බැලීම කෙරෙහි අවධානය යොමුකර ඇත.

අගය කිරීම

ගෝලීය සහ දේශීය සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් මා විසින් සඳහන් කරන ලද අභියෝගයන් හමුවේ වුව ද අපගේ කොළඹ හිල්ටන් හෝටලයේ කුසලතා පූර්ණ කාර්යය මණ්ඩලය විසින් පෙන්නුම් කරන ලද අධිෂ්ඨානය හා ධෛර්ය පිළිබඳව මම අතිශයින් සාධම්බරයට පත්වෙමි.

මෙම අර්බුදකාරී කාලසීමාව මහත් ඵලදායී අවස්ථාවන් බවට පත්කර ගැනීම සඳහා කාලීන වශයෙන් වැදගත් ක්‍රමෝපායයන් ක්‍රියාවට නැංවීමට අවධානය යොමුකිරීම මගින් ඔවුන් කෙරෙහි විශ්වසය තැබිය හැකි බව නැවතත් ඔප්පු කර තිබේ. පශ්චාත් කොවිඩ් සමයෙන් පසුව එළැඹෙන නව ව්‍යාපාරික අවස්ථාවන්හි උච්චතම සමය සඳහා හෝටලය නවීකරණය කිරීමේ ප්‍රයත්නයන් වෙනුවෙන් ඔවුන් කැපවීමෙන් ක්‍රියාකරති.

මෙම අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙමින් අපට සහය ලබාදීමට ඔවුන් සිදු කළ කැපවීම වෙනුවෙන් අපගේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ටත් ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයටත් මෙම අවස්ථාවේදී මාගේ ස්තුතිය පුදකරමි.

එසේම මම කොළඹ හිල්ටන් හි සමාන්‍යාධිකාරිතුමාට සහ කාර්යය මණ්ඩලයට ඔවුන් විසින් දරන ලද අතිමහත් ප්‍රයත්නයන්, ඉවසීම සේවාලැදිභාවය සහ මෙහෙයුම් පවත්වාගෙන යාමට දක් වූ අධිෂ්ඨානශීලීභාවය සම්බන්ධයෙන් ස්තුතිය පුදකරමි. අවසාන වශයෙන් මෙම දුෂ්කර සමයේදී අපට අතිමහත් සහායක් සහ සහයෝගයක් ලබාදීම වෙනුවෙන් හිල්ටන් සමාගමේ කළමණාකාරිත්වයට මාගේ ස්තුතිය පුදකරමි.

ගෝලීය ආර්ථිකය කාලයත් සමගින් යථා තත්වයට පත් වනු ඇතැයි ද ශ්‍රී ලංකාව මෙම කර්මාන්තයේ තම හැකියාවන් සාක්ෂාත් කරගනු ඇතැයිද මම විශ්වාස කරමි. මෙම ගමනේ දී තමන්ගේ කළාපීය ව්‍යාපාරික ක්‍රමෝපායයන් මගින් විදේශ විනිමය ලංකාවට ගෙන ඒමට හිල්ටන් ආයතනය නිසැකවම කටයුතු කරන අතර ඉදිරි වර්ෂයේදී වඩාත් හොඳින් තම මෙහෙයුම් කටයුතු සිදු කිරීමට හිල්ටන් ආයතනයට හැකි වනු ඇත.



P.A.I. සිරිනිමල් පෙරේරා
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලය

P.A.I. සිරිනිමල් පෙරේරා මහතා

සභාපති

සිරිනිමල් පෙරේරා මහතා නාගරික සංවර්ධන සහ නිවාස, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. 2007 සිට මේ දක්වා නොරිටාකේ ලංකා පෝසිලේන් (පුද්ගලික) සමාගමේ (නොරිටාකේ) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විධායක උපදේශකවරයෙකු ලෙස කටයුතු කරන අතර, කටුනායක කර්මාන්ත කලාපයේ පිහිටි රෙදි ලේබල් විවීම, ඇසුරුම් පෙට්ටි සහ ඇඟලුම් නිෂ්පාදනයේ නියුතු සමාගමක් වන ෂෝර් ටු ෂෝර් (පුද්) සමාගමේ සභාපතිවරයා ද වෙයි. පෙරේරා මහතාට මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, අභ්‍යන්තර විගණනය, සහ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ වසර 30කට වැඩි විධායක පළපුරුද්දක් ඇත. ඔහු එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරීවරුන් වන ආර්.කේ. ෆ්‍රයර් සහ සමාගමේ ජ්‍යෙෂ්ඨ විගණක නිලධාරියෙකු ලෙසද සේවය කර ඇත.

පෙරේරා මහතා නාගරික සංවර්ධන අධිකාරියේ සහ එහි අනුබද්ධිත සමාගම් වන ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජිස් සමාගම, ඔනාලි සමාගම, යුනිඩෙප් සමාගම, සීමාසහිත වෝටර්ස් එජ් සමාගම සහ සීමාසහිත ලංකා සෝල්ට් සමාගම යන ආයතනයන්හි සභාපති වරයා ලෙසද, ශ්‍රී ලංකා ධීවර සංස්ථාවේ කළමනාකර අධ්‍යක්ෂ වරයා ලෙසද සේවය කර ඇත. ඔහු පීපල්ස් ලීසිං සමාගම, සීමාසහිත ඕෂන් වීව් සමාගම, සීමාසහිත ලංකා සෙරමික් සමාගම ඇතුළු ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සේවය කර ඇත. තවද ඔහු 2018 දී කෙටි කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති තනතුරුද දරා ඇත.

සිරිනිමල් පෙරේරා මහතා එක්සත් රාජධානියේ වරලත් සහ සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අවසන් අදියරයන් සම්පූර්ණ කර ඇති අතර, ලූටන් උසස් තාක්ෂණ විද්‍යාලයේදී ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර ඇත.

විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගුණාත්මකභාවය සහ ඵලදායිතා සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකා සංගමය විසින් පෙරේරා මහතාට 'හොඳම ප්‍රධාන විධායකයා' යන සම්මානය පිරිනමන ලදී.

I.P. දන්තනාරායන මහතා

අධ්‍යක්ෂ (12.07.2022 වන තෙක්)

ඉෂාන් දන්තනාරායන මහතාට ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමෙන් වසර 30ක මානව සම්පත් හා ව්‍යාපාර කළමනාකරණ අත්දැකීම් ඇත. ඔහු මේ වනවිට බ්‍රැන්ඩික්ස් සමූහයේ මානව අංශයේ ප්‍රධානි වන අතර එසේම බ්‍රැන්ඩික්ස් සමූහයේ ශ්‍රී ලංකාවේ මෙන්ම ගෝලීය වශයෙන්ද සිදුකෙරෙන මෙහෙයුම් අධීක්ෂණය කරනු ආයතනීය නායකත්ව කණ්ඩායමේ සාමාජිකයෙකුද වේ. ඊට අතිරේකව බ්‍රැන්ඩික්ස් විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේද ඔහු කටයුතු කරයි. බ්‍රැන්ඩික්ස් යනු ශ්‍රී ලංකාවේ විශාලතම අපනයනකරු මෙන්ම විශාලතම සේවා යෝජකයාද වන අතර එම සමාගම ජනාධිපති සම්මානයෙන්ද පුද ලැබීය. ඔහු ශ්‍රී ලංකාවේ මානව සම්පත් වෘත්තිකයින්ගේ සංගමයේ සභාපති වරයාද වන්නේය.

ආචාර්ය උපාධියක් (PhD) සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියක්ද (MBA) හිමිකර ගෙන ඇති ඔහු එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරු සහතිකය (FCIM - UK) ලබා ගෙන ඇත. මානව සම්පත් කළමනාකරණය සහ අලෙවිකරණය සම්බන්ධයෙන් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගෙන ඇති ඔහු මූල්‍ය කටයුතු සම්බන්ධයෙන්ද (CIMA - UK) අර්ධ සුදුසුකම් ලබා ගෙන ඇත. මීට අමතරව ඔහු ලොව හොඳම විශ්වවිද්‍යාල 26කින් සමන්විත ගෝලීය U21 වෙතින් ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධියට සමාන විධායක නායකත්ව සහතිකය ලබා ගෙන ඇත.

D.S. අමරසේකර මෙනෙවිය

අධ්‍යක්ෂිකා

ධීශානා අමරසේකර මහත්මිය ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. හි ඇමරිකානු විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් (ජාත්‍යන්තර අලෙවිකරණය පිළිබඳ විශේෂ සුදුසුකම් සහිත) සහ ඇමරිකා එක්සත් ජනපදයේ හවායි විශ්වවිද්‍යාලයෙන් සංචාරක කර්මාන්ත කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් (හෝටල් කළමනාකරණය පිළිබඳ විශේෂ සුදුසුකම් සහිත) ලබාගෙන ඇත. ඇය හෝටල් ක්ෂේත්‍රයේ වෘත්තිකයෙකි.

ඇය ශ්‍රී ලංකාවේ මහනුවර පිහිටි සම්මානලාභී බුටික් හෝටලයක් වන තේවා රෙසිඩන්සි සහ සම්මානලාභී අවන්හලක් වන තේවා කුසීන් හි කළමනාකාර අධ්‍යක්ෂවරියයි. තේවා රෙසිඩන්සි සහ තේවා කුසීන් අබණ්ඩව වසර 11ක් පුරා විවිධ ජාත්‍යන්තර සම්මාන දිනා ගැනීමට සමත් විය. 2020 වසරේදී දකුණු ආසියානු සංචාරක සම්මාන උළෙලේදී දිනාගත් සම්මාන අතර 'දකුණු ආසියාවේ ප්‍රමුඛතම බුටික් හෝටලය' ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රේමාන්විත හෝටලය' යන සම්මානත්, 'මධුසමය ගතකිරීම සඳහා ආසියාවේ හොඳම හෝටල සහ ආසියාවේ හොඳම කුඩා හෝටල සඳහා වන හොටේ ග්‍රැන්ඩායූ' සම්මානත් ලබා ගන්නා ලදී. තේවා රෙසිඩන්සි හෝටලය අබණ්ඩව දසවන වරටත් 'ට්‍රිප් ඇඩ්වයිසර් විශිෂ්ටතා සේවා සම්මානය' දිනා ගන්නා ලදී.

V. කනගසබාපති මහතා

අධ්‍යක්ෂ

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර අංශයේ විශ්‍රාම ලත් අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වන කනගසබාපති මහතා දැනට යාපනය විශ්වවිද්‍යාල කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙසද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ රාජ්‍ය අංශය වන රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සභාපති වරයා ලෙසද, රාජ්‍ය ගිණුම් ප්‍රමිතිකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස සහ, දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ රාජ්‍ය හා රාජ්‍ය අංශ ව්‍යවසාය කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි. රාජ්‍ය අංශයේ වසර 40කට වැඩි සේවා පළපුරුද්දක් ඇති ඔහු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධීකාරකවරයා ලෙස කටයුතු කළේය. විශ්‍රාම ගැනීමෙන් පසු වසර 5 ක් පුරාවට මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ උපදේශකයකු ලෙස කටයුතු කර ඇත.

ඔහු හාවඩ් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන ඇති අතර, ලන්ඩනයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරයෙකි. ඔහු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.

P.H.P. දෙනියාය මහතා

අධ්‍යක්ෂ

ප්‍රියන්ත දෙනියාය මහතා 2000 වසරේ සිට මේ දක්වා කොළඹ මහාධිකරණයේ අපරාධ නීතිය පිළිබඳ විශේෂ ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකු ලෙස සේවය කරයි. ඔහු මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණයන්හි පෙනී සිටී. එමෙන්ම, පෙත්සම්කරුවන් සහ වගඋත්තරකරුවන් යන දෙපාර්ශ්වයම නියෝජනය කරමින් සුවිශේෂී මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු කිහිපයකදීම සාර්ථක ලෙස පෙනී සිටීමින් අදළ නීතිමය සහනයන් ලබාදීමට ඔහු සමත් විය.

දෙනියාය මහතා 2016 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකා තිරසර බලශක්ති අධිකාරියේ නීති උපදේශක වරයා ලෙස කටයුතු කළ අතර, ශ්‍රී ලංකාවේ හරිත බලශක්ති අංශය ප්‍රවර්ධනය කිරීමට අදළව දැනට පවතින පනත සංශෝධනය කිරීමේ අරමුණෙන් නීති කෙටුම්පත්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා සංශෝධිත පනතක් කෙටුම්පත් කිරීමේ වගකීම ඔහුට පවරන ලදී.

M.T.I.V. අමරසේකර මහත්මිය

අධ්‍යක්ෂිකා (24.03.2022 වන තෙක්)

අමරසේකර මහත්මිය රජයේ භාණ්ඩාගාරයේ සහ මහා භාණ්ඩාගාරය යටතේ පවතින විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරියක ලෙස වසර 15කට වැඩි පළපුරුද්දක් ඇත.

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය නියෝජනය කරමින් ඇයව ලංකා බැංකුවේ විධායක නොවන අධ්‍යක්ෂවරියක ලෙස 2020 ජනවාරි 11 වන දින පත්කරන ලදී.

ඇය ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සහ මහජන බැංකුව වැනි ප්‍රධාන රජයේ ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩලයන්හි රාජ්‍ය භාණ්ඩාගාරය නියෝජනය කරන ලදී.

අමරසේකර මහත්මිය එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් ලබාගෙන ඇති අතර, ඇමරිකා එක්සත් ජනපදයේ වැන්ඩර්බිල්ට් විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමිකරගෙන ඇත. ඇය එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ අයතනයේ (CIMA) සාමාජිකාවක වන අතර, වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරියකි.

P.A.S.A. කුමාර මහතා

අධ්‍යක්ෂ

අතුල කුමාර මහතා 1991 දී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස රාජ්‍ය සේවයට බැඳී ඇති අතර, 2007 වසරේදී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට එක්විය. වර්තමානයේදී ඔහු රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, සීමාසහිත මාන්තායි ලුණු සමාගම, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, සීමාසහිත ලංකා ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස්, සීමාසහිත ලංකා හයිඩ්‍රොලික් සමාගම, ලංකා පිඟන් සංස්ථාව ඇතුළු ව්‍යවස්ථාපිත ආයතන ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සේවය කර ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණ (රාජ්‍ය පරිපාලන විශේෂ) විද්‍යාපති උපාධියක් ලබාගෙන ඇති අතර 2015 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හිමිකර ගත්තේය. අතුල කුමාර මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ වරලත් රාජ්‍ය ගණකාධිකාරීවරයෙකි.

L.R.S. වීරසිංහ මහතා

අධ්‍යක්ෂ

ලාල් වීරසිංහ මහතා 2010 සිට 2013 වසර දක්වා 'සමාජ ආරක්ෂණ මණ්ඩලයේ' අධ්‍යක්ෂකවරයෙකු ලෙස සේවය කරන ලදී. ඔහු 2010 වසරේදී 'මාර්ග සංවර්ධන අධිකාරියේ' මාධ්‍ය ලේකම්වරයෙකු ලෙසද කටයුතු කළේය.

ලාල් වීරසිංහ මහතා 2017 වසරේ සිට සිංගප්පූරුවේ රයිවේ ඉන්ටර්නැෂනල් ආයතනයේ ව්‍යාපාරික නායකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු මැලේසියාවේ රයිවේ ඩයිනමික් නායකත්ව සංවර්ධන සහ ඉලක්ක සපුරා ගැනීමේ වැඩසටහන මගින් පවත්වන ලද ව්‍යාපාර නායකත්ව පුහුණු වැඩසටහන සාර්ථකව නිම කළේය.

ලාල් වීරසිංහ මහතා 'සරසවි' චිත්‍රපට සම්මාන දෙකක් (හොඳම නළුවා සහ ජනප්‍රියම නවක නළුවා) දිනා ඇත. සිනමා කර්මාන්තය තුළ ඔහුගේ සාර්ථකත්වය නිසාම තමාගේම චිත්‍රපට නිෂ්පාදන සමාගමක් වන එල්. ඩබ්ලිව්. චිත්‍රපට සමාගම ආරම්භ කර ශ්‍රී ලංකාවේ චිත්‍රපට නිෂ්පාදනයට සහ අධ්‍යක්ෂණයට පිවිසියේය.

ආචාර්ය M.K.C. සේනානායක

අධ්‍යක්ෂ

ආචාර්ය සේනානායක මහතා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරයි.ඔහු එම දෙපාර්තමේන්තුවේම අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන) සහ සහකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙස සේවය කිරීමට පෙර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙසද සේවය කර ඇත.

ඔහු ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් දරයි. ජපානයේ හිටොට්සුබාෂි විශ්ව විද්‍යාල උපාධි පාසලෙන් ව්‍යාපාර උපායමාර්ගය, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපතියෙකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජ (විශේෂ) 2 වන පෙළ (ඉහළ) උපාධියක් සහ කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය උසස් ඩිප්ලෝමාවක් සහිතය.

සමාගම් පාලනය

හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය සමාගමේ යහපාලන කටයුතු සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ වැදගත්කමක් ලබාදෙන අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ සංවිධානය විසින් සමාගම් පාලනය සම්බන්ධයෙන් නිකුත් කර තිබෙන ආචාරධර්ම පද්ධතිය සහ රජය විසින් හිමිකාරිත්වය දරණ ව්‍යාවසායයන් සඳහා මහා භාණ්ඩාගාරයේ මහජන ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර තිබෙන සහ 2021 නොවැම්බර් මස 16 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ සමාගම් පාලන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කිරීමට කැපවීමෙන් ක්‍රියාකරනු ලබයි.

අධ්‍යක්ෂක මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ඉහළම ව්‍යුහය වශයෙන් ක්‍රියා කරමින් හා නායකත්වය ගනිමින් ව්‍යාපාරික උපායමාර්ගික අරමුණු සැකසීම, සාරධර්ම සහ ප්‍රමිතීන් සහ ක්‍රියාකාරිත්වය ඇගයීමට කටයුතු කරන අතර කොටස්හිමිකරුවන් කෙරෙහි පවත්නා බැඳීම් සහ වගකීම් නිසි පරිදි ඉටුකරන බවට සහතික වන පරිදි සමාගම ඉහළ මට්ටමේ යහපාලනයන් සහ විනිවිදභාවයක් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා වගකීම් දරණු ලබයි.

අධ්‍යක්ෂක මණ්ඩලයේ සංයුතිය

සළකා බලන වර්ෂයේදී අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත වූ අතර සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපාරයන්ට අදාළ කුසලතා සහ අත්දැකීම්වලින් යුත් විධායක බලතල නොමැති පහතින් දැක්වෙන අයගෙන් යුක්ත විය.

P.A.I. සිරිනිමල් පෙරේරා මහතා	ස්වාධීන විධායක නොවන
D.S. අමරසේකර මිය	ස්වාධීන විධායක නොවන
I.P. දන්තනාරායන මහතා	ස්වාධීන විධායක නොවන
V. කනගසභාපති මහතා	ස්වාධීන විධායක නොවන
P.H.P. දෙනියාය මහතා	ස්වාධීන විධායක නොවන
L.R.S. වීරසිංහ මහතා	ස්වාධීන විධායක නොවන
M.T.I.V. අමරසේකර මහත්මිය	ස්වාධීන නොවන විධායක නොවන
P.A.S.A. කුමාර මහතා	ස්වාධීන නොවන විධායන නොවන

අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් පත් කිරීම

සමාගම් පනතේ විධිවිධානවලට අනුව භාණ්ඩාගාරයේ ලේකම්වරයාට කොටස් වලින් වැඩි බහුතරයක් හිමිවේ. අධ්‍යක්ෂක මණ්ඩලයට බහුතර සාමාජිකයින් පිරිසක් නම් කිරීමේ සහ පත් කිරීමේ අයිතිය භාණ්ඩාගාර ලේකම්වරයාට තිබේ.

භාණ්ඩාගාරයේ ලේකම්වරයාට තිබෙන අයිතිවාසිකම්වලට අනුව එසේ පත් කළ ඕනෑම පුද්ගලයකු ඉවත් කිරීමටත්, එසේ ඉවත් කරන ලද පුද්ගලයා වෙනුවට වෙනත් පුද්ගලයකු පත් කිරීමටත්, අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්කරනු ලැබූ පුද්ගලයෙකු කිසියම් හෝ හේතුවක් මත එම ධුරය දැරීම අවසන් වූ පසු ඒ වෙනුවට පුද්ගලයකු පත් කිරීමටත් හැකිවේ. භාණ්ඩාගාර ලෙකම්වරයා විසින් එසේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂකවරයකු චක්‍රීයව විශ්‍රාම ගැනීමට යටත් නොවේ.

වයස අවුරුදු 70 වැඩි අධ්‍යක්ෂකවරුන් 2007 අංක 7 දරණ සමාගම් ආඥාපනතේ දක්වෙන විධිවිධාන 210 සහ 211 ට අනුව වයස අවුරුදු 70 සම්පූර්ණ කිරීමෙන් පසුව ඊලඟ වාර්ෂික මහා සභා රැස්වීම තෙක් එම ධුරය දැරීම හෝ එවැනි රැස්වීමකදී 211 වන වගන්තියට අනුව එම වයස පිළිබඳව විශේෂයෙන් සඳහන් කරමින් නැවත පත් කරනු ලැබූ අවස්ථාවක හැරුණු විට සමාගම් පනතේ 210 වගන්තියට අනුව වයස අයුරුදු 70 සීමාව පසුකළ විට නැවත අධ්‍යක්ෂක ධුරයකට අයදුම් නොකළ යුතුයි.

එම විධිවිධානවලට අනුකූලව වයස අවුරුදු 70 ට වැඩි සභාපති P.A.I. සිරිනිමල් පෙරේරා මහතා සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික V. කනගසභාපති මහතා නැවත පත් කරගන්නා ලදී.

සලකා බලන ලද වර්ෂය තුළදී සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වෙනත් වෙනස්කම් සිදු වී නොමැත.

කෙසේ වෙතත් වාර්තා කළ දිනයේ සිට මෙම වාර්තාව ප්‍රකාශයට පත්වන දිනය වන විට අධ්‍යක්ෂක මණ්ඩලයේ පහත දැක්වෙන වෙනස්කම් සිදු වී ඇත.

(1) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් 2022 මාර්තු 24 වන දින සිට බල පැවැත්වෙන පරිදි ආචාර්ය M.K.C. සේනානායක මහතා අධ්‍යක්ෂකවරයකු වශයෙන් පත් කරන ලදී.

(2) M.T.I.V. අමරසේකර මහත්මිය 2022 මාර්තු 24 වැනි දින අධ්‍යක්ෂකවරයකු වශයෙන් කටයුතු කිරීම අවසන් කරන ලදී.

(3) I.P. දන්තනාරායන මහතා 2022 ජූලි 12 වැනි දින ඉල්ලා අස්විණි.

අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්

සමාගම අත්පත් කරගත් ප්‍රතිඵල පිළිබඳව අයවැය හා සසඳමින් සැලකිල්ලට යොමු කිරීම හා අධීක්ෂණය කිරීම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් න්‍යායය පත්‍රයට අනුව සිදු කරන අතර අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානයට යොමුවිය යුතු අනෙකුත් කරුණු ද සාකච්ඡා කරන ලදී. අධ්‍යක්ෂක මණ්ඩලය වසරකට හය වතාවක් රැස්වුණු අතර අවශ්‍ය අස්ථාවන්හි දී විශේෂ රැස්වීම් පවත්වන ලදී.

2021 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වසර තුළ දී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් අටක් (8) ක් පවත්වන ලදී. මෙම රැස්වීම්වලට සහභාගී වීමේ විස්තර පහතින් දැක්වේ.

අධ්‍යක්ෂකවරයාගේ නම	අධ්‍යක්ෂකවරයකු වශයෙන් පත්වූ දිනය	2021වසරේ පවත්න ලද රැස්වීම් සංඛ්‍යාව
P.A.I. සිරිනිමල් පෙරේරා මහතා	24/01/2020	8
D. S. අමරසේකර මහත්මිය	07/04/2015	7
I. P. දන්තනාරායන මහතා (2022.07.12 ඉල්ලා අස්විණි)	24/01/2020	7
V. කනගසභාපති මහතා	24/01/2020	8
P.H.P. දෙනියාය මහතා	24/01/2020	7
P.A.S.A. කුමාර මහතා	24/08/2020	8
M.T.I.V. අමරසේකර මහත්මිය (2022.03.24 සේවය අවසන් කරන ලදී)	03/07/2020	7
L.R.S. වීරසිංහ මහතා	28/02/2020	8

අධ්‍යක්ෂකවරුන්ට මාසික ගිණුම් වාර්තා සහ ව්‍යවස්ථාපිත අනුකූල ප්‍රකාශන ලබාදෙන අතර අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී වැදගත් සියලුම කරුණු සාකච්ඡා කර ඒවා පිළිබඳ තීරණ ගනු ලබයි.

එසේම අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වන විශේෂ කරුණු පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා සකස් කර කල්වේලා ඇතිව ඉදිරිපත් කරනු ලබයි. අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පිළිබඳ වාර්තා සමාගම් ලේකම් විසින් නිසි පරිදි පවත්වාගෙන යනු ලබයි.

සභාපතිතුමා

අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපතිතුමා P.A.I සිරිනිමල් පෙරේරා මහතාය. ඔහුට මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, අභ්‍යන්තර විගණනය සහ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳව සහ පුද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ සමාගම් රැසක අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් කටයුතු කිරීමේ වසර 30 කට වැඩි පළපුරුද්දක් තිබේ. ඔහු අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී මාර්ගෝපදේශකත්වය ලබාදෙන අතර සමාගමේ ක්‍රියාකාරකම් වෙනුවෙන් සියලුම අධ්‍යක්ෂකවරුන්ගේ හැකියා දායකත්වයන් ලබාගැනීම සහතික කිරීමට ක්‍රියාකරනු ලබයි.

කළමනාකාරිත්වය

සමාගමේ එදිනෙදා ක්‍රියාකාරකම් පිළිබඳ වගකීම සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට පැවරෙන අතර මෙහි නායකත්වය දරන්නේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියාය. අවදානම් සහ අවස්ථාවන් හඳුනාගැනීමටත් තීරණය කරන ලද අයවැය සහ කාලසීමාවන් ඇතුළත අදාළ ඉලක්ක ලඟාකරගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ඔවුන් විසින් සහතික කරනු ලබයි.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය

සමාගමේ වත්කම් සහ කොටස් හිමියන්ගේ ආයෝජන සුරක්ෂිත කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය මගින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග හඳුන්වාදී තිබේ. අභ්‍යන්තර පාලන උපක්‍රමයන්හි ආවේණික සීමාකම් පවතින බවත් ඒවා මගින් වැරදි සහ වංචාවන් සම්බන්ධයෙන් පරම ආරක්ෂාවක් සැපයිය නොහැකි බවටත් අධ්‍යක්ෂක මණ්ඩලය අවබෝධ කරගෙන සිටියි.

අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත අයවැය ලේඛන අනුව සසඳමින් සමාගමේ ක්‍රියාකාරිත්වයන් සහ මාසික ගිණුම් නිතිපතා සමාලෝචනය කරනු ලබයි.

විගණන කමිටුව

විගණන කමිටුවේ වාර්තාව පිටු අංක 20 සහ 21 හි දක්වා ඇත.

විගණන කමිටුවේ සාමාජිකයින් පහතින් දක්වා ඇත.

V. කනගසභාපති මහතා	සභාපති (ස්වාධීන විධායක නොවන)
P.A.S.A. කුමාර මහතා	සාමාජික (ස්වාධීන නොවන විධායක නොවන)
P.H.P. දෙනියාය මහතා	සාමාජික (ස්වාධීන විධායක නොවන)

සෙලෙන්දිවා ආයෝජන සමාගම සහ සමාගම අතර අත්සන් කරන ලද ගිවිසුමට අනුකූලව සීමසහිත සෙලෙන්දිවා ආයෝජන සමාගම විසින් සකස් කරන ලද හෝටල් මෙහෙයුම් පිළිබඳ අභ්‍යන්තර පාලන වාර්තාව විගණන කමිටුව විසින් පරීක්ෂාවට ලක්කර විශ්ලේෂණය කරන ලද අතර අභ්‍යන්තර පාලන කටයුතු පවත්වාගෙන යාම සහ විගණන කමිටුට වාර්තා කිරීමේ පිළිබඳව සමාගම වගකීම දරනු ලබයි.

විගණන කමිටුව මෙවැනි වාර්තාවන් පදනම් කරගෙන අවශ්‍ය/ සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳව සහ සමාගමේ/හෝටලයේ අභ්‍යන්තර පාලන පද්ධතිවලට සිදුකිරීමට අවශ්‍ය වැඩිදියුණු කිරීම් අධ්‍යක්ෂක මණ්ඩලයට නිර්දේශ කරනු ලබයි.

වැටුප් කමිටුව

2020 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන වැටුප් කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

අධ්‍යක්ෂකවරුන්ගේ නම් :

P.A.I. සිරිනිමල් පෙරේරා මහතා	සභාපති (ස්වාධීන විධායක නොවන)
V. කනගසබාපති මහතා	සාමාජික (ස්වාධීන විධායක නොවන)
I.P. දන්තනාරායන මහතා	සාමාජික (ස්වාධීන විධායක නොවන (2022.07.12 දින සිට ඉල්ලා අස්විය)

වැටුප් කමිටුව වැටුප් සම්බන්ධ නිර්දේශ අධ්‍යක්ෂක මණ්ඩලයට ලබා දේ.

සමාගම් ලේකම්වරුන්

අධ්‍යක්ෂක මණ්ඩලය සහ එහි කමිටු මගින් ඉතාමත් නිවැරදි පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සමාගම් පනතට අදාළ කරුණු සම්බන්ධයෙන් සමාගම් ලේකම්වරුන් විසින් අධ්‍යක්ෂක මණ්ඩලයට උපදෙස් සපයනු ලබයි.

සමාගම් පණත යටතේ සුදුසුකම් ලබා ඇති P W කෝපරේට් සෙකට්‍රේරියට් පුද්ගලික සමාගම සමාගම් ලේකම්වරුන් වශයෙන් දැනට කටයුතු කරනු ලබයි.

නීතිමය අවශ්‍යතාවන්ට අනුකූල වීම

සමාගමේ මූල්‍ය සහ කළමනාකරණ තොරතුරුවලට පිවිසීමට සියලුම අධ්‍යක්ෂකවරුන්ට හැකියාව තිබේ. සමාගම නීති සහ රෙගුලාසිලට අනුව කටයුතු කිරීමත් සමාගමේ කටයුතු සම්බන්ධයෙන් ඉතා වගකීමෙන් කටයුතු කරන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂකවරුන් සියලුම ප්‍රයත්නයන් දරති. මෙයට අමතරව අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියාකිරීම සහතික කිරීම සඳහා පරීක්ෂා කිරීම් සහ පාලන ක්‍රම හඳුන්වා දී තිබේ.

මූල්‍ය ප්‍රකාශයන් සහ විනිවිදභාවය

මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකාවේ ගිණුම් ප්‍රමිතීන්ට සහ සමාගම් පනතට අනුකූලව සකස් කර තිබේ.

ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තිය මගින් දක්වෙන පරිදි ව්‍යවස්ථාවට සිදු කරන ලද 19 සහ 20 වැනි සංශෝධනයන්ට අනුව සමාගමේ විගණන නිලධාරියා වන්නේ විගණකාධිපතිවරයාය.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම සඳහා විගණකවරුන්ට කළමනාකාරිත්වයෙන් සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ මැදිහත්වීමකින් තොරව ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව සලසා දී තිබේ. විගණකවරුන්ගේ පරීක්ෂාව සඳහා අවශ්‍ය සියලුම තොරතුරු ඔවුන්ට ලබාදීමට කටයුතු කර තිබේ.

ආචාරධර්ම ප්‍රමිතීන්

සමාගමේ සිය රාජකාරී සිදු කිරීමේදී සහ සමාගම වෙනුවෙන් ගනුදෙනු කිරීමේ දී එහි සියලුම සේවකයින් ඉහළම මට්ටමේ සුපිළිපන්භාවයෙන් යුතුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

සවිබලගැන්වුනු සහ පුහුණුවීම්වලට කැපවීමක් දක්වන සේවකයින් කණ්ඩායමක් ඇති කර ගැනීම සඳහා සමාගම පුහුණු සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. මෙම පිරිස සමාගමේ දැක්ම මෙහෙයුම අරමුණු සහ සාරධර්ම ලඟාකරගැනීම සඳහා ඉදිරියට ගෙන යනු ඇත.

සමාගම් පාලනය

ව්‍යාවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සියලුම ගෙවීම් සිදුකර ඇති අතර අවශ්‍ය අස්ථාවන්හිදී ප්‍රතිපාදනය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 16 සේවක ප්‍රතිලාභ (2006 දී සංශෝධනය කරන ලද) අනුව විශ්‍රාම පාරිතෝෂික වෙන් කර තිබේ.

වගකීම් සහ හෙළිදරව් කිරීම්

2021 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මාසික මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කරන බවට සැහීමට පත්වීම් සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඒවා සවිස්තරාත්මකව සමාලෝචනය කරන ලදී. රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පවතින ආයතන සඳහා වූ සමාගම් පාලනය සඳහා වූ යහභාවිතාවන් සහ සමාගම් පාලනය සඳහා වූ මාර්ගෝපදේශ මගින් මෙම භාවිතාවන් තවදුරටත් ශක්තිමත් කර තිබේ.

ස්වාධීන උපදෙස් ලබාගැනීම

අධ්‍යක්ෂක මණ්ඩලය තම රාජකාරී ඉටු කිරීමේදී අවශ්‍ය අවස්ථාවන්හි දී සමාගමේ වියදමෙන් ස්වාධීන වෘත්තීයමය උපදෙස් බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගනියි.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි
සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගම

P W කොපරේට් සෙක්‍රටේරියට් පුද්ගලික සමාගම
අධ්‍යක්ෂ ලේකම්වරුන්

2022 සැප්තැම්බර් 07

අවදානම් කළමනාකරණය

විවිධ අභියෝග හමුවේ විවිධාංගීකරණය වන වෙළඳපොළවල් ආකර්ෂණය කර ගැනීමේ ඉල්ලුමට සම්පාතවෙමින් ඉහළ තරගකාරිත්වයක් ඇති කර්මාන්තයක පෙරමුණ ගෙන සිටින අප සමාගම, පාර්ශ්වකරුවන් සඳහා දිගුකාලීන වටිනාකම් ලබාදීමේදී අවදානම් කළමනාකරණය සමාගමේ ඒකාබද්ධ ක්‍රියාවලියක් සේ සලකනු ලබයි. වෙනස්වීම අහම්බයකට වඩා සම්මතයක් බවට පත්ව ඇති වර්තමාන ව්‍යාපාරික පරිසරය තුළ, ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සහ අනුකූල වීම සමග උපායමාර්ගික සැලසුම් සමතුලිත කිරීමේදී හෝටලය විසින් ඉටුකරනු ලබන තීරණාත්මක කාර්යභාරයේ වැදගත්කම නිරන්තරයෙන් හඳුනාගෙන ඇත. දැනුවත්ව තීරණ ගැනීමට සහ අවස්ථාවන් සහ ඒවායේ ආවේණික අවදානම් පිළිබඳව සවිඥඤකව ඇගයීමට එමගින් අවස්ථාව සැලසෙන අතර, එමගින් තම ප්‍රධාන වත්කම් නිසිපරිදි ආරක්ෂාකර ගැනීමට හෝ වැඩි දියුණු කර ගැනීමට හෝටලයට හැකියාව ලැබේ.

අපගේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාගම තුළ ඇති අවදානම් වර්ග නිරාවරණය කර හඳුනා ගැනීම, ඒවායින් සිදුවියහැකි අවදානම් මට්ටම් මැනීම සහ එම අවදානම් අවම කර ගැනීම සහ පාලනය කර ගැනීම සඳහා උපායමාර්ග සම්පාදනය කිරීම කෙරෙහි යොමුවී ඇත.අවදානම් කළමනාකරණය අපගේ ආයතනික පාලන ව්‍යුහයේ සහ උපායමාර්ගික සංවර්ධන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර, එහි ප්‍රාමාණික බව සහ පිළිපැදීමේ හැකියාව සහතික කිරීම සඳහා වරින් වර සිදුකෙරෙන සමාලෝචන සහිතව, හෝටලයේ සියලුම මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි සුදුසු පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සාර්ථකව සහ උපායමාර්ගිකව ව්‍යුහගතකර ඇත.

අපගේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වන ගතිකත්වයන් නිරන්තරයෙන් පිළිබිඹු කරන අතර, යෙදියහැකි සෑම විටම අපගේ ප්‍රතිපත්ති සහ කාර්යරාමු ජාත්‍යන්තර යහ භාවිතයන්ට අනුකූලව සකස් කර ඇත.

සම්මතකර ඇති අවදානම් කළමනාකරණ කාර්යරාමුව සඳහා අධීක්ෂණය සහ අවසාන වගකීම කළමනාකාරිත්වය විසින් දරනු ලැබේ. මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමස්තයක් ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීම අවදානම් කළමනාකරණ කණ්ඩායම් සතු විය යුතුය.

අවදානම් කළමනාකරණ කාර්යරාමුව

අවදානම් කළමනාකරණ කණ්ඩායම මෙහෙයවනු ලබන්නේ හෝටලයේ සාමාන්‍යාධිකාරීවරයා විසිනි. මනාව සකස්කරන ලද අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් තුළ එහි ව්‍යවස්ථාපිත, විශ්වසනීය සහ නියාමන වගකීම් සම්බන්ධයෙන් හිල්ටන් ලෝක ව්‍යාප්ත ප්‍රධාන ප්‍රාදේශීය කාර්යාලය සමග සාකච්ඡා කරමින් අවදානම් අවමකිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ සහ මණ්ඩලයට වාර්තා කිරීමේ වගකීම ඔහු වෙත පවරා ඇත. සාමාන්‍යාධිකාරීවරයා සමග හෝටලයේ ක්‍රියාකාරී ප්‍රධානීන්ගෙන් අවදානම් කළමනාකරණ කණ්ඩායම සෑදී ඇත. බුද්ධිමය රැස්වීම්, ගුණාත්මක විගණන, ආරක්ෂිත විගණන, අභ්‍යන්තර විගණන සහ පාරිභෝගික ප්‍රතිචාර සහ සිද්ධීන් වැනි අනෙකුත් කරුණු ඇතුළත් ක්‍රමානුකූල ක්‍රියාවලියක් මගින් සියලුම බාහිර සහ අභ්‍යන්තර අවදානම් හඳුනාගැනීම් සහතික කරයි. මෙලෙස හඳුනාගත් අවදානම් ව්‍යාපාරය කෙරෙහි ඇතිකෙරෙන බලපෑම, සිදුවීමේ සම්භාවිතාව සහ බලපෑමේ ප්‍රවේගය අනුව තක්සේරු කරනු ලැබේ. ප්‍රධාන අවදානම් නිරාවරණයන්ට ප්‍රමුඛතාව ලබාදීම සඳහා මෙම අවදානම් ඒවායේ බලපෑම සහ සම්භාවිතාව අනුව සිතියම් ගතකරනු ලැබේ.

මෙම අවදානම් ශ්‍රේණිගත කිරීම් වල ප්‍රතිඵල ඉහළ අවදානමක සිට නොසැලකිය හැකි අවදානම දක්වා වූ පරිමාණයකට අනුව ජාලයකට ඇතුළත් කර ඇති අතර, ඒ අනුව අවදානම්වල ප්‍රමුඛතාවන් සකස් කිරීමට සහ වැළැක්වීමේ, විමර්ශනය කිරීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වර්ගීකරණයක් යටතේ අවදානම් අවම කිරීමේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට හෝටලයට හැකියාව ලැබෙන්නේය.

හෝටලයේ අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් හඳුනාගත් අවදානම් මාසිකව සමාලෝචනය කරනු ලැබේ. අදළ අවදානම් පිළිබඳව වගකීම් පවරා ඇති නිලධාරීන් ඒවා අවම කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන අතර, ඒ ගැන සාමාන්‍යාධිකාරීවරයා හරහා මණ්ඩලයට වාර්තා කළ යුතුය. මූල්‍ය සහ මෙහෙයුම් අනුකූලතාව පිළිබඳ ඒකාබද්ධ වාර්තාව කළමනාකාරිත්වයට ලැබෙනු ඇත. අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් අවදානම් සමාලෝචන, අවදානම් කළමනාකරණ රැස්වීම් වල න්‍යායපත්‍රයට ඇතුළත් කරනු ඇත.

අවදානම් කාණ්ඩය සහ විස්තර	අවදානම් අවම කිරීමේ පාලන පියවරයන් සහ ක්‍රියාකාරී සැලසුම
තාක්ෂණ සහ තොරතුරු අවදානම ඉලෙක්ට්‍රොනික පද්ධති ක්‍රියා විරහිත වීමේ අවදානම සහ තොරතුරු පද්ධති ප්‍රමාණවත් නොවීම.	බාධාවකින් තොරව තොරතුරු ගලායාම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කරමින්, පූර්ණ ලෙස ඒකාබද්ධවූ දේපළ කළමනාකරණ, ද්‍රව්‍ය කළමනාකරණ, විකුණුම් ස්ථාන සහ මූල්‍ය තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. පද්ධතියේ බාධාවන් සහ ක්‍රියා විරහිත වීම් සිදුවුවහොත් අඛණ්ඩව වැඩිදියුණු කෙරෙන ආපද ප්‍රතිසාධන සැලැස්මක් පැවතීම. හෝටලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් අක්‍රිය කාලය අඩුකිරීම සහ මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා හෝටලයේ පරිගණක ස්ථාපනයන් ආරක්ෂා කිරීමේ පාලනයන් ක්‍රියාත්මක කර ඇත. තොරතුරු සුරක්ෂිතතාව සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ජාල ආරක්ෂණ ක්‍රියාවලිය නිරන්තර සමාලෝචනයට ලක් කරනු ලැබේ.
අභ්‍යන්තර ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටි මූල්‍ය අලාභ සහ ව්‍යාපාරයට බාධා වීමේ අවදානම සහ අභ්‍යන්තර පාලනයන් බිඳවැටීමේ අවදානම.	අඛණ්ඩ ඵලදායිතාව සඳහා වරින් වර සමාලෝචනය කරනු ලබන අභ්‍යන්තර පාලනයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද පද්ධති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වේ. මණ්ඩලය විසින් පත්කරන ලද විගණක කමිටුව වෙත ඍජුවම වාර්තා කරන අභ්‍යන්තර විගණක ක්‍රියාවලියන් සමාගම විසින් වරින් වර සිදුකරනු ලැබේ. සමාලෝචනය සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා මෙම පද්ධතිවල ප්‍රමාණවත් බව, ඵලදායිතාව සහ අනුකූලතා මට්ටම් පිළිබඳ වාර්තා වරින් වර විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
ආරක්ෂක අවදානම	හෝටල් කර්මාන්තයේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඵලදායී අධීක්ෂණ සහ නිරීක්ෂණ පද්ධති ස්ථාපිත කර ඇත. ආගන්තුකයින්ගේ සහ කාර්යමණ්ඩලයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂණ උපකරණ සහ නිරීක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන සිදුකර ඇත. ආරක්ෂාව ඵලදායීලෙස පවත්වා ගැනීම සහතික කිරීම සඳහා පුහුණු දක්ෂ ආරක්ෂක කාර්යමණ්ඩලයක් යොදවා ඇති අතර ඔවුන්ට අඛණ්ඩ පුහුණුව ලබා දේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කාණ්ඩය සහ විස්තර	අවදානම් අවම කිරීමේ පාලන පියවරයන් සහ ක්‍රියාකාරී සැලසුම
ස්වාභාවික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ආපදා සැලකියයුතු අලාභ සිදුකරමින් ඇතිවන දේපළ සහ උපකරණ විනාශයන්.	රක්ෂණ ආවරණ වල ප්‍රමාණවත් භාවය නිතිපතා සමාලෝචනය කර අවශ්‍ය පරිදි යාවත්කාලීන කරනු ලැබේ. වත්කම් ආරක්ෂා කිරීම සහ ඉක්මන් ප්‍රතිසාධනය සඳහා අර්බුද කළමනාකරණ සහ ව්‍යාපාර ප්‍රතිසාධන සැලසුම් අනුගමනය කර ඇත. මේවා වරින් වර සමාලෝචනය කෙරේ. හෝටලයේ පෙන්ටිහවුස්හි ගිනි අවදානම අවම කිරීම සඳහා ජල විදින පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත.
ණය අවදානම ණය ගැතියන්ගේ පියවීම් පැහැර හැරීම හේතුවෙන් ඇතිවන නිරාවරණ සහ අලාභ.	ණය පැහැර හැරීමේ බලපෑම අවම කිරීම සඳහා ණය ප්‍රතිපත්ති සහ දැඩි පාලනයන් ක්‍රියාත්මක වේ. නව ණයගැතියන් සඳහා ණය සීමාවන් අනුමත කිරීමේ ක්‍රියාවලිය නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ. කල්පැන ගිය ණය ගැතියන් පිළිබඳ වාර්තා මාසිකව අධීක්ෂණය කිරීම සහ කඩිනම් ක්‍රියාමාර්ග සඳහා කළමනාකාරිත්වයට වාර්තා කිරීම.
ද්‍රවශීලතා අවදානම මූල්‍ය බැඳීම් නියමිත දිනට සපුරාලීමට නොහැකි වීම.	සැපයුම්කරුවන්ගේ මුදල් කළමනාකරණය සහ ණය පහසුකම් සමීපව අධීක්ෂණය කිරීම සඳහා පද්ධති ක්‍රියාත්මක වේ. සමීප සමාලෝචන සහ අනුමත ක්‍රියාවලියක් යටතේ මෙහෙයුම් මුදල් සහ බැංකු පහසුකම් ලබාගන්නේ සමාගමට මූල්‍යමය හැකියාවක් ඇතිබව සහතික කිරීම සඳහාය. කළමනාකාරිත්වය විසින් ප්‍රාග්ධන ආයෝජන සමාලෝචනය කරනු ලබන අතර ඒවා අනුමත කරනු ලබන්නේ තිරසරභාවය සඳහා යථාර්ථවාදී මුදල් ප්‍රක්ෂේපණ සමග මූල්‍යකරණය සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයන් මත පදනම්වය.

ඇමරිකා එක්සත් ජනපදයේ හිල්ටන් වර්ල්ඩ්වයිඩ් විසින් හෝටල් කළමනාකරණය සඳහා නියමකර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙහෙයුම්වලට අනතුරක් විය හැකි අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය සඳහා හෝටලය මගින් ක්‍රියාවට නංවනලද ක්‍රියාවලීන් සමාගම විසින් වසර පුරා අඛණ්ඩව අධීක්ෂණය කරනු ලැබේ. අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරමින් ප්‍රාදේශීය කාර්යාලය මගින් වරින් වර සමාලෝචනයන් සිදුකරන අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මුදල් වර්ෂය සඳහා අවදානම් ලේඛනයේ ඇතුළත්කර ඇති ප්‍රධාන විෂයයන්, ඒවායේ තත්වය සහ අවම කිරීමේ උපායමාර්ග පහත දක්වා ඇත:

අවදානම් කාණ්ඩය සහ විස්තර	අවදානම් අවම කිරීමේ පාලන පියවරයන් සහ ක්‍රියාකාරී සැලසුම
මෙහෙයුම් අවදානම්	
තරගකාරී අවදානම නවීකරණ වැඩසටහන හේතුවෙන් වෙළඳපොළ කොටස අඩුවීම, තරගකාරී වීමට අපොහොසත්වීම නිසා පැමිණීම් සහ කාමර ගාස්තු අඩුවීම.	මුදල් සඳහා වන වටිනාකම සහතික කිරීම සඳහා සේවා සැපයීමේ ඉහළ ගුණාත්මකබව සහ සේවා ප්‍රමිතීන් දැඩිව පිළිපැදීම. පහසුකම් සහ සේවා වැඩිදියුණු කිරීම. සන්නාම ප්‍රමිතීන්ට සහ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOP) වලට අනුගතවීම සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම. තරග කරුවන්ගේ උපායමාර්ග සහ නවකයින් වෙළඳපොළට පැමිණීම අපේක්ෂා කිරීම සහ ඒ අනුව උපායමාර්ග සකස් කිරීම. නිෂ්පාදන හා සේවාවන්ගේ අඛණ්ඩ නිර්මාණශීලීත්වය සහ නව්‍යකරණය. ගනුදෙනුකරුවන් ප්‍රබෝධමත් කිරීම සඳහා ඔවුන්ගේ විවේචන සහ විචාර අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ ගැටලු වලට ක්ෂණික ප්‍රතිචාර දක්වීම.
සන්නාම ප්‍රතිරූපයට සහ කීර්තිනාමයට ඇතිවිය හැකි අවදානම සමාගමේ සන්නාමයට සහ කීර්තිනාමයට ද්‍රව්‍යමය හානියක් සිදුකළ හැකි ක්‍රියා	පහසුකම් සහ සේවා යන දෙඅංශයම ආවරණය වන පරිදි අමුත්තන්ගේ ප්‍රතිචාර පිළිබඳව සන්නාම විගණන සහ රහස් විගණන නිරන්තරයෙන් පැවැත්වීම. උපද්‍රව විශ්ලේෂණ සහ බරපතළ තත්ව පාලන පිළිවෙත් (HACCP) සහ වෙනත් තත්ව සහතික ප්‍රමිතීන් ලබා ගැනීමෙන් පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ යහ භාවිතයන්ට අනුකූල වීම. ග්ලෝබල් හිල්ටන් වර්ල්ඩ් වයිඩ් ප්‍රමිතීන්ට අනුව ආහාර සුරක්ෂිතතාව සහ සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගැනීම ආහාර සුරක්ෂිතතා සහ සනීපාරක්ෂක කළමනාකරු විසින් අධීක්ෂණය කිරීම. පානීය ජලය, පිහිනුම් තටාක ජලය, සිසිලන කුලුනු ජලය, ආගන්තුක කාමර ජලය සහ ආහාර සැකසුම් ජලය පිළිබඳ ආරක්ෂිත මට්ටම් සහ අවශ්‍යතා නිරීක්ෂණය කිරීම සඳහා පිළිගත් රසායනාගාරයක් මගින් ක්‍රමවේදීව විද්‍යාත්මක සහ රසායනික විශ්ලේෂණයන් නිරන්තරව සිදුකරනු ලැබේ.

අවදානම් කාණ්ඩය සහ විස්තර	අවදානම් අවම කිරීමේ පාලන පියවරයන් සහ ක්‍රියාකාරී සැලසුම
	ගෘහස්ථ වායු ගුණාත්මක පරාමිතීන් (IAQ) සඳහා හෝටලයේ වාතය නිරන්තර පරීක්ෂාවන්ට බඳුන් කරනු ලැබේ. සියලුම ආහාර සැකසුම් /ගබඩා උපකරණ ප්‍රශස්ත මට්ටමෙන් ක්‍රියාත්මක වන බව සහතික කර ගැනීම සඳහා නිවාරණ නඩත්තු වැඩසටහන් නිරන්තරයෙන් සැලසුම්කර ඉහළම ප්‍රමිතියට අනුව සිදු කරනු ලැබේ. නිෂ්පාදන සහ සේවා යන දෙඅංශය සඳහාම කර්මාන්තයේ හොඳම භාවිත ප්‍රමිතීන් පවත්වාගෙන යාම. ප්‍රධාන කළමනාකරණ තනතුරු හෝටල් කර්මාන්තයේ ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති සුදුසුකම් ලත් සහ පුහුණු කාර්ය මණ්ඩලයක් විසින් දරන බව සහතික කිරීම. සන්නාම සහතිකවීම් වලට අනුකූල නව්‍යකරණ සේවා සැපයුම් සිදු කිරීම. ආයතනික සමාජ වගකීම් (CSR) මූලාරම්භයන් මගින් වගකිවයුතු ආයතනික පුරවැසිභාවය.
මානව සම්පත් අවදානම ප්‍රධාන නිලධාරීන් සහ පුහුණු කාර්යමණ්ඩලය අහිමිවීමේ අවදානම; නුසුදුසු ශ්‍රම ක්‍රියාමාර්ග. අන්තරායකර සේවා තත්වයන්/ රසායනික ද්‍රව්‍ය වලට නිරාවරණය වීම හේතුවෙන් ඇතිවිය හැකි තුවාල/ සෞඛ්‍ය අවදානම්.	ව්‍යූහාත්මක පුහුණු වැඩසටහන් සහ කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලියෙන් පැනනගින අවශ්‍යතා මත අතිරේක පුහුණු සඳහා කටයුතු කිරීම. මනා සේවා සේවක සබඳතා, සේවක සුබසාධනය සහ දෙපාර්ශ්වයටම වාසිවන පරිදි සේවක සංගමය සමග ඵලදායී සහ විවෘත සන්නිවේදනයක් පවත්වා ගැනීම අවධාරණය කිරීම. කනිෂ්ඨ සේවක රැස්වීම්, විනෝද චාරිකා, පවුල් එක්රැස්වීම් සහ ආගමික කටයුතු හරහා සංවිධානය පුරා සමගියේ සහ සාමූහිකත්වයේ හැඟීම් වර්ධනය කිරීම. ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයින්ගේ වැටුප් මට්ටම් වෙළඳපොළේ වඩාත් තරගකාරී ලෙස සකස් කිරීම. ආරක්ෂිත ප්‍රමිතීන් සහ ක්‍රියාපටිපාටි දැඩිලෙස පිළිපැදීම සහ ක්‍රියාත්මක කිරීම.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

අප ගැන

සීමාසහිත හොටල් ඩිවෙලපර්ස් ලංකා ලිමිටඩ් යනු ශ්‍රී ලංකා භාණ්ඩාගාරයට සියයට සියයක කොටස් හිමි රජය සතු සමාගමකි. 1983 දී සංස්ථාපිත වූ ආයතනය ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර අංශයේ වෙළෙඳ ව්‍යාපාරයේ නියැලී සිටී. කීර්තිමත් හිල්ටන් කළමිබු හි හිමිකාරිත්වය සමාගම සතු වේ.

කොවිඩ් 19 වසංගතයේ බලපෑම

ලෝක ආර්ථිකය බිඳ වැටීමට හේතු වූ කොවිඩ් 19 වසංගතය පැතිරගිය වර්ෂය තුළ ගෝලීය සංචාරක කර්මාන්තයට දැඩි පහරක් එල්ල විණි. කෙසේ වෙතත්, 2021 දී ලෝකය පුරා සංචාරක කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී වූ නමුත් ඉහත කාලපරිච්ඡේදය (2020) හා සසඳන විට සංචාරකයින්ගේ පැමිණීම් වසරින් වසර සියයට හතරකින් වර්ධනය වීමත් සමග එහි ස්ථාවර වර්ධනයක් දක්නට හැකිවිය.

මෙම වර්ධනය සාධනීය සංඥාවක් බව අපි විශ්වාස කරන අතර සංචාරක පැමිණීම් වැඩිවීමත් සමඟ කර්මාන්තය වේගයෙන් දියුණු වනු ඇත.

කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මුල් මාසවලදී, කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා පනවන ලද අගුලු දැමීම් නිසා වසංගතයට පෙර තිබූ ප්‍රමාණයට සාපේක්ෂව සංචාරකයින්ගේ පැමිණීම් සියයට 72 කින් පහත හෙළමින් එහි වර්ධනයට දැඩි බලපෑම් ඇති කළේය.

නැවත කඩිනමින් යථා තත්වයට හේතු වූ කරුණු ලෙස නිසි කලට ක්‍රියාත්මක වූ එන්නත්කරන වැඩසටහන්, තවදුරටත් වෛරසය ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා රටවල් විසින් ක්‍රියාවට නංවන ලද සංචරණ සීමාකිරීම් සහ ලෝකයේ විවිධ ගමනාන්තයන්ට වසංගතයෙන් ඇතිවූ බලපෑමෙහි දක්නට ලැබුණු විවිධත්වය, නැවත ගමන් ආරම්භ කිරීමට විශ්වාසය ඇති කිරීමට හේතු විය.

පුළුල් ආවරණයකින් යුතු එන්නත්කරණය සහ එන්නත් සඳහා ප්‍රවේශය, සමාලෝචිත කාලපරිච්ඡේදයේ අවසාන භාගයේදී, ඔරොත්තු දීමේ හැකියාව සමඟින් ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රකෘතිමත් වීම ලොව පුරා ගෝලීය සංචාර නැවත ආරම්භ වීමට හේතු වී ඇත. මේ වන විට, ලෝක ජනගහනයෙන් සියයට 66.9 කට වඩා වැඩි පිරිසකට කොවිඩ් 19 එන්නතෙහි එක් මාත්‍රාවක්වත් ලබාගෙන ඇති අතර, ලෝක ව්‍යාප්ත එන්නත් වැඩසටහනෙන් සැලකිය යුතු ජනගහනයක් ආවරණය වීම ගෝලීය සංචාරක සීමාවන් ක්‍රමයෙන් ඉවත්ව යනු ඇති බවට ධනාත්මක දර්ශකයකි.

සාර්ව ආර්ථික පරිසරය

ශ්‍රී ලංකාවේ සංචාරක අංශය අඛණ්ඩව තෙවැනි වසරටත් විවිධ අභියෝග සහ දුෂ්කරතා සමග පොරබදමින් සිටිය ද 2021 වසරේ දී ජාත්‍යන්තර සංචාරකයින් 194,495ක් දිවයිනට ආකර්ෂණය කරගැනීමට සමත්විය. මෙතෙක් වාර්තාවී ඇති ඉහළම අගය වන 2018 වසරේ මිලියන 2.3 ක්වූ සංචාරකයින්ගේ පැමිණීම හා සසඳන විට සමාලෝචිත කාලසීමාව සඳහා වාර්තා වූ සංචාරකයින්ගේ පැමිණීම සැලකිය යුතු ලෙස අඩු අගයක් ගෙන ඇත.

2019 වසරේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මෙම ක්ෂේත්‍රයට පළමු දැවැන්ත පහර එල්ල වූ අතර එමගින් මෙම ක්ෂේත්‍රයේ ප්‍රගතිය අඩාල වූ අතර ඉන් පසුව 2020 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාව තුළ පැතිර ගිය කොවිඩ් 19 වසංගතයත් සමඟින් සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන් ඇණහිටීමට ලක්විය.

ආසාදන වීම් හා මරණ සංඛ්‍යාව මාසයෙන් මාසයට උත්සන්න වීමත් සමඟ මෙම තත්වය වඩාත් නරක අතට හැරුණ අතර වසංගතය ව්‍යාප්ත වීම මැඩපැවැත්වීම සඳහා රට වසා දැමීමට කටයුතු කරන ලදී.

වසංගතය ව්‍යාප්ත වීම පාලනය කිරීමට ගත් පියවර ගෝලීය සංචාරක කර්මාන්තය දැඩි ලෙස අඩපණ කළ අතර ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය කෙරෙහි ද එය දැඩි ලෙස බලපෑම් ඇති කළේය. ජාතික ආර්ථිකයට ආදායම් උත්පාදනය කිරීමේදී ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රය මත බෙහෙවින් රඳා පවතින බැවින් සමාලෝචිත වර්ෂයේ දී අතිශයින් දැඩි ආර්ථික පීඩනයක් ඇතිවිය.

කෙසේවෙතත් ශ්‍රී ලංකාව ඵලදායී ආකාරයෙන් සාර්ථක එන්නත්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර එහිදී දේශීය සහ විදේශීය සංචාරකයින් ආරක්ෂා කරගැනීම සඳහා ගනු ලැබ ක්‍රියාමාර්ග තුළින් ගෝලීය සංචාරකයින් අතර විශ්වාසය ගොඩනැංවීමට උපකාරී විය.

මෙම ප්‍රගතිශීලී පියවර සංචාරක කර්මාන්තයේ උන්නතියට මහත් දායකත්වයක් ලබාදුන් අතර 2021 වසරේ අග සහ 2022 මුල් භාගයේදී මෙම ක්ෂේත්‍රය වර්ධනයට හේතුවිය. දිවයිනට පැමිණෙන සංචාරකයින්ගේ පැමිණීමේ අනුපාතිකය මාසයෙන් මාසයට දෙගුණයකින් වැඩි වීම දක්නට හැකිවිය.

2021 වසරේදී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 194,495 කි. මාර්තු මාසයෙන් අවසන් වන විට 2022 පළමු කාර්තුවේ සංචාරකයින්ගේ පැමිණීම 285,335 ක් වීමත් සමඟ සංචාරක ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව තෝරා ගැනීමේ උනන්දුව ඊළඟ මාසවලදී තවදුරටත් වර්ධනය විය.

2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා කාලය තුළ ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව තෝරා ගන්නා වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණෙන රටවල් අතර රුසියානු සමූහාණ්ඩුව, ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය පළමු රටවල් 5 අතර වේ. එක් රටක් වශයන් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සඳහා විශාලතම දායකත්වය ලබාදුන්නේ ඉන්දියාවය. රුසියාවෙන් සංචාරකයින් පැමිණීම 2022 පෙබරවාරි දක්වා ස්ථාවර වැඩිවීමක් වාර්තා කළ අතර 2022 මාර්තු මාසයේදී රුසියාව-යුක්රේන ගැටුම සමග සංචාරකයින්ගේ පැමිණීම මන්දගාමී විය.

ඉදිරි දැක්ම

මූල්‍ය වර්ෂයේ අවසන් කාර්තුව තුළ ප්‍රගතියක් ඇති වුවත් දේශපාලන අස්ථාවරත්වය සහ විදේශ විනිමය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා දේශීය සංචාරක ව්‍යාපාරය මේ වන විට දැඩි අභියෝගවලට මුහුණ පා සිටී.

විදේශ විනිමය හිඟකම, ඉන්ධන සහ ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟයට මුල් වී ඇත. එසේම එය ජාත්‍යන්තර සංචාරකයින්ගේ පැමිණීම ඉහළ නැංවීමට සහ පවත්නා අභියෝගවලින් ජය ගැනීමට උත්සාහ කරන සංචාරක කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රධාන ගැටලු ලෙස පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමට සහ අවශ්‍ය විශ්වාසය ගොඩනැංවීමට මැදිහත් වීම සංචාරක කර්මාන්තයේ වෙනසක් ඇති කිරීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම මගින් ශ්‍රී ලංකාව සංචාරය කිරීමට ලාභදායී රටක් වනු ඇති බැවින් අනෙකුත් කලාපීය ගමනාන්ත අභිබවා ලෝකයේ විශාල වෙළඳ පොලක් හිමිකරගනැනීමට හැකිවීමද මෙම කර්මාන්තයට නව අවස්ථා නිර්මාණය කරනු ඇත.

ගෝලීය ආර්ථික වර්ධනය

ආර්ථිකයන් උත්තේජනය කිරීම සඳහා අනුගමනය කළ මූල්‍ය ක්‍රියාමාර්ග සහ ක්‍රමානුකූලව සංචරණ සීමා ලිහිල් කිරීමෙන් පසු ආර්ථිකයේ ආකර්ෂණීය පිබිදීමක් පෙන්නුම් කරමින් 2021 හි ගෝලීය ආර්ථික වර්ධනය සියයට 5.9 දක්වා වර්ධනය විය.

කෙසේ වෙතත්, විවිධ කාල පරාසයන් තුළ දේශසීමා අතර සංචරණ සීමා පැනවීම, භාණ්ඩ මිලෙහි අස්ථාවරභාවය, සැපයුම් දාම බිඳ වැටීම සහ භූ දේශපාලනික ආතතීන් වැනි සාධක කිහිපයක් හේතුවෙන් නැවත යථා තත්ත්වයට පත්වීමේ අසමාන ඇති විය. යුක්රේන-රුසියානු ගැටුමෙන් ඇති විය හැකි ආර්ථික බලපෑම සමග මෙම පීඩනයන් 2022 වසරේ ඉදිරි දැක්මට බාධා පමුණුවයි. මෙම වසර තුලදී IMF ව්‍යාපෘතින් උපකල්පනය කරන්නේ 4.4 ක මධ්‍යස්ථ වර්ධනයකි.

සමාගමේ කාර්යසාධනය

සමාගම 2020 වසරේ අදාළ කාලසීමාවේ ලබාගත් මිලියන 1,081ක ආදායමට සාපේක්ෂව 2021 මූල්‍ය වර්ෂය තුළ රු. මිලියන 1,178 ක ශුද්ධ ආදායමක්, එනම් ආන්තික වැඩිවීමක් වාර්තා කරන ලදී.

පෙර වසරේ මිලියන 313 සසඳන විට කාමර ලබාදීම මගින් ලබාගත් ආදායම රු. මිලියන 237 ක් දක්වා අඩුවුවත් ආහාර පාන අංශයේ වෙළඳාම වැඩිවීම මෙම ආදායම යම් මට්ටමක පවත්ගෙන යාමට හේතු විණි. ලොව පුරා කොවිඩ් 19 ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස දේශසීමා වසා දැමීම සහ සංචාරකයන් සඳහා පැනවූ සීමාවන් කාමර ආදායම කෙරෙහි සැලකිය යුතු අන්දමින් බලපෑවේය. වසංගතයෙන් නැගුණු ගැටළු නිරාකරණය කිරීමට හෝටලය නොයෙකුත් පියවර ගනිමින් උත්සාහ කරන ලදී. අනුගමනය කරන ලද සමහර ක්‍රියාමාර්ග අතර ආහාර පාන කාර්යසාධනය කෙරෙහි බලපාන තීව්‍ර අලෙවිකරණ ප්‍රවර්ධනය සහ නව්‍ය ව්‍යාපාරික උපායමාර්ග විය.

ආහාරපාන අංශයෙන් හෝටලය රු. මිලියන 925ක් ඉපයූ අතර එය 2020 වසරේ මිලියන 743 හා සසඳා බලන කළ වර්ධනය වීමකි.

2021 දී පවා සෞඛ්‍ය අර්බුදයේ බලපෑම බෙහෙවින් ව්‍යාප්ත වීම හේතුවෙන්, දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ක්ෂයවීම් සහ බදු අයකිරීමෙන් පසු 2021 වසරේ සමාගම ලැබූ ශුද්ධ පාඩුව රුපියල් මිලියන 957ක් වේ. සිදු වූ ශුද්ධ අලාභය 2020 වසරේ දී වාර්තා වූ මිලියන 918 ට වඩා වැඩි අගයකි. අලාභය වර්ධනය වීමට හේතු වූයේ මූල්‍ය පිරිවැය පෙර වසරේ රුපියල් මිලියන 43 සිට මිලියන 134 දක්වා වැඩි වීමය. වසංගතය පැවති කාල සීමාව තුළ කාරක ප්‍රාග්ධනයට මුදල් යෙදවීම සඳහා කෙටි කාලීන ණය ගැනීම් වල ප්‍රතිඵලයක් වන මෙම පිරිවැය වර්ධනය වීම ලාභය කෙරෙහි සැලකිය යුතු අන්දමින් බලපෑමක් ඇති කළේය.

අපගේ ව්‍යාපාර උපායමාර්ගය සහ අනාගත දැක්ම

පශ්චාත් වසංගත කාලය සඳහා සමාගමේ ආදායම් ප්‍රවාහයේ සුරක්ෂිතභාවය උපරිම කර ගැනීමට සහ අනෙකුත් උසස් මට්ටමේ ජාත්‍යන්තර සහ දේශීය තරු 5 ශ්‍රේණියේ නාගරික හෝටල් සමඟ එලදායී ලෙස තරඟ කිරීම සඳහා සමාගම සතු දේපළ ඉහළ නැංවීම කෙරෙහි සමාලෝචනයට ලක් කරන වර්ෂයේදී අවධානය යොමු කළේය. හෝටලය සංවර්ධනය සඳහා වූ කෙටි හා මධ්‍ය කාලීන උපායමාර්ගය මගින් COVID කාල සීමාව තුළ මුහුණ දුන් අර්බුද සහ අභියෝග අවස්ථා බවට පරිවර්තනය කිරීම සඳහා සුදුසු පසුබිමක් සැලසිනි.

හිල්ටන් කළමිබු නවීකරණය කරන ලද අතර, අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් සපයන කාමර 253 ක්, චීන ආහාර සඳහා විශේෂිත වූ නව අවන්හලක් ඉදිකිරීම, Emperor's Wok සහ සන්සෙට් බ්ලූ නමින් නව රාත්‍රී සමාජ ශාලාවක් විවෘත කිරීම එම සංවර්ධනයට අයත් වේ. එසේම ශ්‍රී ලාංකික ආහාර සඳහා සුවිශේෂී වූ අවන්හලක් වන කරි ලීෆ් තවදුරටත් සංවර්ධනය කිරීමට සහ විශිෂ්ට ආහාර පාන අත්දැකීමක් සහිත ජපන් ආපනශාලාව විවෘත කිරීමට සැලසුම් ක්‍රියාත්මක වේ. මෙම කටයුතු ආහාර පාන ආදායම ඉහළ නැංවීමට සහ වෙළඳපොලේ විශාල කොටසක් හිමිකරගැනීම සඳහා තරඟ කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කලාපීය සහ වාණිජ MICE ව්‍යාපාර සහ භෝජන උත්සවශාලා සහ නව අවන්හල් ප්‍රවර්ධනය කිරීමේ සැලසුම් සමගින් පශ්චාත් කොවිඩ් කාලය තුළ පවත්නා තරඟකාරී ව්‍යාපාරික වාතාවරණය තුළ හෝටලය සඳහා නව පෙනුමක් ලබා දීමට නිසැකවම හැකිවනු ඇත. කලාපීය සහයෝගය ඇතිව ශ්‍රම බලකාය පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම පිළිබඳව ද තවදුරටත් අවධානය යොමු කරන ලදී. හවුල්කාරිත්වයෙන් යුතු පුහුණු සේවා මගින් සපයන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමටත් එමගින් ආගන්තුක සත්කාරක ව්‍යාපාරයේ දැනට පවත්නා වෙළඳපල කොටස තවදුරටත් පුලුල් කරගැනීමටත් අපේක්ෂා කෙරේ. හෝටලයේ මෙහෙයුම් බාධාවකින් තොරව සිදු කරන අතරම දේපල වැඩිදියුණු කිරීම් සිදු කරනු ලැබේ, එබැවින් ආදායම් පදනම පවත්වා ගැනීම සඳහා ආහාර පාන අංශය ප්‍රවර්ධන සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. වෙළඳපල ඉල්ලුම මත ක්‍රියාත්මක වන නවීනතම සැලසුම් සහ තාක්ෂණයට අනුව අමුත්තන් සඳහා වූ කාමරවල ගුණාත්මකභාවය ඉහළ දැමූ පසු, මිලකරණයට අගය එකතු කිරීමක් අපේක්ෂා කරන අතර එය නව හෝටල් සමඟ තරඟ කිරීමට උපකාරී වනු ඇත.

තිරසරභාවය පිළිබඳ වාර්තාව

හිල්ටන් හෝටලයේ හිමිකාරිත්වය දරණ හොටෙල් ඩිවෙලොපර්ස් සමාගම එහි ක්‍රියාකාරිත්වය මගින් ඇතිවන සමාජ, පරිසර සහ ආර්ථික බලපෑම් වලට ප්‍රතිචාර දැක්වීමේදී එහි කීර්තිනාමය හා දශක ගණනාවක් පුරා ගොඩනැගෙමින් පැවතගෙන අද්විතීය සන්නාමයේ ගෞරවය ආරක්ෂා කරගැනීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කරනු ලබයි.

සලකා බලන වර්ෂය තුළදී හෝටලය, තිරසරභාවය සහ ප්‍රධාන පාර්ශවකරුවන් සමග ශක්තිමත් සම්බන්ධතා ඇතිකරගැනීම සඳහා දරණ ලද ප්‍රයත්නයන් සාර්ථක කරගෙන තිබේ. මෙම තත්වය ලඟාකරගෙන තිබෙන්නේ තම පාරිභෝගිකභවතුන්, කාර්යය මණ්ඩලය, සැපයුම්දාමයන් සහ ව්‍යාපාරික පාර්ශවයන්ගේ අවශ්‍යතා සපුරාලීමට වඩාත් සක්‍රීයව කටයුතු කරන අතරම තම ක්‍රියාකාරිත්වයන් මගින් පරිසරයට ඇතිවන බලපෑම අඩුකිරීම සඳහා වූ ව්‍යාපෘතිවලට වඩාත් සක්‍රීයව සම්බන්ධවීමෙනි. සියලුම ක්‍රියාකාරකම් හිදී තම කොටස්කරුවන් සඳහා ලාභ උත්පාදනය කිරීමත් ප්‍රජාවට ධනාත්මක බලපෑමක් ඇතිවන අන්දමින් ක්‍රියා කිරීමටත් සෑම අවස්ථාවකදීම ඉතා සැළකිල්ලෙන් කටයුතු කරන ලදී.

අපගේ සාර්ථකත්වයටත් සන්නාමය ඇගයීමට ලක්වීමටත් ප්‍රධාන වශයෙන් හේතු වූයේ සේවාව, ගුණාත්මකභාවය සහ අභිප්‍රේරණයයි.

ඉතා උසස් අන්දමින් පාරිභෝගිකයින්ට සේවා සැලසිය හැකි සහ උසස් ප්‍රමිතියෙන් පාරිභෝගිකයින් සමග අන්තර්ක්‍රියාකළ හැකි කුසලතාවන්ගෙන් පරිපූර්ණ ප්‍රවීණ කාර්යය මණ්ඩලයක් කොළඹ හිල්ටන් හෝටලයේ සිටින බවට පොදුවේ පිළිගනු ලැබේ. වඩාත් පරිපූර්ණ, නිසි අන්දමින් සැකසුනු බඳවා ගැනීමේ ක්‍රියාවලියකින් සමන්විතවීම, පුහුණු කිරීම් සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සමගින් එක්වුණු සුභසාධන වැඩසටහන් ආදී සියල්ල කණ්ඩායම් ක්‍රියාකාරිත්වයට සාධනීය වාතාවරණයක් සකසන අතර දෛනික මෙහෙයුම් කටයුතු වඩාත් උනන්දුවෙන් සිදුකිරීමට උපකාරවේ. හිල්ටන් ඉන්ටර්නැෂනල් හි සන්නාම තානාපතිවරුන් ලෙස කටයුතු කිරීමද අපගේ කණ්ඩායමේ සිත්සතන් තුළ රැඳී පවතින අතර ඔවුන් මේ සඳහා කැපවීමෙන් ක්‍රියාකරති.

BLUE ENERGY කමිටුව සහ අනෙකුත් විවිධ කණ්ඩායම් සම්බන්ධ 2021 වසරේ ක්‍රියාකාරකම්

- COVID-19 වසංගත කාලය තුළ ගමනාගමනයට සීමා ඇති වූ බැවින් උත්සව නිවාඩු දිනයන් තුළ සාමාජිකයින් කුඩා කණ්ඩායමක් හෝටල් පරිශ්‍රය තුළ රඳවන ලදී. එම කණ්ඩායම් සාමාජිකයින්ගේ අවශ්‍යතා සපුරාලමින්, මෙම කණ්ඩායමේ සාමාජිකයින්ට හෝටල් පරිශ්‍රයේ රැඳී සිටින කාලය තුළ කෙටි ආහාර පාර්සල් ලබා දීමට කටයුතු කළේය.

- සැප්තැම්බර් 11 වන දින හිල්ටන් කලම්බු හෝටලය එහි 34 වන වියට පා තැබූ අතර එය ඉතා පරිත්‍යාගශීලී සිත් පෙරදැරිව සමරනු ලැබීය. කොළඹ සහ ඒ අවට ප්‍රදේශවල ජීවත්වන අඩු වරප්‍රසාද සහිත පදිංචිකරුවන් සඳහා හෝටලය විසින් දින 34ක් පුරා අඛණ්ඩව දිවා ආහාර ඇසුරුම් ලබා දීමට කටයුතු කළේය. Women in Management (WIM) සමඟ සහයෝගයෙන් යුතුව මෙම කර්තව්‍ය සිදු කරන ලදී.

- වාර්ෂිකව පවත්වන කණ්ඩායම් සාදය සන්සෙට් බිලූ හි ඔක්තෝබර් 31 වැනිදා පැවැත්වුණු අතර එය කැපවීමෙන් සේවය කරන අපගේ කණ්ඩායම් සාමාජිකයින් සඳහා සජීවී සංගීතය, ආහාර පාන වර්ග සහ විනෝදාත්මක ක්‍රියාකාරකම්වලින් සපිරුණු ක්‍රියාකාරකම් සහිත සන්ධ්‍යාවක් විය.

- නත්තලේ ප්‍රීතිය ගෙන එම සඳහා, අපගේ කණ්ඩායම් සාමාජිකයින් විසින් දෙසැම්බරයේ නත්තල් කැරොල් සංවිධානය කළේය.

දෙපාර්තමේන්තු ඇගයීම

වසර පුරා, දෙපාර්තමේන්තු විසින් ඔවුන්ට වෙන් කළ මාසය තුළ ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නංවමින් ආයතනය වෙනුවෙන් ලබා දුන් කැපවීම සඳහා ගෞරවයට සහ ඇගයීමට පාත්‍ර විය. හෝටල්වල සියලුම දෙපාර්තමේන්තු ඇගයීම සඳහා නිශ්චිත මාසයක් වෙන් කරනු ලැබේ.

කණ්ඩායම් සාමාජිකයින් ඇගයීමේ සති

2021 වසරේදී කණ්ඩායම් සාමාජිකයින් ඇගයීම් සතියේදී විවිධ කණ්ඩායම් අවධානයට ලක් විය. දෙපාර්තමේන්තු අතර ඇගයීම ඉහළ නැංවීම සඳහා ඇගයීම් සතිය ක්‍රියාවට නංවන ලදී. සෑම දෙපාර්තමේන්තුවක්ම තමන් කැමති වෙනත් දෙපාර්තමේන්තුවක් කෙරෙහි තම ඇගයීම සිදුකළ යුතුය. මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සමස්ථ හෝටලයේ කාර්ය මණ්ඩලයේ උත්සාහය අගය කළේය.

දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සිය කාර්යමණ්ඩලය වෙත සටහනක් සහ කෙටි සංග්‍රහයක් ලබා දීම මගින් කෘතඥතාව පළ කිරීම ඇගයීමේ සතියේ දී සිදු විය.

THRIVE@HILTON ACTIVITIES

ක්‍රියාකාරකම	වැඩසටහන
කණ්ඩායම් සාමාජිකයින්ගේ සෞඛ්‍ය	■ අපගේ කණ්ඩායම් සාමාජිකයින්ගේ උසට සරිලන බර Body Mass Indexes (BMIs) නිතර ඇගයීමට ලක් කෙරේ. කණ්ඩායම් සාමාජිකයින් අතරින් සිරුරේ බර කළමනාකරණය කර ගැනීමට සහය අවශ්‍ය සාමාජිකයින් සඳහා හෝටලයේ වෛද්‍යවරයා සහ හෙදිය විසින් පුද්ගල සත්කාර ලබා දෙන ලදී.
අභිප්‍රේරණ වැඩසටහන්	■ 2021 වසරේ හිල්ටන් හෝටලයේ කාන්තා සතිය නිමිත්තෙන් ආචාර්ය සුලෝචනා සිගේරා (සභාපතිනි, Women in Management), කස්තුරි වෙල්ලරාජා විල්සන් (සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී, හේමාස් හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගම) සහ ආචාර්ය රමණි ජයසුන්දර (අධ්‍යක්ෂක, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ යුක්තිය) විසින් වැඩසටහනක් පවත්වන ලදී. ■ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්හි නායකත්ව පුහුණුකරුවෙකු වන ආචාර්ය ලේ රූපානර් විසින් 'Mental Load' මාර්ගගත අභිප්‍රේරණ වැඩසටහනක් ඔක්තෝබර් මැද භාගයේදී පවත්වන ලදී.
නායකත්ව වැඩසටහන්	■ ආහාර පාන අංශය සහ මුලුතැන්ගේ කණ්ඩායම් සඳහා හතරවන කාර්තුව ආරම්භයේදී තාසිම් රාෆි (PwC උපදේශක) සහ කුමාර් ද සිල්වා (පුද්ගලික සහ ආයතනික ආචාර ධර්ම පුහුණුකරු) විසින් එම කණ්ඩායම් සාමාජිකයින්ගේ නායකත්වය, වෘත්තීය සහ ආයතනික ආචාරධර්ම සංවර්ධනය කිරීම පිළිබඳ එක්-දින පාඨමාලාවක් පවත්වන ලදී. ■ 2021 ඔක්තෝම්බර් මාසයේදී වසංගතයේ අවදානම ඉහළ යමින් පවතින අවදියේ පළමු පෙළ මැදිහත්කරුවෙකු වූ වෛද්‍ය කීර්ති ෆොන්සේකා මහතා විසින් මාර්ගගත සැසියක් මගින් වසංගතය පිළිබඳව කරුණු සහ දත්ත පිළිබඳව හෝටලයේ කණ්ඩායමේ සාමාජිකයින්ට දැනුම්වත් කළේය. ■ 2021 ඔක්තෝම්බර් මස අවසන් භාගයේ දී ෂෙවාන් ඩැනියෙල් මහතා (කණ්ඩායම් අධ්‍යක්ෂ, කැපිටල් මහරාජා සමූහ ව්‍යාපාරය) විසින් හිල්ටන් ආයතනයේ ශ්‍රී ලංකා කණ්ඩායම දිරිගැන්වීමේ දේශනයක් කළේය. ■ කීර්තිමත් ගුවන් නියමුවෙකු වන කපිතාන් එල්මෝ ජයවර්ධන මහතා විසින් The Pilot' වැඩසටහනකදී තම ජීවන ගමන්මග පිළිබඳව තොරතුරු බෙදාගනිමින් නායකත්ව කණ්ඩායම තුළ ධනාත්මකභාවය සහ ශක්තිය ඇති කළේය. ■ 2021 නොවැම්බර් මාසයේදී දුලින්ද පෙරේරා මහතා (IKON හි ප්‍රධාන විධායක නිලධාරී/නිර්මාතෘ) ඩිජිටල් ආගන්තුක සත්කාර සිදුකිරීමට අපගේ ව්‍යාපාර කණ්ඩායමට සහාය විය. ■ නොවැම්බර් මාසයේදී බ්‍රිගේඩියර් සජිත් ලියනගේ මහතා 3Cs, ගුණාංග, චරිතය,කාර්යශූරත්වය සහ ධාරිතාවය පිළිබඳව නායකත්ව කණ්ඩායමට පුහුණුවක් පැවැත්විය.

ආධුනිකත්ව පුහුණුව

ආයතනය තරුණයින් විශේෂිත රැකියා සඳහා සූදානම් කිරීම සඳහා නිර්මාණය කර ඇති රජයේ ආයතනයක් වන ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ කොළඹ හිල්ටන් ආයතනය සමීපව කටයුතු කරමින් දැනට හෝටලයේ විවිධ දෙපාර්තමේන්තුවල ආධුනික වැඩසටහන් පහක් ක්‍රියාත්මක කරයි. පහත සඳහන් ආධුනිකත්ව පුහුණු වැඩසටහන් දැනට හෝටලය තුළ ක්‍රියාත්මක වේ:

- මුළුතැන්ගෙයි ආධුනිකත්ව පුහුණු වැඩසටහන (කාලසීමාව: අවුරුදු 2.5)
- මුළුතැන්ගෙයි ගබඩා භාරකාර ආධුනිකත්ව පුහුණු වැඩසටහන (කාලසීමාව: වසර 1)
- පිරිසිදු කිරීමේ/කාමර පිළියෙළ කිරීමේ ආධුනිකත්ව පුහුණු වැඩසටහන (කාලසීමාව: වසර 1)
- ආහාර සහ පාන පිළිබඳව ආධුනිකත්ව පුහුණු වැඩසටහන (කාලසීමාව: අවුරුදු 1.5)
- ඉංජිනේරු අංශයේ ආධුනිකත්ව පුහුණු වැඩසටහන (කාලසීමාව: අවුරුදු 2.5)

හිල්ටන් හෝටලයේ රැකියා

2021 දී සමස්තයක් වශයෙන්, හිල්ටන් හෝටලය මගින් පැය 942 ක නිපුණතා ප්‍රවර්ධනය සඳහා දැරූ ප්‍රයත්නයන් සමඟ සමස්තයක් වශයෙන් තරුණයින් 346 දෙනෙකුට ධනාත්මක බලපෑමක් ඇති කර තිබේ.

ආධුනිකත්ව පුහුණු වැඩසටහන් පහ යටතේ පුද්ගලයින් 23 දෙනෙකුට සවිබල ගැන්වූ අතර, සීමාවාසික පුහුණු වැඩසටහන යටතේ 2021 වසරේ දී සීමාවාසික තනතුරු 37ක් පිරිනමන ලදී.

ලිය දිරිය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අනුග්‍රහය යටතේ, දිවයිනේ තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් 10 දෙනෙකු ගෘහ පාලන දෙපාර්තමේන්තුව සඳහා පුහුණු කරන ලදී. පුහුණුව අවසන් වූ පසු, ආධුනිකයින් ශ්‍රී ලංකාව පුරා පිහිටි හිල්ටන් සමූහයේ ගෘහ පාලන දෙපාර්තමේන්තුවල පුහුණුවන්නන් ලෙස රැකියාවලට අනුයුක්ත කරන ලදී.

KLSHHM x Hilton Sri Lanka

කොරියානු ලංකා ආගන්තුක සත්කාර සහ හෝටල් කළමනාකරණ පාසලේ අනුග්‍රහය සහිතව දිවයිනේ තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශවල තරුණ තරුණියන් 20 කට අධික සංඛ්‍යාවක් මේ වන විට මෙහෙයුම් දෙපාර්තමේන්තු හතරක් සඳහා පුහුණු කරනු ලැබේ. පුහුණුව අවසන් වූ පසු, ඉදිරියේ දී විවෘත කිරීමට නියමිත Hilton Yala Resort හි පුහුණුවන්නන් ලෙස ඔවුන්ට රැකියා ලබා දෙනු ඇත.

Bright Blue Futures

SLIIT හි ආගන්තුක සත්කාර කළමනාකරණ සහ වාණිජ සූපශාස්ත්‍රය අංශයේ විලියම් ඇන්ග්ලිස් ආයතනය 2021 දී ඉගෙනුම් සහ සංවර්ධන (L&D) කණ්ඩායම සහ අනෙකුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මෙහෙයවනු ලබන වෘත්තීය ප්‍රගති වැඩසටහනකට උපාධි අපේක්ෂකයින් සහභාගී කරවීය.

ඉගෙනුම් සහ සංවර්ධන හා මානව සම්පත් කණ්ඩායම් විසින් 2021 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) සිසුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩමුළුවක් පවත්වන ලදී.

සෞඛ්‍ය සහ රැකවරණය

ආහාර සුරක්ෂිතතාව සහ සනීපාරක්ෂාව පිළිබඳ වැළැක්වීමේ පුහුණු වැඩසටහන් වසර මුළුල්ලේ නිතිපතා සිදු කරනු ලැබේ.

අපගේ කණ්ඩායම් සාමාජිකයින් සඳහා පුද්ගල සනීපාරක්ෂාව සහ ආරක්ෂණ විධිවිධාන පිළිබඳව පුහුණු වැඩසටහන් නිතිපතා පවත්වනු ලැබේ. අපි ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂාව (Rapid Antigen Tests) හරහා අපගේ කාර්ය මණ්ඩල නිලධාරීන් අතර COVID-19 පැතිරීම පරීක්ෂා කිරීම කාලසීමාවකට වරක් සිදු කරනු ලැබේ.

ප්‍රජාව

දශක තුනකට වැඩි කාලසීමාවක් වාණිජ අගනගරයේ කොටසක් ලෙසින් ක්‍රියාත්මක වන හිල්ටන් කළම්බු හෝටලයේ පරිසර මිතුරු භාවිතාවන් පිළිබඳව දැනගැනීමෙන් පසුව දේශීය ජනතාවගේ හොඳහිත සහ සහයෝගය තුළින් මහත් ප්‍රතිලාභ අත්කරගෙන තිබේ.







කොළඹ හිල්ටන් හි ස්වේච්ඡා ජාලය මගින් කණ්ඩායම් සාමාජිකයින්ට ප්‍රජාව සහ පරිසරය වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරිවලින් ඔබ්බට ගොස් කටයුතු කිරීමට හැකියාව ලැබේ.

2021 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා Breathe Organization විසින් කැලණිය මානෙල්වත්ත විහාරස්ථානයේ පැල 400ක් සිටුවීමේ 'Travel With Tourpose' ව්‍යාපෘතියට සහභාගී වීම සඳහා හිල්ටන් කළම්බු Hilton Colombo හි සහභාගිත්වය සාදරයෙන් පිළිගන්නා ලදී.

සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ආයතනයෙහි අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ වාර්තාව සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

1. ප්‍රධාන ක්‍රියාකාරකම

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ හෝටල්වල හිමිකරුවන්ගේ සහ මෙහෙයවන්නන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා සහ එම කාර්යය සඳහා ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් දේපළ ඉදිකිරීම, මිලදී ගැනීම, බදු ගැනීම, හෝ වෙනත් ආකාරයකින් අත්පත්කර ගැනීම සහ ඒවා වැඩිදියුණු කිරීම, සුදානම් කිරීම සහ සපයා දීමයි.

2. මූල්‍ය ප්‍රකාශන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 26 වන පිටුවේ සිට 51 වන පිටුව දක්වා ඇතුළත් කර ඇත.

3. අබණ්ඩභාවය

නුදුරු අනාගතය තුළ සිය මෙහෙයුම් අබණ්ඩව සිදුකිරීමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂවරුන් සැහීමකට පත්වේ. ඒ අනුව සමාගමේ මූල්‍ය වාර්තා අබණ්ඩ පැවැත්ම පදනම් කරගෙන සකස්කර ඇත.

4. විගණන වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව 23 වන පිටුවේ සිට 25 වන පිටුව දක්වා ඇතුළත් කර ඇත.

5. ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 3වන සටහනෙහි දක්වා ඇත.

6. බදුකරණය

මූල්‍ය ප්‍රකාශනවල 10 වන සටහනෙහි දක්වා ඇති අනුපාතයන්ට අනුව බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත.

7. ලාභාංශ

2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් වෙනුවෙන් ලාභාංශයක් අධ්‍යක්ෂවරුන් නිර්දේශ නොකරයි.

8. අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ කොටස් අයිතීන්

2021 දෙසැම්බර් 31 වන විට සමාගමේ අධ්‍යක්ෂවරුන් වූයේ:

අධ්‍යක්ෂවරයාගේ නම	පත්වීම් දිනය
P.A.I. සිරිනිමල් පෙරේරා මහතා	24.01.2020
D.S. අමරසේකර මෙනවිය	07.04.2015
I.P. දන්තනාරායන මහතා (12.07.2022 සිට ඉල්ලා අස්විය)	24.01.2020
V. කනගසභාපති මහතා	24.01.2020
P.H.P. දෙණියාය මහතා	24.01.2020
L.R.S. වීරසිංහ මහතා	28.02.2020
M.T.I.V. අමරසේකර මෙනෙවිය (24.03.2022 සිට සේවය අවසන් කරන ලදි)	03.07.2020
P.A.S.A. කුමාර මහතා	24.08.2020

සමාගමේ ඉහත අධ්‍යක්ෂවරුන් කිසිවෙකු සමාගමේ කොටස් හිමිකම් නොදරයි.

වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලා අස්වීම් සමාලෝචනය කරමින් පවතී.

වයස අවුරුදු 70ට වැඩි P.A.I. සිරිනිමල් පෙරේරා මහතා සහ වී. කනගසබාපති මහතා, අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශය මත සමාගම් පනතේ 211 වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂවරුන් ලෙස නැවත පත්කිරීම සඳහා ඉදිරිපත්වේ. එම අධ්‍යක්ෂවරුන් සඳහා වයස අවුරුදු 70 සීමාව අදළ නොවන බවට ප්‍රකාශ කරමින් P.A.I. සිරිනිමල් පෙරේරා මහතා සහ V. කනගසබාපති මහතා නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කළ යුතුයැයි කියැවෙන යෝජනා එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ට ඉදිරිපත් කරනු ලැබේ.

9. පිළිබැන්දියා ලේඛනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 192(2) වගන්තිය මගින් දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන් සාමාන්‍ය අනාවරණයන් සිදුකර ඇත. මෙම අනාවරණයන්ගෙන් පැන නගින, ඔවුන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත් පිළිබඳව විස්තර තිබෙනම්, ඒවා මූල්‍ය ප්‍රකාශයේ 37.1 සටහන යටතේ හෙළි කරනු ඇත.

10. අධ්‍යක්ෂවරුන්ගේ වේතන

ගිණුම්කරණ කාලය තුළ අධ්‍යක්ෂවරුන්ගේ වේතන සහ වෙනත් ප්‍රතිලාභ පහත දැක්වෙන පරිදි විය:

අධ්‍යක්ෂවරුන්ගේ වේතන රුපියල් 3,725,000/- (2020 සඳහා රුපියල් 4,065,000/-)

11. අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව/ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

ඉහත විස්තර මූල්‍ය ප්‍රකාශනවල 37 වන සටහනෙහි අඩංගුවේ. එහි අනාවරණය කරන ලද ඒවා හැරුණු විට සමාගම සමග ගිවිසුම් හෝ යෝජිත ගිවිසුම් පිළිබඳව හෝ අධ්‍යක්ෂවරුන්ගේ සෘජු හෝ වක්‍ර උනන්දුවක් නොමැත.

12. විගණකවරුන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 සහ 20 සංශෝධන අනුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තිය සමඟින් විගණකාධිපති සමාගමේ විගණකවරයා ලෙස දිගටම කටයුතු කරයි.

13. විගණකවරුන් සඳහා ගෙවීම්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා විගණකවරුන්ට ගෙවන ලද හෝ ගෙවීමට ඇති මුදල රුපියල් 2,515,079/- කි. (2020 - රුපියල් 2,869,105/-).

14. පරිත්‍යාග

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර තුළ සමාගම කිසිම පරිත්‍යාගයක් සිදුකර නොමැත.

15. විගණක කමිටුව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා විගණක කමිටුවේ සංයුතිය පහත දැක්වෙන පරිදි විය:

අධ්‍යක්ෂවරුන්ගේ නම්	
V. කනගසබාපති මහතා	- සභාපති
P.A.S.A. කුමාර මහතා	- සාමාජික
P.H.P. දෙණියාය මහතා	- සාමාජික

16. වේතන කමිටුව

වේතන කමිටුවේ සංයුතිය පහත දක්වා ඇත:

අධ්‍යක්ෂවරුන්ගේ නම්	
P.A.I. සිරිනිමල් පෙරේරා මහතා	- සභාපති
V. කනගසබාපති මහතා	- සාමාජික
ඉශාන් දන්තනාරායන මහතා	- සාමාජික

17. සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුවේ සංයුතිය පහත දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ නම්	
V. කනගසබාපති මහතා	- සභාපති
D.S. අමරසේකර මෙනවිය	- සාමාජික

LKAS 24 – අනුකූලව 'ආශ්‍රිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්' යටතේ ආශ්‍රිත පාර්ශ්වීය ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි ගනුදෙනු තිබේනම් ඒවා අධ්‍යක්ෂවරුන් විසින් අනාවරණය කර ඇති අතර, ඒවා මූල්‍ය ප්‍රකාශන වල 37 වන සටහනෙහි දක්වා ඇත.

18. ප්‍රාග්ධන වියදම්

ද්‍රව්‍යමය ප්‍රාග්ධන බැඳීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

19. දේපළ, කාර්යස්ථාන සහ උපකරණ

දේපළ, කාර්යස්ථාන සහ උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 12 වන සටහනෙහි ඇතුළත් කර ඇත.

20. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2021 දෙසැම්බර් 31 වනවිට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 10/- බැගින් වූ කොටස් 2,046,645,686 ක් නියෝජනය කරමින් රුපියල් 20,466,456,858/-ක් විය.

21. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම එහි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වන්නේය. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සකස්කර ඇති බව අධ්‍යක්ෂවරුන් සනාථ කර සිටින්නාහ. ඒ අනුව, මෙහි ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ කටයුතු සහ අවසන්වූ වර්ෂය සඳහා ලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන බවට සැහීමකට පත්වන්නාහ.

22. ව්‍යවස්ථාපිත ගෙවීම්

තම හොඳම දැනුම සහ විශ්වාසය අනුව රජයට සහ සමාගමේ සේවකයින්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් යාවත්කාලීන කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සැහීමට පත්ව සිටී.

23. පශ්චාත් ශේෂපත්‍ර සිද්ධීන්

මූල්‍ය ප්‍රකාශනවල 33 වන සටහනෙහි ඇතුළත් කර ඇති සිද්ධීන් හැරුණුවිට, ශේෂපත්‍රයේ සඳහන් දිනයට පසුව කිසිම සිදුවීමක් සිදුවී නොමැත.

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමට අදළ රැස්වීම කැඳවීමේ නිවේදනය වාර්ෂික වාර්තාවේ 54 වන පිටුවේ ඇතුළත් කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි
හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්



P.A.I. **සිරිනිමල් පෙරේරා මහතා**
සභාපති



V. **කනගසබාපති මහතා**
අධ්‍යක්ෂ



සීමාසහිත පී.ඩබ්ලිව්.කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්) සමාගම
සමාගම් ලේකම්වරු

2022 සැප්තැම්බර් 07 දින,
කොළඹදී.

විගණක කමිටුවේ වාර්තාව

විගණක කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටු ප්‍රඥප්තිය මගින් සම්පාදිත විධිවිධාන සහ නියෝග ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන කමිටුව, සමාගමේ මූල්‍ය කටයුතුවලට අදාළ සෑම කරුණක්ම පරීක්ෂා කර බැලීමත්, මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කිරීම හා නිරීක්ෂණය කිරීමත් සිදු කරයි.

විගණක කමිටුවේ කාර්යභාරය

තීරණ ගැනීම සඳහා සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට හා මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවයට අදාල මෙහෙයුම් සඳහා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධති පවත්නා බව තහවුරු කිරීම සම්බන්ධ වගකීම් ඉටු කිරීමේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන ඵලදායී අනුකමිටුවක් ලෙස විගණන කමිටුව ක්‍රියා කරයි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශනයේ විශ්වසනීයත්වය, සහ සමාගමේ අභ්‍යන්තර විගණන සහ මූල්‍ය පාලන පද්ධතියේ අවංකභාවය
- අභ්‍යන්තර විගණක වරුන්ගේ කාර්යසාධනය
- සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්ෂික ස්වාධීන විගණනය
- අභ්‍යන්තර සහ බාහිර විගණක වාර්තාවන්ගේ ස්වාධීන සමාලෝචනය සහ ඒවායේ සොයාගැනීම් සහ නිර්දේශ පිළිබඳව සලකාබැලීම
- ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට සමාගම දක්වන අනුකූලතාව
- කොළඹ කොටස් හුවමාරුව වෙත නිකුත් කිරීමට නියමිත විගණනය නොකරන ලද ත්‍රෛමාසික ගිණුම් සමාලෝචනය කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ දැඩිව පිළිපැදීම

විගණක කමිටුවේ සංයුතිය

විගණක කමිටුව විධායකනොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර එහි සංයුතිය පහත දක්වා ඇත:

V. කනගසභාපති මහතා (සභාපති) - (ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ)

P.A. සුසන්ත කුමාර මහතා - (ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ)

ප්‍රියන්ත දෙණියාය මහතා - (ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ)

V. කනගසබාපති මහතා, මහා භාණ්ඩාගාරයේ විශ්‍රාමික රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වන අතර, වසර 40 කට වැඩි කාලයක් රාජ්‍ය අංශයේ සේවය කර ඇති අතර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධීකාරකවරයා ද විය. ඔහුට හාවඩ් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර ලන්ඩනයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

ප්‍රියන්ත දෙනියාය මහතා 2000 වසරේ සිට කොළඹ මහාධිකරණයේ අපරාධ සම්බන්ධ නීතීඥවරයකු ලෙස මෙන්ම ආරක්ෂක උපදේශනය පිළිබඳ විශේෂඥයකු ලෙස කටයුතු කරයි.

P.A. සුසන්ත කුමාර මහතා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස 1991 වසරේ රාජ්‍ය සේවයට බැඳුණු P.A. සුසන්ත කුමාර මහතා 2007 වසරේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුණු අතර දැනට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණ (රාජ්‍ය පරිපාලක.) (විශේෂ) උපාධිධාරියෙකු වන අතර 2015 දී කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. සුසන්ත කුමාර මහතා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ නිලධාරියෙක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් රාජ්‍ය ගණකාධිකරණ සාමාජිකයෙකි.

විගණන කමිටු රැස්වීම්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය තුළ විගණන කමිටුව රැස්වීම් තුනක් පවත්වා ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විගණන කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පැවැත්වීමට නොහැකි විය. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, සීමාසහිත හොටෙල් ඩිවලොප්මන්ට් සමාගමේ ගණකාධිකාරී, කොළඹ හිල්ටන් හෝටලයේ සාමාන්‍යාධිකාරී සහ මූල්‍ය අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණකවරුන් වන Earnest & Young (E &Y), සහ විගණකාධිපති නියෝජිතයින් සහ කොළඹ හිල්ටන් හෝටලයේ කළමනාකාර විගණකවරුන්, විගණක කමිටුවේ ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි වූහ.

බාහිර විගණක වරුන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීමත් සමගම සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතට අනුවල විගණකාධිපතිවරයා සමාගමේ බාහිර විගණකවරයා ලෙස කටයුතු කරයි. මේ අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශය විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලදී.

අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය

සමාගමේ අභ්‍යන්තර විගණකවරුන් වන අර්නස්ට් සහ යංග් සමාගම විසින් විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලසුමේ පදනම මත හෝටලයේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර විගණනයන් සිදු කරනු ලැබේ. අභ්‍යන්තර විගණනයන් මගින් කළමනාකරණය විසින් පිහිටුවා ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවේද පිළිබඳව සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ කාර්යයන්ට වගකිවයුතු කාර්යමණ්ඩලය විසින් පාලනයන්ට අනුගතවන ප්‍රමාණයන් තීරණය කිරීම සඳහා ස්වාධීන සමාලෝචනයක් සිදුකරනු ලබයි. අභ්‍යන්තර විගණන වාර්තාවල අන්තර්ගතය සහ සොයාගැනීම් කළමනාකාරිත්වය සමග සාකච්ඡා කරන අතර, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාලෝචිත ආකාරයකින් සිදු කරනු ලැබේ. එවැනි වාර්තා විගණක කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.

කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

කාර්තුමය මූල්‍ය වාර්තා කොළඹ කොටස් වෙළඳපළට (CSE) මුදහැරීමට පෙර විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමැතිය සඳහා මණ්ඩලයට නිර්දේශ කරනු ලැබේ.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) / ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) වලට අනුගතවීම

මේ දක්වා සියලුම කාලපරිච්ඡේදයන්ට අදළ වන පරිදි සමාගම සිය මූල්‍ය ප්‍රකාශන ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

අනුකූලතා ප්‍රකාශන සමාලෝචනය

සමාගම සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල වන බවට වගබලා ගැනීම සඳහා කමිටුව විසින් අනුකූලතා ප්‍රකාශන සමාලෝචනය කරන ලදී. ඊට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට සමාගම අනුගත වීම පිළිබඳව කමිටුව සෑහීමකට පත්වන්නේය.

2021 දෙසැම්බර් 31 දිනට අවසන්වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත සමාලෝචනය කිරීම

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා වූ සමාගමට අදළ මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත බාහිර විගණකවරුන්, අභ්‍යන්තර විගණකවරුන් සහ කොළඹ හිල්ටන් හෝටලයේ කළමනාකරණ විගණකවරුන් සමග විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ප්‍රධාන මූල්‍ය නිලධාරියා විසින් විගණන කමිටුවට අවශ්‍ය පරිදි තහවුරු කිරීම් සහ ප්‍රකාශන ලබා දී ඇත. එකී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරන සමාගම් පනත මගින් අවශ්‍යවන තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි සකස් කිරීමට සහ, විගණන කමිටු සමාලෝචනය මගින් සමාලෝචනයට යටත්වන

වර්ෂයට සහ දිනයට අදළව සමාගමේ තත්වය පිළිබඳව මෙන්ම සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳව සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසන ලදී.

නිගමනය

සමාගමේ වත්කම් සහ මූල්‍ය තත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් පාලනයන් ක්‍රියාත්මක වන බවත්, විගණනය කරන ලද ගිණුම් වලින් අනාවරණය වූ ප්‍රතිඵල කිසිදු ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයන්ගෙන් තොරවන බවත් විගණන කමිටුවේ අදහස වන්නේය.

V. කනගසබාපති
සභාපති, විගණන කමිටුව

මූල්‍ය ප්‍රකාශන

විගනකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඅයිපී/එච්ඩීඑල්/6/21/එෆ්ජේ/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූලි 27

සභාපති

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි (සමාගම) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6)ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

විගනකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1. 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) සඳහන් වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය:

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021	ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, දින 140 ප්‍රමාදයක් සහිතව මූල්‍ය ප්‍රකාශන 2022 ජූලි 18 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

2.2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2.5. වෙනත් කරුණු

(අ) 2014 සිට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු රු.494,167 ක් සමාලෝචිත වර්ෂය තුල දී කපා හැර තිබුණි.

(ආ) අමුත්තන් සඳහා වූ කාමර 250 ක ප්‍රතිසංස්කරණ වැඩසටහන මූල්‍යයනය කිරීම සඳහා සහ චීන අවන්හල ඉදිකිරීමට 2021 වර්ෂයේ දී සමාගම මහජන බැංකුවෙන් රු.මිලියන 1,098.4 ක කාලීන ණය පහසුකමක් ලබාගෙන තිබුණි. ලබාගත් ණය මුදලින්, රු.මිලියන 553 ක් පමණක් ඉහත ප්‍රතිසංස්කරණ අරමුණ වෙනුවෙන් වියදම් කර තිබුණු අතර රු.මිලියන 445.4 ක් අනෙකුත් මෙහෙයුම් වියදම්, හිල්ටන් කොළඹ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා, බැංකු අයිරා පහසුකම පියවීම සහ ලබාගත් කාලීන ණය හා බැංකු අයිරා පහසුකම් දෙකට අදාල පොලී ගෙවීම සඳහා වැය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී සමාගමේ සමුච්චිත අලාභය රු. 7,821,569,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට එය රු. 8,808,317,000 ක් දක්වා වර්ධනය වී තිබුණි. එයට සමානව, සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී සමාගමේ අවාසිදායක කාරක ප්‍රාග්ධනය රු. 997,068,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට එය රු. 1,059,237,000 ක් දක්වා වර්ධනය වී තිබුණි. 2011 අංක 43 දරන ඌන කාර්යසාධන ව්‍යාපාර හෝ ඌන උපයෝජිත වත්කම් පනතේ විධිවිධාන ප්‍රකාරව එච්ඩීඑල් හි සියලුම කොටස් භාණ්ඩාගාරයේ ලේකම් සතු වුවද, පවරා ගැනීමෙන් වසර 10 න් පසුව ද, කිසිදු ප්‍රතිලාභයක් කොටස්හිමියා වෙත ලබා දී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2018 සිට 2021 දක්වා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

විස්තරය	2021	2020	2019	2018
	එච්ඩීඑල්	එච්ඩීඑල්	එච්ඩීඑල්	එච්ඩීඑල්
දළ ලාභ අනුපාතය %	22	25	51	51
ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය %	(83)	(81)	(11)	(4)
ආදායම් වියදම් අනුපාතය %	97	106	59	56
ජංගම අනුපාතය	0.47	0.34	0.94	0.79

2018 සිට 2021 දක්වා සමාගමේ දළ ලාභය සියයට 51 සිට සියයට 22 දක්වා අඛණ්ඩව අඩු වී තිබුණු අතර සැලකිල්ලට භාජනය කරන එකී කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අලාභ අනුපාතය සියයට 4 සිට සියයට 80 දක්වා වැඩි වී තිබුණි. ආදායමට සාපේක්ෂව වියදම ද සියයට 56 සිට සියයට 97 දක්වා වැඩි වී තිබුණි. සමාගමේ අවාසිදායක කාරක ප්‍රාග්ධනය නියෝජනය කරමින් එයට සමගාමීව 2018 දී ජංගම අනුපාතය 0.79 ක් සහ 2021 දී 0.47 ක් විය.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා	සටහන්	මාස 12 31.12.2021 රු. '000	මාස 12 31.12.2020 රු. '000
ආදායම	05	**1,178,381**	1,081,135
විකුණුම් පිරිවැය		**(922,695)**	(811,092)
දළ ලාභය		**255,686**	270,043
ආයෝජන ආදායම	06	**11,222**	10,873
වෙනත් ලාභ හා අලාභ	07	**31,191**	25,391
පරිපාලන වියදම්		**(585,498)**	(591,036)
වෙනත් වියදම්		**(167,921)**	(171,603)
මෙහෙයුම් ලාභය		**(455,319)**	(456,330)
ක්ෂය කිරීම		**(386,618)**	(378,443)
මූල්‍ය පිරිවැය	08	**(134,477)**	(42,569)
බදුකරණයට පෙර ලාභය/(අලාභය)	09	**(976,414)**	(877,343)
ආදායම් බදු වියදම	10	**19,190**	(40,764)
කාල පරිච්ඡේදය සඳහා බදුකරණයට පසු ලාභය/(අලාභය)		**(957,226)**	(918,107)
වෙනත් විස්තීර්ණ ආදායම්			
සේවක ප්‍රතිලාභ බැරකම් මත ආයුගණක ලාභය/(අලාභය)		**22,630**	(8,088)
කාල පරිච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ ආදායම/(වියදම)		**(934,596)**	(926,194)
කොටසකට ඉපැයීම - මූලික (රු.)	11	**(0.46)**	(0.45)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට	සටහන්	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	12	**8,722,182**	8,486,249
කල් බදු ඉඩම - ප්‍රධාන දේපළ	13	**6,337,966**	6,421,326
නොනිමි ප්‍රාග්ධන කටයුතු		**766,764**	865,477
මුළු ජංගම නොවන වත්කම්		**15,826,912**	15,773,052
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	14	**53,034**	47,841
අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	15	**74,740**	27,813
සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්	16	**2,242**	10,489
වෙනත් වත්කම්	17	**578,988**	237,759
ජංගම මූල්‍ය වත්කම්	18	**110,111**	150,970
මුදල් හා බැංකු ශේෂ	19	**122,354**	47,106
මුළු ජංගම වත්කම්		**941,469**	521,978
මුළු වත්කම්		**16,768,381**	16,295,030
ස්කන්ධය හා බැරකම්			
කොටස් හිමියන්ගේ ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	20	**20,466,456**	20,466,456
ප්‍රත්‍යාගණන අතිරික්තය		**1,452,978**	1,452,978
සංචිත	21	**53,801**	1,649
සමුච්චිත අලාභය		**(8,808,317)**	(7,821,569)
මුළු ස්කන්ධය		**13,164,918**	14,099,514
ජංගම නොවන බැරකම්			
පොලී සහිත ණය දීම් හා ණය ගැනීම්	22	**1,098,372**	72,156
විශ්‍රාම ප්‍රතිලාභ බැරකම්	23	**97,982**	148,198
විලම්බිත බදු බැරකම	24	**396,138**	433,198
භාවිතය සඳහා ඇති අයිතිය - කල් බදු ඉඩම් බැරකම	13	**10,264**	22,918
මුළු ජංගම නොවන බැරකම්		**1,602,756**	676,470
ජංගම බැරකම්			
ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල්	25	**418,936**	298,335
සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල්	26	**26,475**	10,080
ගිවිසුම් බැරකම්	27	**158,114**	59,892
පොලී සහිත ණය දීම් හා ණය ගැනීම්	22	**16,600**	178,479
රඳවා ගත් ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය		**48,252**	26,220
බැංකු අයිරාව		**1,332,328**	946,040
මුළු ජංගම බැරකම්		**2,000,706**	1,519,046
මුළු බැරකම්		**3,603,463**	2,195,516
මුළු ස්කන්ධය හා බැරකම්		**16,768,381**	16,295,030
කොටසකට ශුද්ධ වත්කම් - (රු.)	28	**6.43**	6.89

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 7 දරන සමාගම් පණතේ අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇති බව මම සහතික කරමි.

ජූඩ් වික්‍රමරත්න
මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2022 ජූනි 29 දින අත්සන් තබන ලදි.

V. කනගසභාපති
අධ්‍යක්ෂ

P.A.I. සිරිනිමල් පෙරේරා
සභාපති

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි.

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන අතිරික්තය	ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිස්ථාපන සංචිත	සමුච්චිත අලාභය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2020 ජනවාරි 01 දිනට ශේෂය	**20,466,456**	**1,452,978**	**43,864**	**(6,937,589)**	**15,025,710**
මාස 12 කාල පරිච්ඡේදය සඳහා ලාභය/(අලාභය)	-	-	-	(918,107)	(918,107)
සේවක ප්‍රතිලාභ බැරකම් මත ආයුගණක ලාභය/(අලාභය), ශුද්ධ බදු අලාභය	-	-	-	(8,088)	(8,088)
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිස්ථාපනය	-	-	(63,792)	63,792	-
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතය ස්ථාන මාරු කිරීම්	-	-	21,577	(21,577)	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,466,456**	**1,452,978**	**1,649**	**(7,821,569)**	**14,099,515**
මාස 12 කාල පරිච්ඡේදය සඳහා ලාභය/(අලාභය)	-	-	-	(957,226)	(957,226)
සේවක ප්‍රතිලාභ බැරකම් මත ආයුගණක ලාභය/(අලාභය), ශුද්ධ බදු අලාභය	-	-	-	22,630	22,630
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිස්ථාපනය	-	-	(16,477)	16,477	-
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතය ස්ථාන මාරු කිරීම්	-	-	68,629	(68,629)	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,466,456**	**1,452,978**	**53,801**	**(8,808,317)**	**13,164,918**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
බදුකරණයට පෙර ලාභය	**(976,414)**	(877,343)
ගැළපීම		
ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය	**380,418**	363,063
ණය ගැතියන්ගේ අපහයනය වෙනස්කම්	**(4,457)**	6,058
ඉඩම් බදු භාවිතා කිරීමේ අයිතියේ ශුද්ධ වෙනස්කම්	**6,200**	15,380
නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	**5,991**	23,415
කැඩීම් බිඳීම් සඳහා ප්‍රතිපාදන	**2,094**	(7,786)
පොලී වියදම්	**134,476**	42,569
දේපළ, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය	**(12,560)**	(2,317)
අනුපලබ්ධි විනිමය ලාභය	**358**	(113)
පොලී ආදායම	**(11,222)**	(10,873)
විවිධ ආදායම් වලට ගැලපීම්	**-**	(8,493)
කාර්ය ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	**(475,116)**	(456,441)
භාණ්ඩ තොග (වැඩි වීම)/අඩු වීම	**(5,193)**	(86)
අය විය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම	**(42,470)**	129,771
සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් වැඩි වීම/අඩු වීම	**24,642**	(22,506)
වෙනත් වත්කම් (වැඩි වීම)/අඩු වීම	**(11,703)**	3,115
ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල් වැඩි වීම/ (අඩු වීම)	**86,776**	(51,065)
ගිවිසුම් බැරකම් වැඩි වීම/(අඩු වීම)	**98,222**	(39,545)
මෙහෙයුම්වලින් ජනනය කර ගත් මුදල	**(324,841)**	(436,757)
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම	**(33,577)**	(17,855)
මෙහෙයුම් කටයුතුවලින් ජනනය කර ගත් ශුද්ධ මුදල	**(358,418)**	(454,612)
ආයෝජන කටයුතු නිසා හටගත් මූල්‍ය ප්‍රවාහයන්		
දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම	**(999)**	(64,762)
නොනිමි ප්‍රාග්ධන කටයුතු සඳහා ආයෝජනය	**(796,973)**	(206,755)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබුණු මුදල	**31,029**	10,111
ලැබුණු පොලී ආදායම	**11,222**	10,873
ආයෝජන කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල	**(755,721)**	(250,533)
මූල්‍ය කටයුතු නිසා හටගත් මූල්‍ය ප්‍රවාහයන්		
පොලී සහිත ණය දීම් සහ ගැනීම් නැවත ගෙවීම්	**(234,036)**	(24,364)
පොලී සහිත නව ණය දීම් හා ණය ගැනීම්	**1,098,372**	25,000
මූල්‍ය පිරිවැය	**(101,739)**	(40,616)
මූල්‍යකරණ කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල	**762,598**	(39,980)
මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ වැඩි වීම/(අඩු වීම)	**(351,541)**	(745,124)
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන වත්කම් (30 සටහන)	**(748,323)**	(2,841)
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන වත්කම්	**(1,099,864)**	(747,965)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 38 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා

1. සමායතනික තොරතුරු

1.1. සාමාන්‍ය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත හා ලියාපදිංචි සීමිත බැරකම් සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් හිල්ටන් කළම්බු හෝටලයේ හිමිකාරත්වය දරන අතර සත්කාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටියි.

1.3. මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 ජූනි 29 දින බලය පවරන ලදි.

2. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා පදනම

2.1. අනුකූලතා ප්‍රකාශය

සමාගමේ මූල්‍ය ප්‍රකාශ (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සාමාන්‍යයෙන් SLFRS යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පණතේ අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

2.2. තක්සේරුව සඳහා පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් පහත දැක්වෙන වැදගත් අයිතමයන් හැර සෙසු මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත:

- දේපළ, පිරියත හා උපකරණ පසුව සාධාරණ අගය අනුව තක්සේරු කරනු ලැබේ.
- නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම පිළිබඳ බැරකම නිර්වාචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලැබේ.

2.3. ක්‍රියාකාරී ව්‍යවහාර මුදල සහ ප්‍රදර්ශක ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති අතර එය සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල මෙන් ම ප්‍රදර්ශක ව්‍යවහාර මුදල ද වේ. අන්‍යාකාරයකින් ප්‍රකාශ කර නැත්නම් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති සියලු ම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

2.4. තුලනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ LKAS 01 ක්‍රමවේදයට අනුකූලව සමාගම විසින් හැම විට ම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගනු ලැබ ඇත.

2.5. වැදගත්කම සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ LKAS 01 ක්‍රමවේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශ තුළ දී සෑම වැදගත් සමාන අයිතම කාණ්ඩයක් ම වෙන වෙන ම දක්වා ඇත. වැදගත් නම් ස්වභාවය හෝ කාර්යයන් අනුව ගත් විට එකිනෙකට වෙනස් අයිතමයන් ද වෙන වෙන ම දක්වා ඇත.

හඳුනා ගත් අගයන් හිලව් කිරීමට නීතිමය වශයෙන් බලාත්මක කරන ලද අයිතියක් ඇති සහ ශුද්ධ පදනමින් පියවා දැමීමේ හෝ වත්කම් උපලබ්ධි කොට ඊට සමගාමීව බැරකම පියවා දැමීමේ අපේක්ෂාවක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ශුද්ධ අගය වාර්තා කර ඇත. යම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර ලබා දී නැත් නම් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දී නිශ්චිත වශයෙන් අනාවරණය කෙරෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් හා වියදම් හිලව් කර නැත.

3. ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගම හැම විට ම ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් 3.1 සටහන තුළ ප්‍රකාශ කර ඇති වෙනස් වීම් හැරුණු විට ඒවා පූර්ව වර්ෂයේ දී යොදා ගත් ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

තුලනාත්මක තොරතුරු

වඩාත් මැනවින් ඉදිරිපත් කළ යුතු අවස්ථාවල සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමග සැසඳෙන පරිදි පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇත.

3.1. ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනාවරණය කිරීම් සම්බන්ධයෙන් සිදු වූ වෙනස් වීම්

නව හා සංශෝධන ප්‍රමිතීන් හා අර්ථ නිරූපණ SLFRS 16 - කල් බදු දීම්

SLFRS 16 තනි බදු ගැනුම්කරු ගිණුම්කරණ ආකෘතියක් සම්පාදනය කරන අතර කල් බදු කාල සීමාව මාස 12 හෝ ඊට අඩු නොවේ නම් හෝ බදු දීමනාකරුගේ ගිණුම්කරණ භාවිතය වර්තමාන භාවිතයට සමාන වුව ද පාදක වත්කමට තිබෙන්නේ අඩු වටිනාකමක් නම් කල් බදුවල දී සියලු කල් බදු සම්බන්ධයෙන් වත්කම් හා බැරකම් හඳුනා ගැනීමේ අවශ්‍යතාව මතු කරයි. මෙමගින් LKAS 17 කල් බදු, යම් සැලසුමක් කල් බද්දකින් සමන්විත වන්නේ දැයි තීරණය කරන IFRIC 4, SIC 15 කල් බදු - දිරි ගැන්වීම් ක්‍රියාවට නැංවීම සහ කල් බද්දක නෛතික ස්වරූපය සහිත ගනුදෙනුවල ස්ථාවරත්වය තක්සේරු කරන SIC 27 අවලංගු වේ. ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා 'ගිවිසුම්' කරණ කොට ගෙන SLFRS 15 'ආදායම' අදාළ වන ආයතනවලට කල් තියා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.

2019 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද සඳහා SLFRS 16 බලපවත්වයි.

2019 ජනවාරි 1 දින සිට බලපවත්වන පරිදි SLFRS 16 යොදා ගන්නා විට ලන්දේසි රෝහලේ ඉකොයි ටෙයි අවන් හලේ සහ හිල්ටන් කළම්බු හෝටලයේ නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) රථ ගාලේ ඉඩම් කල් බදු අයිතිවාසිකම්වලට බලපෑමක් සිදු වනු ඇත.

3.2. වැදගත් ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අනාගතය සම්බන්ධයෙන් ඇතැම් විවක්ෂණ ගිණුම්කරණ උපකල්පන යොදා ගැනීමට සිදු වේ. එපමණක් නොව වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ ආදායම, වියදම, වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාගත අගයන්ට සහ අසම්භාව්‍ය බැරකම් අනාවරණයට බලපාන තීන්දු ගැනීමට, ඇස්තමේන්තු සිදු කිරීමට සහ උපකල්පනවලට එළඹීමට ද එහි දී කළමනාකාරිත්වයට සිදු වේ. කෙසේ වුව ද මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිත භාවය හේතුවෙන් අනාගත කාල පරිච්ඡේදවල දී වත්කමේ හෝ බැරකමේ ධාරණ අගයෙහි සැලකිය යුතු ගැළපීම් කිරීමට සිදු විය හැකි ය. එම නිසා සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල මෙම තීරණ හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකි ය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකාරිත්වය පහත දැක්වෙන තීන්දු ගැනීම්, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනවලට එළඹීම් සිදු කර ඇති අතර මූල්‍ය ප්‍රකාශවල දී හඳුනා ගැනෙන අගයන්ට වඩාත් ම සැලකිය යුතු බලපෑම ඇති වී තිබෙන්නේ ඒවායිනි:

a) බදුකරණය

ආදායම් බදුවලට සහ අගය එකතු කළ බදුකරණය (වැට්) හා ජාතිය ගොඩ නැගීමේ බද්ද ඇතුළු වෙනත් බදුවලට සමාගම යටත් වේ. මූල්‍ය ප්‍රකාශවල දී SLFRS ප්‍රමිතීන් යොදා ගැනීම පිළිබඳව සලකා බැලීම සම්බන්ධයෙන් බදු මාර්ගෝපදේශ නිකුත් කෙරෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු වෙනුවෙන් වෙන් කළ යුතු මුළු ප්‍රතිපාදනය සහ බදු පැනවීම හේතු කොට ගෙන බදු ගෙවීමට සිදු වන ලාභය නිශ්චය කිරීම සඳහා වැදගත් තීන්දු ගැනීමට සිදු විය. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලද කාල වකවානුවේ දී බදු නීතිවල අදාළත්වය පිළිබඳ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් අවිනිශ්චිතතා පැවතිණ.

අතිරේක බදු ගෙවීමට සිදු වේ ද යන්න පිළිබඳ ඇස්තමේන්තු පදනම් කර ගෙන සමාගම විසින් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදුවලට අදාළව වත්කම් හා බැරකම් හඳුනා ගනු ලැබිණ. අවසන් බදු ප්‍රතිඵලය මුල දී වාර්තාගත අගයන්ගෙන් වෙනස් වන අවස්ථාවල දී එම වෙනස හේතු කොට ගෙන තීරණය ගන්නා කාල පරිච්ඡේදයට අදාළ ආදායමට සහ විලම්බිත හා වෙනත් බදු අගයන්ට බලපෑමක් ඇති වනු ඇත.

b) දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

සමාගමේ දේපළ, පිරියත හා උපකරණ ඒවායේ සාධාරණ අගය අනුව පිළිබිඹු කරනු ලැබේ. සමාන වත්කම්වල වර්තමාන වෙළඳ පොළ මිල ගණන් ලබා ගත හැකි අවස්ථාවල දී මෙම වත්කම්වල සාධාරණ අගයන් ඇස්තමේන්තු කිරීමේ දී එවැනි සාක්ෂි සලකා බලනු ලැබේ. එවැනි තොරතුරු නොමැති අවස්ථාවල දී සමාගම ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවෙකුගේ සහාය ඇතිව යුක්ති සහගත සාධාරණ අගයන් පිළිබඳ ඇස්තමේන්තු පදනම් කර ගෙන සාධාරණ අගයන් ලෙස ආරෝපණය කළ හැකි අගයන් තීරණය කරයි.

c) දේපළ, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය

සමාගම සෑම වාර්තාකරණ දිනයක දී ම ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ජීව කාලයන් සහ වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සමාලෝචනය කරයි. කළමනාකාරිත්වය විසින් තීන්දු ගනු ලබන්නේ මෙම අගයන්, අනුපාතිකයන් හා ක්‍රමවේදයන් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය තුළ දී බැවින් ඒවා අවිනිශ්චිතතාවට බඳුන් වේ.

d) අඛණ්ඩභාවය

සමාගම ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදු කර ඇති අතර පෙරදැකිය හැකි අනාගතයේ දී සිය ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතුව තිබෙන බවට ඔවුහු සෑහීමකට පත්ව සිටිති. එපමණක් නොව ව්‍යාපාරයක් ලෙස සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳව යම් සැකයක් ජනිත කරවන කිසිදු සැලකිය යුතු අවිනිශ්චිතතාවක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නොදන්නා අතර සමාගමේ කටයුතු ඇවර කිරීමේ හෝ මෙහෙයුම් කටයුතු නතර කිරීමේ අපේක්ෂාවක් ඔවුන්ට නැත. එම නිසා තව දුරටත් ව්‍යාපාරයේ අඛණ්ඩතාව පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

e) මූල්‍ය වත්කම් මත ඌනකරණ අලාභ

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කළ යුතු ඌනකරණ අලාභයක් සිදුව ඇත් දැයි නිශ්චය කිරීම සඳහා වාස්තවික සාක්ෂි පවතී දැයි සමාගම ඒ ඒ වාර්තාකරණ දිනයේ දී හෝ වඩාත් නිරන්තරව තක්සේරු කර බලයි.

f) නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය නිශ්චය කරනු ලැබේ. ආයුගණක තක්සේරුවල දී එළඹෙන විවිධ උපකල්පනයන් අනාගතයේ දී සැබවින් සිදු වන වර්ධනයන්ට වඩා වෙනස් විය හැකි ය. වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වැඩි වීම්, මරණ අනුපාතික යනාදිය තීරණය කිරීම මෙම උපකල්පන අතරට ඇතුළත් වේ. තක්සේරුවේ සංකීර්ණතාව, පදනම් කර ගන්නා උපකල්පන සහ ඒවායේ දීර්ඝ කාලීන ස්වභාවය නිසා මෙම උපකල්පනවල සිදු වන වෙනස් වීම් හේතු කොට ගෙන නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම් බෙහෙවින් වෙනස් වේ. සියලු ම උපකල්පන සෑම වාර්තාකරණ දිනයක දී ම සමාලෝචනය කරනු ලැබේ.

යෝග්‍ය වට්ටම් අනුපාතිකය තීරණය කිරීමේ දී කළමනාකාරිත්වය නිර්වාචිත ප්‍රතිලාභ බැඳීමේ අපේක්ෂිත කාල පරිච්ඡේදයට අනුරූප බහිර්නිවේශිත කල් පිරීම් සහිත ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල ආයෝජනය කිරීමෙන් උපයා ගත හැකි ආදායම සලකා බලයි. මරණ අනුපාතිකය ගණනය කරනු ලබන්නේ ප්‍රසිද්ධ කර ඇති මරණ ප්‍රමාණ දැක්වෙන වගු පදනම් කර ගනිමිනි. අනාගත වැටුප් වැඩි වීම් ගණනය කරනු ලබන්නේ අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාතික සහ සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධන අනුපාතික පදනම් කර ගනිමිනි.

4. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

ස්වකීය මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සමාගම විසින් අදාළ කර ගැනෙන විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති අතරට පහත දැක්වෙන ප්‍රතිපත්ති ඇතුළත් වේ. අන්‍යාකාරයකින් දක්වා නැත් නම් මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලු කාල පරිච්ඡේද සඳහා හැම විට ම පහත විස්තර කෙරෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගනු ලැබ ඇත.

4.1. ආදායම් හඳුනා ගැනීම

(i) ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන ආදායම

හෝටලය සත්කාරක සේවාවන් සහ විවේකය ආශ්‍රිත සේවාවන් සම්පාදනය කිරීමේ ව්‍යාපාරයක නිරතව සිටියි.

භාණ්ඩ හා සේවාවන් සඳහා හුවමාරු වශයෙන් හිමි විය යුතු යැයි හෝටලය අපේක්ෂා කරන මුදල පිළිබිඹු වන අගයක් මත භාණ්ඩ හෝ සේවාවන් පිළිබඳ පාලනය ගනුදෙනුකරුවා වෙත පැවරෙන විට ගනුදෙනුකරුවන් සමග ඇති කර ගන්නා ගිවිසුම්වලින් ලැබෙන ආදායම හඳුනා ගනු ලැබේ.

ගනුදෙනුකරුවා වෙත පැවරීමට පෙර භාණ්ඩ හෝ සේවාවන්හි පාලනය නිසි පරිදි සිදු වන නිසා සිය ආදායම් විධිවිධානවල මූලධර්මය එය විය යුතු බවට හෝටලය පොදු නිගමනයකට එළඹී ඇත.

SLFRS 15 අදාළ කර ගැනීමෙන් ඇති වන බලපෑම කළමනාකාරිත්වය විසින් පහත අනාවරණය කෙරෙන පරිදි තක්සේරු කරනු ලැබ ඇත:

(a) සේවා සම්පාදනය

යම් කාල පරිච්ඡේදයකට අදාළ සේවා සම්පාදන කාර්ය සාධන බැඳීම් සැපිරෙන විට සේවා සම්පාදනයෙන් ලැබෙන ආදායම හඳුනා ගනු ලැබේ.

වාසය කරන කාමර ගණන අනුව කාමර ආදායම දෛනික පදනමකින් හඳුනා ගනු ලබන අතර ආහාර පාන ආදායම ඒවා අලෙවි කරන මොහොතේ දී ම (එනම් කාර්ය සාධන බැඳීම සැපිරෙන අවස්ථාවේ දී ම) ගණනය කරනු ලැබේ.

(ii) පොලිය

සියලු මූල්‍ය සාධන පත්‍ර ක්‍රමක්ෂය පිරිවැය සහ අලෙවිය සඳහා පවත්නා බවට වර්ග කෙරෙන පොළී සහිත මූල්‍ය වත්කම් අනුව තක්සේරු කිරීම සඳහා පොළී ආදායම හෝ වියදම සඵල පොළී අනුපාතිකය (EIR) යොදා ගනිමින් වාර්තාගත කෙරෙන අතර මූල්‍ය සාධන පත්‍රයේ අපේක්ෂිත ජීව කාලය යොදා ගනිමින් හෝ අදාළ අවස්ථාවල දී වඩාත් කෙටි කාල පරිච්ඡේදයක් සඳහා මූල්‍ය වත්කමේ හෝ බැරකමේ ශුද්ධ ධාරණ අගය යොදා ගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නිශ්චිත වශයෙන් වට්ටම් කරනු ලබන්නේ සඵල පොළී අනුපාතිකය පදනම් කර ගනිමිනි. මූල්‍ය නොවන වත්කම්වලින් ලැබෙන පොළී ආදායම ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ (FF&E) සංචිතයට ඇතුළත් කරනු ලැබේ. අනෙක් සියලු පොළී ආදායම් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා

(iii) කඩ කුලී ආදායම

කඩ කුලී ආදායම උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

පිරිවැටුම පදනම් කර ගත් බදු

පිරිවැටුම පදනම් කර ගත් බදු අතරට අගය එකතු කළ බද්ද, ජාතිය ගොඩ නැගීමේ බද්ද සහ සංචාරක කර්මාන්ත සංවර්ධන බද්ද ඇතුළත් වේ. හෝටලය අදාළ ආයතනික නීතිරීතිවලට අනුකූලව එවැනි බදු ගෙවයි.

වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

4.2. වියදම් හඳුනා ගැනීම

දැරූ පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමවල ඉපැයීම් අතර ඇති සෘජු සම්බන්ධය පදනම් කර ගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දී වියදම් හඳුනා ගනු ලැබේ. ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාම සහ දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා දැරූ සියලු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කර ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ කාර්ය සාධන මූලිකාංග ප්‍රමාණවත් ලෙස නිරූපණය වන්නේ ය යන පදනම මත "වියදම් ශ්‍රිතය" විධික්‍රමය උපයෝග කර ගෙන ඇත.

ආදායම් බදු වියදම ප්‍රවර්තන හා විලම්බිත බදුවලින් සමන්විත වේ. ආදායම් බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දී හඳුනා ගනු ලැබේ.

4.3. බදුකරණය

4.3.1. ප්‍රවර්තන බද්ද

ප්‍රවර්තන බදු වත්කම් හා බැරකම් සමන්විත වන්නේ ප්‍රවර්තන වර්ෂයට අදාළව සහ පූර්ව වර්ෂ සඳහා ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් කර ඇති කවර හෝ ගැළපීමකට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අය කර ගැනීමට හෝ ඔහුට ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණවලිනි. වාර්තා කරන දිනට පනවා ඇති හෝ සාරාංශකුලව පනවා ඇති බදු අනුපාතික හා බදු නීති යොදා ගෙන මුදල් ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

4.3.2. විලම්බිත බද්ද

වාර්තාකරණ කාල පරිච්ඡේදයේ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ අගයන් අතර පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳ බැරකම් විධික්‍රමය යොදා ගනිමින් මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා විලම්බිත බදු හඳුනා ගනු ලැබේ.

අඩු කළ හැකි සියලු වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගනු ලැබේ. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලින් සහ අභාවිත බදු බැර කිරීම් හා අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාමෙන් ප්‍රයෝජන ගත හැකි වන පරිදි බදු අය කළ හැකි ලාභ පැවතීමට ඇති සම්භාවිතාවේ ප්‍රමාණයට පමණක් අභාවිත බදු බැර කිරීම් හා අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සිදු කරනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනයක දී ම සමාලෝචනය කෙරෙන අතර සම්පූර්ණ විලම්බිත බදු වත්කම හෝ එහි යම් කොටසක් ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් තව දුරටත් පැවතීමේ සම්භාවිතාවක් නොමැති වන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයක දී ම නැවත තක්සේරු කෙරෙන අතර ඉදිරියේ දී බදු අය කළ හැකි ලාභ මගින් විලම්බිත බදු වත්කම නැවත අය කර ගැනීමට ඉඩ සැලසෙන සම්භාවිතාවේ ප්‍රමාණයට හඳුනා ගනු ලැබේ.

වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ තදනන්තරව පනවනු ලබන බදු අනුපාතික හා බදු නීති පදනම් කර ගෙන සහ වත්කම් උපලබ්ධි වන විට හෝ බැරකම් පියවෙන විට වසර තුළ දී අදාළ කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතිකය අනුව විලම්බිත බදු වත්කම් හා බැරකම් තක්සේරු කරනු ලැබේ.

4.4. මූල්‍ය නොවන වත්කම්

4.4.1. දේපළ, පිරියත හා උපකරණ

a) හඳුනා ගැනීම හා තක්සේරු කිරීම

ආරම්භක හඳුනා ගැනීමේ දී

වත්කම ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ වත්කමේ පිරිවැය LKAS 16 - දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියට අනුකූලව තක්සේරු කළ හැකි වීමේ සම්භාවිතාව අනුව දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගනු ලැබේ. සමුච්චිත ක්ෂය කිරීමක් හෝ සමුච්චිත ඌනකරණ අලාභයක් සිදු වී ඇත් නම් ආරම්භයේ දී දේපළ හා උපකරණ තක්සේරු කරනු ලබන්නේ එම ක්ෂය කිරීම සහ අලාභය නිසා දැරීමට සිදු වූ ශුද්ධ පිරිවැය අනුව ය. හඳුනා ගැනීමේ නිර්ණායක සැපිරෙන්නේ නම් එවැනි පිරිවැය අතරට ඇතුළත් වන්නේ ප්‍රතිස්ථාපනය කළ දේපළ, පිරියත හා උපකරණ කොටස් සඳහා දැරූ පිරිවැය සහ දීර්ඝ කාලීන ඉදි කිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීම නිසා දැරූ පිරිවැය යි. කාල ප්‍රාන්තරයෙන් ප්‍රාන්තරයට දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු තරමේ කොටස් ප්‍රතිස්ථාපනය කිරීමට සිදු වන විට සමාගම එවැනි කොටස් විශේෂිත ප්‍රයෝජනවත් ජීව කාලයන් සහිත තනි වත්කම් ලෙස හඳුනා ගන්නා අතර ඒ අනුව ඒවායේ අගය ක්ෂය කරයි. එමෙන් ම විශාල ප්‍රතිසංස්කරණයක් සිදු කෙරෙන විට හඳුනා ගැනීමේ නිර්ණායක සැපිරෙන්නේ නම් එහි පිරිවැය දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගය තුළ දී ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගනු ලැබේ. අනෙක් සියලු අලුත්වැඩියා හා නඩත්තු පිරිවැයවල් ඒවා දරනු ලබන පරිදි ලාභය හෝ අලාභය තුළ දී හඳුනා ගනු ලැබේ.

b) තදනන්තර තක්සේරුවේ දී

සියලු දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය කිරීම අඩු කර සාධාරණ අගය මත තදනන්තරව තක්සේරු කෙරෙන අතර එවැනි තක්සේරු සිදු කරනු ලබන්නේ බාහිර ස්වාධීන තක්සේරුකරුවන් විසිනි. ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් බෙහෙවින් වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් නිරන්තරතාවකින් යුතුව තක්සේරු සිදු කරනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායම්වල දී ප්‍රත්‍යාගණන අතිරික්තයක් හඳුනා ගැනෙන අතර ස්කන්ධයේ දී එය ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. කෙසේ වුව ද ආදායම් ප්‍රකාශයේ දී එම වත්කමට අදාළව කලින් හඳුනා ගන්නා ලද ප්‍රත්‍යාගණන හිඟයක් එය විසින් ප්‍රතිවර්තනය කෙරෙන තාක් දුරට ආදායම් ප්‍රකාශයේ දී වැඩි වීමක් හඳුනා ගනු ලැබේ. වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ දී එම වත්කම සම්බන්ධයෙන් හඳුනා ගැනෙන පවත්නා අතිරික්තයක් එය විසින් හිලව් කෙරෙන තාක් දුරට මිස ප්‍රත්‍යාගණන හිඟයක් හඳුනා ගනු ලබන්නේ ලාභය හෝ අලාභය තුළ දී ය. බැහැර කිරීම හෝ හඳුනා ගැනීම ඉවත් කිරීම මත එම වත්කමට අදාළ යම් ප්‍රත්‍යාගණන සංචිතයක් විකුණා දැමෙන්නේ නම් එම සංචිතය රඳවා ගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

වත්කම්වල ප්‍රත්‍යාගණනය කළ ධාරණ අගය මත පදනම්ව කරනු ලබන ක්ෂය කිරීම සහ වත්කම්වල මූලික පිරිවැය මත පදනම්ව කරනු ලබන ක්ෂය කිරීම අතර වෙනස අත් කර ගැනීම සඳහා වාර්ෂික පදනමකින් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවා ගත් ඉපැයුම්වලට මාරු කිරීමක් සිදු කරනු ලැබේ.

c) තදනන්තර පිරිවැය

ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාම පිණිස හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ශක්තිය වර්ධනය කිරීම පිණිස ස්ථාවර ස්වභාවයේ වත්කම් අත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා තදනන්තරව දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකෙන අතර එවැනි වියදම් වත්කමේ ධාරණ අගය තුළ දී හඳුනා ගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල දෛනික සේවාකරණය ආශ්‍රිත පිරිවැයවල් ඒවා දරනු ලබන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දී හඳුනා ගනු ලැබේ.

d) ක්ෂය කිරීම

දේපළේ සහ උපකරණයේ පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයන් අනුව ඒවායේ ශේෂ අගයන් දක්වා අඩු කිරීම සඳහා සරල රේඛීය ක්‍රමය යොදා ගනිමින් ක්ෂය කිරීම ගණනය කරනු ලැබේ. මිල දී ගත් දින සිට බැහැර කරනු ලබන දින දක්වා ප්‍රමාණානුකූල පදනම මත ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයන් මත පදනම්ව ක්ෂය කිරීම් සිදු කරනු ලබන අනුපාතික පහත දැක්වේ:

වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	1.82
පිරියත හා යන්ත්‍රෝපකරණ	7.5
ශීතකරණ හා මුළුතැන්ගේ උපකරණ	7.5
පරිගණක හා රූපවාහිනී	20
මෝටර් රථවාහන	25
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ	10
මෙහෙයුම් උපකරණ	33

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී ම වත්කමේ ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීව කාලය සහ ක්ෂය කිරීමේ විධික්‍රමය සමාලෝචනය කර අවශ්‍ය නම් ගැළපීම් සිදු කරනු ලැබේ.

හඳුනා ගැනීම ඉවත් කිරීම

දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම මත හෝ භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකෙරෙන විට ඒවා හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. වත්කම හඳුනා ගැනීම ඉවත් කිරීම නිසා ඇති වන යම් ලාභයක් හෝ අලාභයක් වේ නම් (ශුද්ධ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් සහ වත්කමේ ධාරණ අගය අතර පවත්නා වෙනස ලෙස ගණනය කරනු ලැබේ) වත්කම හඳුනා ගැනීම ඉවත් කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ 'වෙනත් මෙහෙයුම් ආදායම්' යටතේ හඳුනා ගනු ලැබේ.

4.4.2. මූල්‍ය නොවන වත්කම් ඌනකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයක දී ම යම් වත්කමක් ඌනකරණය විය හැකි යම් සංඥාවක් වේ දැයි තක්සේරු කරනු ලැබේ. එවැනි යම් සංඥාවක් වේ නම් හෝ යම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික ඌනකරණ පරීක්ෂාවක් සිදු කළ යුතු වේ නම් සමාගම විසින් එම වත්කම ආපසු ලබා ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. යම් වත්කමක් අනෙක් වත්කම් හෝ වත්කම් කට්ටලවලින් බොහෝ දුරට ස්වාධීනව මුදල් ඇතුළට ගැලීම් ජනනය නොකරන්නේ නම් තනි වත්කමක් ලෙස නිශ්චය කළ විට එම වත්කමේ හෝ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ අගයෙන් එය අලෙවි කිරීම සඳහා දැරිය යුතු පිරිවැය සහ එහි භාවිතයේ දී වටිනාකම අඩු කළ කල්හි එම වත්කම ආපසු ලබා ගත හැකි අගය වැඩි වේ. වත්කමක ධාරණ අගය එය ආපසු ලබා ගත හැකි අගය ඉක්මවන අවස්ථාවල දී එම වත්කම ඌනකරණය වූවා සේ සැලකෙන අතර එහි ධාරණ අගය එය ආපසු ලබා ගත හැකි අගය දක්වා අඩු කරනු ලැබේ. එහි භාවිතයේ දී වටිනාකම තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය පිළිබඳව කරනු ලබන වර්තමාන වෙළඳ පොළ තක්සේරු සහ වත්කමට විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු-පූර්ව වට්ටම් අනුපාතිකයක් යොදා ගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයන්ට අනුව වට්ටම් කරනු ලැබේ. එය අලෙවි කිරීම සඳහා දැරිය යුතු පිරිවැයවල් අඩු කොට එහි සාධාරණ අගය තීරණය කිරීමේ දී යෝග්‍ය තක්සේරු ආකෘතියක් යොදා ගනු ලැබේ. තක්සේරු ගුණිත හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දර්ශක යොදා ගනිමින් මෙම ගණනය කිරීම් සනාථ කරනු ලැබේ.

මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගෙන යාම නිසා දැරීමට සිදු වූ ඌනකරණ අලාභ ආදායම් ප්‍රකාශයෙහි ඌනකරණ වත්කමේ කාර්යයට අනුරූප වියදම් කාණ්ඩවල දී හඳුනා ගැනෙන අතර කලින් ප්‍රත්‍යාගණනය කර එම ප්‍රත්‍යාගණනය ස්කන්ධයට ඇතුළත් කරන ලද දේපළ බැහැර කරනු ලැබේ. මෙහි දී කලින් සිදු කරන ලද කවර හෝ ප්‍රත්‍යාගණනයක අගය ඉක්මවා නොයන තුරු ස්කන්ධයේ දී ද ඌනකරණය හඳුනා ගනු ලැබේ.

වත්කම් සම්බන්ධයෙන් ගත් විට කලින් හඳුනා ගන්නා ලද ඌනකරණ අලාභ තව දුරටත් නොපවතින බවට හෝ අඩු වී ඇති බවට යම් ඉඟියක් පවතින්නේ දැයි සොයා දැන ගැනීම සඳහා සෑම වාර්තාකරණ දිනයක දී ම තක්සේරුවක් සිදු කරනු ලැබේ. එවැනි ඉඟියක් පවතින්නේ නම් සමාගම විසින් ආපසු ලබා ගත හැකි අගය පිළිබඳ ඇස්තමේන්තුවක් සිදු කරනු ලැබේ. කලින් හඳුනා ගන්නා ලද ඌනකරණයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ අවසන් ඌනකරණ අලාභය හඳුනා ගත් තැන් සිට වත්කම ආපසු ලබා ගත හැකි අගය තීරණය කිරීම සඳහා යොදා ගන්නා ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත් නම් පමණකි. සිදු වී ඇත්තේ එය නම් වත්කමේ ධාරණ අගය එය ආපසු ලබා ගත හැකි අගය තෙක් වැඩි කරනු ලැබේ. පූර්ව වර්ෂවල දී වත්කම සම්බන්ධයෙන් ඌනකරණ අලාභයක් හඳුනා ගෙන නැත් නම් වැඩි කළ එම අගයට තීරණය කෙරෙනු ඇති ධාරණ අගය, ශුද්ධ ක්ෂය කිරීම ඉක්මවිය නොහැකි ය. වත්කම ගෙන යන්නේ ප්‍රත්‍යාගණනය කළ අගය අනුව නොවේ නම් ආදායම් ප්‍රකාශයේ දී එවැනි ප්‍රතිවර්තනයක් හඳුනා ගැනෙන අතර එම ප්‍රතිවර්තනය ප්‍රත්‍යාගණන වැඩි වීමක් ලෙස සලකනු ලැබේ.

4.4.3. සාධාරණ අගය තක්සේරු කිරීම

සමාගම සාධාරණ අගය අනුව සියලු දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කරයි. සාධාරණ අගය යනු තක්සේරුව සිදු කරනු ලබන දිනට වෙළඳ පොළ සහභාගිකයන් අතර සිදු වන ක්‍රමවත් ගනුදෙනුවක දී වත්කමක් අලෙවි කිරීම සඳහා ලැබෙනු ඇති හෝ බැරකමක් පැවරීම සඳහා ගෙවනු ඇති මිල යි. සාධාරණ අගය අනුව කරනු ලබන තක්සේරුව වත්කම අලෙවි කිරීම හෝ බැරකම පැවරීම සඳහා කරන ගනුදෙනුව සිදු වන්නේ පහත දැක්වෙන වෙළඳ පොළවලින් එකක දී ය යන උපකල්පනය මත පදනම් වේ.

- වත්කම හෝ බැරකම සඳහා වූ ප්‍රධාන වෙළඳ පොළ තුළ දී, හෝ
- ප්‍රධාන වෙළඳ පොළක් නොමැති නම් වත්කම හෝ බැරකම සඳහා වඩාත් ම වාසිදායක වෙළඳ පොළ තුළ දී

ප්‍රධාන හෝ වඩාත් ම වාසිදායක වෙළඳ පොළ සමාගමට ප්‍රවේශ විය හැකි වෙළඳ පොළක් විය යුතු ය.

වත්කමක හෝ බැරකමක සාධාරණ අගය තක්සේරු කරනු ලබන්නේ වෙළඳ පොළ සහභාගිකයන් තමන්ගේ ප්‍රශස්ත ආර්ථික අවශ්‍යතාව අනුව ක්‍රියා කරන්නේ නම් වත්කම හෝ බැරකම මිලකරණය කෙරුණු විට වෙළඳ පොළ සහභාගිකයන් යොදා ගනු ඇති උපකල්පන යොදා ගනිමිනි.

සමාගම වාතාවරණයට යෝග්‍ය වූත් අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් යොදා ගැනීම උපරිම කරමින් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් යොදා ගැනීම අවම කරමින් සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් දත්ත පවතින්නා වූත් තක්සේරු ශිල්ප ක්‍රම යොදා ගනියි.

මූල්‍ය ප්‍රකාශවල දී සාධාරණ අගය තක්සේරු කෙරෙන හෝ අනාවරණය කෙරෙන සියලු ම වත්කම් හා බැරකම් පහත විස්තර කෙරෙන පරිදි සමස්තයක් ලෙස සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම පදනම් කර ගෙන සාධාරණ අගය ධුරාවලිය තුළ වර්ගීකරණය කරනු ලැබේ.

මට්ටම 1 - අනන්‍ය වත්කම් හෝ බැරකම් සඳහා ක්‍රියාකාරී වෙළඳ පොළවල් තුළ සඳහන් (නොගැළපූ) වෙළඳ පොළ මිල ගණන්

මට්ටම 2 - සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරු ශිල්ප ක්‍රම

මට්ටම 3 - සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම නිරීක්ෂණය කළ නොහැකි තක්සේරු ශිල්ප ක්‍රම

මූල්‍ය ප්‍රකාශවල දී පුනරාවර්ති පදනමකින් හඳුනා ගැනෙන වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ගත් විට සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේ ම (සමස්තයක් ලෙස සාධාරණ අගය පිළිබඳ තක්සේරුවට

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා

වැදගත් වන පහළ ම මට්ටමේ යෙදවුම පදනම් කර ගෙන) වර්ගීකරණය යළි තක්සේරු කිරීම මගින් ධුරාවලියේ මට්ටම් අතර පැවරීම් සිදු වී තිබෙන්නේ දැයි සමාගම තීරණය කරයි.

සමාගමේ කළමනාකාරිත්වය පුනරාවර්තී සාධාරණ අගය පිළිබඳ තක්සේරුව සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි තීරණය කරයි. දේපළ, පිරියත හා උපකරණ තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවෝ සම්බන්ධ කර ගැනෙති. බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ කර ගත යුතු යැයි තීරණය කරනු ලබන්නේ සමාගමේ විගණන කමිටුව සමග සාකච්ඡා කිරීමෙන් සහ එහි අනුමතිය ලැබීමෙන් පසුව කළමනාකාරිත්වය විසිනි. තෝරා ගැනීමේ නිර්ණායක අතරට වෙළඳ පොළ පිළිබඳ දැනුම, කීර්තිය, ස්වාධීනත්වය, සහ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගෙන යන්නේ ද යන කරුණු ඇතුළත් වේ.

4.5. පෙර ගෙවුම් කල් බදු වාරිකය

කල් බදු කාල පරිච්ඡේදය තුළ දී බදුකර ඉඩම් සම-වාර්ෂික පදනමක් මත ක්‍රමක්ෂය කෙරෙන අතර කල් බදු කාල පරිච්ඡේදය තුළ සරල රේඛීය ක්‍රමයක් යොදා ගනිමින් ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

4.6. භාණ්ඩ තොග

යල් පිනූ හා මන්දගාමීව වැය වන අයිතමයන් නිසි ලෙස සලකා බැලීමෙන් පසුව පහළ යන පිරිවැය මත සහ විකිණීමෙන් ලබා ගත හැකි ඇස්තමේන්තුගත ශුද්ධ අගය මත භාණ්ඩ තොග තක්සේරු කරනු ලැබේ. විකිණීමෙන් ලබා ගත හැකි ශුද්ධ අගය යනු භාණ්ඩ තොගවල විකුණුම් පිරිවැය සහ/හෝ භාණ්ඩ තොග ඒවායේ වර්තමාන තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමේ පිරිවැය සලකා බැලීමෙන් පසුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු ඔස්සේ එම භාණ්ඩ තොග විකිණිය හැකි මිල වේ.

භාණ්ඩ තොගයේ එක් එක් අයිතම කාණ්ඩයේ පිරිවැය හරිත සාමාන්‍ය පදනම මත නිශ්චය කරනු ලැබේ.

4.7. මූල්‍ය වත්කම් - හඳුනා ගැනීම හා තක්සේරු කිරීම

මූල්‍ය සාධන පත්‍රයක් යනු එක් ආයතනයකට මූල්‍ය වත්කමක් සහ තවත් ආයතනයකට මූල්‍ය බැරකමක් හෝ ස්කන්ධ සාධන පත්‍රයක් හිමි වන කවර හෝ ගිවිසුමකි.

මූල්‍ය වත්කම්

(a) ආරම්භක හඳුනා ගැනීම හා තක්සේරු කිරීම

ආරම්භක හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරෙන අතර තදනන්තරව වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) යටතේ ක්‍රමක්ෂය පිරිවැය හා සාධාරණ අගය මත සහ ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත තක්සේරු කරනු ලැබේ.

ආරම්භක හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ ලක්ෂණ සහ හෝටලය එම ලක්ෂණ කළමනාකරණය කිරීම සඳහා යොදා ගන්නා ව්‍යාපාරික ආකෘතිය මත රඳා පවතී. හෝටලය ප්‍රායෝගික පියවරක් ගෙන ඇති වැදගත් මූල්‍ය සංරචකයක් අඩංගු නොවන අය විය යුතු වෙළඳ මුදල් සම්බන්ධයෙන් හැර හෝටලය ආරම්භයේ දී මූල්‍ය වත්කමක් තක්සේරු කරන්නේ එහි සාධාරණ අගය මත ය, ලාභය හා අලාභය යටතේ සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කමක් නොවේ නම්, එහි ගනුදෙනු පිරිවැය මත ය. හෝටලය ප්‍රායෝගික පියවරක් ගෙන ඇති වැදගත් මූල්‍ය සංරචකයක් අඩංගු නොවන අය විය යුතු වෙළඳ මුදල් තක්සේරු කරනු ලබන්නේ SLFRS 15 යටතේ නිශ්චිය කෙරෙන ගනුදෙනු මිල මත ය.

වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ක්‍රමක්ෂය පිරිවැය හෝ සාධාරණ අගය මත මූල්‍ය වත්කමක් වර්ගීකරණය හෝ තක්සේරු කිරීමට නම් එම වත්කම නිසා නොගෙවූ මුල් මුදල මත 'තනිකර ම මුල් මුදල හා පොලිය පමණක් ගෙවන (SPPI)' මූල්‍ය ප්‍රවාහයන් හට ගත යුතු වේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා හෝටලය විසින් යොදා ගනු ලබන ව්‍යාපාරික ආකෘතිය යනු මූල්‍ය ප්‍රවාහයන් ජනනය කර ගැනීම සඳහා එය විසින් මූල්‍ය වත්කම් කළමනාකරණය කෙරෙන ආකාරය යි. මූල්‍ය ප්‍රවාහයන් හට ගන්නේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් රැස් කර ගැනීමෙන් ද මූල්‍ය වත්කම් අලෙවි කිරීමෙන් ද නැත් නම් ඒ දෙයාකාරයෙන් ම ද යන්න ව්‍යාපාරික ආකෘතිය විසින් තීරණය කරනු ලැබේ.

වෙළඳ පොළ රෙගුලාසියකින් හෝ සම්මුතියකින් ස්ථාපිත කාල රාමුවක් තුළ මූල්‍ය වත්කම් සම්පාදනය කළ යුතු මූල්‍ය වත්කම් මිල දී ගැනීම් හෝ අලෙවි කිරීම් වෙළඳ දිනය එනම් හෝටලය විසින් වත්කම මිල දී ගැනෙන හෝ අලෙවි කෙරෙන දිනය මත හඳුනා ගනු ලැබේ.

(b) තදනන්තර තක්සේරුව

තදනන්තර තක්සේරුව සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ග කරනු ලැබේ:

i. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

ii. සමුච්චය වන ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය වන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

iii. හඳුනා ගැනීම ඉවත් කිරීම නිසා සමුච්චය වන ලාභ හා අලාභ ප්‍රතිවක්‍රීකරණය නොවන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත නිමිති කරන ලද මූල්‍ය වත්කම් (ස්කන්ධ සාධන පත්‍ර)

iv. ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර)

හෝටලයට වඩාත් ම අදාළ වන කාණ්ඩය මෙය වේ. පහත දැක්වෙන කොන්දේසි දෙක ම සැපිරෙන්නේ නම් හෝටලය ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් තක්සේරු කරනු ඇත:

- මූල්‍ය වත්කම පවතින්නේ ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් රැස් කර ගැනීම පිණිස මූල්‍ය වත්කම් අත් කර ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාරික ආකෘතියක් තුළ ය.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි නිසා නොගෙවූ මුල් මුදල මත නියමිත දිනයන්හි දී තනිකර ම මුල් මුදල හා පොලිය පමණක් ගෙවන මූල්‍ය ප්‍රවාහයන් හට ගනී.

ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් තදනන්තරව සඵල පොලී අනුපාතික (EIR) විධික්‍රමය යොදා ගනිමින් තක්සේරු කෙරෙන අතර ඌනකරණයට යටත් වේ. වත්කම හඳුනා ගැනීම ඉවත් කෙරෙන, සංශෝධනය කෙරෙන හෝ ඌනකරණය කෙරෙන විට ලාභය හෝ අලාභය යටතේ ලාභ හා අලාභ හඳුනා ගනු ලැබේ.

හෝටලය සතු ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් අතරට මුදල් හා බැංකු ශේෂ, කෙටි කාලීන ආයෝජන, අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්, අය විය යුතු වෙළඳ මුදල් සහ ජංගම නොවන ආයෝජන ඇතුළත් වේ.

හෝටලය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ණය සාධන පත්‍ර) සහ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් (ස්කන්ධ සාධන පත්‍ර) සහ ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් වර්ගීකරණය නොකරයි.

(c) හඳුනා ගැනීම ඉවත් කිරීම

ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන අවස්ථාවල දී මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවල දී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ:

- වත්කමෙන් මූල්‍ය ප්‍රවාහයන් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇත, හෝ
- හෝටලය විසින් වත්කමෙන් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමට ඇති සිය අයිතිවාසිකම් පවරා දෙනු ලැබ හෝ ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් 'ඔබ්බට යැවීමේ' එකඟතාවක් යටතේ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ම තුන් වන පාර්ශ්වයක් වෙත ගෙවීමේ වගකීමක් භාර ගනු ලැබ හෝ ඇත; නැතහොත්

(a) හෝටලය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පවරා දෙනු ලැබ ඇත, හෝ

(b) හෝටලය විසින් වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පවරා දෙනු ලැබ හෝ රඳවා ගනු ලැබ නැති නමුත් වත්කමේ පාලනය පවරා දෙනු ලැබ ඇත.

හෝටලය වත්කමකින් මූල්‍ය ප්‍රවාහයන් ලබා ගැනීමට ඇති සිය අයිතිවාසිකම් පවරා දී ඇති විට හෝ ඔබ්බට යැවීමේ එකඟතාවකට ඇතුළත්ව ඇති විට හෝටලය විසින් එය හිමිකාරත්වයේ අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගෙන ඇත් ද ඒ කොතෙක් දුරට ද යන්න තක්සේරු කරනු ලැබේ. එය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් පවරා දී හෝ රඳවා ගෙන හෝ වත්කමේ පාලනය පවරා දී හෝ නොමැති නම් පවරනු ලැබූ එම වත්කමට හෝටලයේ සම්බන්ධය අඛණ්ඩව පවතින ප්‍රමාණයට හෝටලය විසින් අඛණ්ඩව එම වත්කම හඳුනා ගනු ලැබේ. එවැනි අවස්ථාවක හෝටලය විසින් ආශ්‍රිත බැරකමක් ද හඳුනා ගනු ලැබේ. පවරනු ලැබූ වත්කම සහ ආශ්‍රිත බැරකම තක්සේරු කිරීම සඳහා සමාගම විසින් රඳවා ගනු ලැබ ඇති අයිතිවාසිකම් හා බැඳීම් පිළිබිඹු වන පදනමක් යොදා ගනු ලැබේ.

හෝටලයේ අඛණ්ඩ සම්බන්ධය පවරනු ලැබූ වත්කම සම්බන්ධයෙන් ඇප වීමක ස්වරූපය ගන්නා අතර වත්කමේ මුල් ධාරණ අගයේ අවමය සහ ආපසු ගෙවීමට හෝටලයට සිදු විය හැකි මුදලේ උපරිම අගය මත තක්සේරු කරනු ලැබේ.

(d) ඌනකරණය

ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත පවත්වා ගෙන නොයන සියලු ණය සාධන පත්‍ර සම්බන්ධයෙන් අපේක්ෂිත ණය අලාභ (ECLs) සලකා බැලිය යුතු බව හෝටලය විසින් හඳුනා ගනු ලැබේ. මුල් සළුල පොලී අනුපාතිකයේ ආසන්න අගයකට වට්ටම් කෙරෙන ගිවිසුම අනුව ලැබිය යුතු ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහයන් සහ ලැබෙනු ඇති බවට හෝටලය අපේක්ෂා කරන සියලු මූල්‍ය ප්‍රවාහයන් අතර පවත්නා වෙනස පදනම් කර ගෙන අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලැබේ. රඳවා ගන්නා ලද ඇපකර අලෙවි කිරීමෙන් ලැබෙන මූල්‍ය ප්‍රවාහයන් හෝ ගිවිසුම්ගත කොන්දේසිවල කොටසක් වන වෙනත් ණය ඉවැඩි කිරීම් අපේක්ෂිත මූල්‍ය ප්‍රවාහයන් අතරට ඇතුළත් වනු ඇත.

අය විය යුතු වෙළඳ මුදල් සම්බන්ධයෙන් ගත් විට අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ දී හෝටලය විසින් සරල කළ ප්‍රවිෂ්ටයක් යොදා ගනු ලැබේ. එම නිසා හෝටලය විසින් ණය අවදානමෙහි ඇති වන වෙනස්කම් පිළිබඳව සොයා බැලීමක් නොකෙරෙන නමුත් ඒ ඒ වාර්තාකරණ දිනට අපේක්ෂිත දීර්ඝ කාලීන ණය අලාභ පදනම් කර ගෙන අලාභ සලකා බැලීමක් කළ යුතු බව හඳුනා ගනු ලැබේ. හෝටලය ණය අහිමි වීම පිළිබඳ සිය අතීත අත්දැකීම් පදනම් කර ගෙන ණයහිමියන්ට හා ආර්ථික වාතාවරණයට විශේෂිත අනාගත සාධකවලට ගළපන ලද ප්‍රතිපාදන ආකෘතියක් හඳුනා ගෙන ඇත.

මූල්‍ය බැරකම්

(a) ආරම්භක හඳුනා ගැනීම හා තක්සේරුව

ආරම්භක හඳුනා ගැනීමේ දී අදාළ පරිදි ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගයන් මත මූල්‍ය බැරකම්, ණය දීම් හා ණය ගැනීම්, ගෙවිය යුතු මුදල් ලෙස හෝ ක්‍රියාත්මක ඉදිරි රැකුමකට අයත් ඉදිරි රැකුම් සාධන පත්‍ර වශයෙන් නිමිති කරන ලද ව්‍යුත්පන්න ලෙස මූල්‍ය බැරකම් වර්ගීකරණය කරනු ලැබේ.

ආරම්භයේ දී සියලු මූල්‍ය බැරකම් සාධාරණ අගය මත හඳුනා ගැනෙන අතර ණය දීම් හා ණය ගැනීම් සහ ගෙවිය යුතු මුදල් සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයවල් බැහැර කර හඳුනා ගනු ලැබේ.

හෝටලයේ මූල්‍ය බැරකම් අතරට ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල් සහ බැංකු අයිරා ඇතුළු අදාළ පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් ඇතුළත් වේ.

හෝටලය සතුව ලාභය හා අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් සහ ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර නොමැත.

(b) තදනන්තර තක්සේරුව

මූල්‍ය බැරකම් තක්සේරුව පහත විස්තර කෙරෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

ණය දීම් හා ණය ගැනීම්

හෝටලයට වඩාත් ම අදාළ වන කාණ්ඩය මෙය වේ. ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව පොලී සහිත ණය දීම් හා ණය ගැනීම් තදනන්තරව සළුල පොලී අනුපාතික විධික්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. බැරකම් හඳුනා ගැනීම ඉවත් කෙරෙන විට සහ සළුල පොලී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය යටතේ ලාභය හා අලාභය මත ලාභ හා අලාභ හඳුනා ගනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත් කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් වේ නම් එය සහ සළුල පොලී අනුපාතිකයේ ඒකාබද්ධ කොටසක් ලෙස පවත්නා ගාස්තු හෝ පිරිවැයවල් වේ නම් ඒවා සලකා බැලීම මගිනි. සළුල පොලී අනුපාතික ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයවල් ලෙස ඇතුළත් කරනු ලැබේ. මෙම කාණ්ඩය සාමාන්‍යයෙන් පොලී සහිත ණය දීම් හා ණය ගැනීම්වලට අදාළ වේ.

(c) හඳුනා ගැනීම ඉවත් කිරීම

බැරකමක් යටතේ ඇති වන බැඳීම පියවා දැමෙන හෝ අවලංගු කෙරෙන හෝ කල් ඉකුත් වන විට එම මූල්‍ය බැරකම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත එක ම ණය හිමියාගෙන් ලබා ගන්නා වෙනත් මූල්‍ය බැරකමකින් දැනට පවත්නා මූල්‍ය බැරකමක් ප්‍රතිස්ථාපනය කෙරෙන විට හෝ පවත්නා මූල්‍ය බැරකමක කොන්දේසි සැලකිය යුතු ලෙස සංශෝධනය කෙරෙන විට එම හුවමාරුව හෝ සංශෝධනය කිරීම මුල් බැරකම හඳුනා ගැනීම ඉවත් කිරීම සහ නව බැරකමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ දී හඳුනා ගනු ලැබේ.

මූල්‍ය සාධන පත්‍ර හිලව් කිරීම

වත්කම් උපලබ්ධි කිරීම හා බැරකම් පියවීම එක විට සිදු කිරීම සඳහා හඳුනා ගත් අගයන් හිලව් කිරීම පිණිස වර්තමානයේ බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් ඇත් නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් ඇත් නම් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කෙරෙන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය තුළ ශුද්ධ අගය වාර්තා කරනු ලැබේ.

4.8. මුදල් හා බැංකු ශේෂ

මුදල් හා බැංකු ශේෂ අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති ශේෂ වශයෙන් අර්ථ නිරූපණය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා අතේ ඇති මුදල්වලින් සහ හිඟ බැංකු අයිරා බැහැර කළ විට බැංකුවේ ඇති තැන්පතුවලින් මුදල් සහ මුදල් හා සමාන වත්කම් සමන්විත වේ. අත්පත් කර ගත් දින සිට මාස තුනකින් හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන කෙටි කාලීන ආයෝජන ද මුදල් හා සමාන වත්කම් ලෙස සලකනු ලැබේ.

4.9. ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධ වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ස්කන්ධ සාධන පත්‍ර නිකුත් කිරීමේ සෘජු පිරිවැයවල් බැහැර කර අය කර ගත් හෝ අය

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 12 සඳහා

විය යුතු මුදල් හෝ වෙනත් සම්පත්වල සාධාරණ අගය මත ස්කන්ධ සාධන පත්‍ර තක්සේරු කරනු ලැබේ.

4.10. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

4.10.1. නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දී හඳුනා ගනු ලබන බැරකමෙන් නියෝජනය වන්නේ ප්‍රක්ෂිප්ත ඒකක ණය විධික්‍රමය යොදා ගනිමින් ආයුගණක අගය පදනම් කර ගෙන ඇස්තමේන්තු කරනු ලබන වාර්තාකරණ දිනට නිර්වාචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය යි. ආයුගණක තක්සේරුවල දී වට්ටම් අනුපාතික හා අනාගත වැටුප් වැඩි වීම් පිළිබඳ උපකල්පනවලට එළඹීමට සිදු වේ. නිර්වාචිත ප්‍රතිලාභ බැඳීම මෙම උපකල්පනවල සිදු වන වෙනස් වීම්වලට අතිශයින් සංවේදී ය. මෙම ප්‍රතිලාභ සඳහා බැහැරින් මූල්‍ය සම්පාදනය නොකෙරේ.

සමාගම විසින් නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්මෙන් පැන නගින ආයුගණක ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වහා ම හඳුනා ගනු ලැබේ.

කෙසේ වුව ද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පණත අනුව පාරිතෝෂික ගෙවීමේ බැරකම පැන නගින්නේ වසර 5ක අඛණ්ඩ සේවයක් සපුරා ඇත් නම් පමණකි.

4.10.2. නිර්වාචිත දායකත්ව සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යනු යම් ආයතනයක් විසින් තවත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන සහ තව දුරටත් මුදල් ගෙවීමට නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් ඇති නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම් සඳහා දායකත්වය ලබා දීමට ඇති බැඳීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී සේවකයන් විසින් සේවාවන් සම්පාදනය කෙරෙන කාල පරිච්ඡේදයන් තුළ දී දැරිය යුතු සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

a) සේවක අර්ථසාධක අරමුදල (EPF)

සමාගම හා සේවකයන් විසින් පිළිගත් අර්ථසාධක අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙළින් 12%ක් හා 8%ක් දායක කරනු ලැබේ.

b) සේවක භාරකාර අරමුදල (ETF)

සමාගම විසින් සේවක භාරකාර අරමුදලට එක් එක් සේවකයාගේ වැටුපෙන් 3%ක් දායක කරනු ලැබේ.

4.11. මූල්‍ය බැරකම්

4.11.1. ආරම්භක හඳුනා ගැනීම හා තක්සේරුව

සමාගම විසින් ගිවිසුම්ගත විධිවිධානයේ හරයට සහ මූල්‍ය බැරකම් පිළිබඳ අර්ථ නිරූපණවලට අනුකූලව ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගයන් (FVTPL) මත මූල්‍ය බැරකම් හෝ වෙනත් මූල්‍ය බැරකම් යටතට මූල්‍ය බැරකම් වර්ග කරනු ලැබේ.

සමාගම මූල්‍ය බැරකමේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට පත් වන විට සමාගම විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දී මූල්‍ය බැරකම් හඳුනා ගනු ලැබේ.

a) ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය (FVTPL) මත මූල්‍ය බැරකම

ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් අතරට වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති හෝ ආරම්භක හඳුනා ගැනීමේ දී එසේ නිමිති කරන ලද මූල්‍ය බැරකම් ඇතුළත් වේ. ආරම්භක හඳුනා ගැනීමෙන් තදනන්තරව ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් සාධාරණ අගය මත තක්සේරු කෙරෙන අතර එහි සිදු වන වෙනස් වීම් ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනු ලැබේ.

ආරම්භක හඳුනා ගැනීම මත වත්කම අත්පත් කර ගැනීමට සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභය හෝ අලාභය තුළ දී හඳුනා ගනු ලැබේ. ආරම්භක හඳුනා ගැනීම මත ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය බැරකම් නිමිති කිරීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක ලාභය හෝ අලාභය යටතේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් සඳහා යොදා ගනු ලබන නිර්ණායක ම වේ.

b) වෙනත් මූල්‍ය බැරකම්

වෙනත් මූල්‍ය බැරකම් අතරට තැන්පතු, සමාගම විසින් නිකුත් කරන ලද ණය සහ ණයට ගත් වෙනත් අරමුදල් ඇතුළත් වන අතර අත්පත් කර ගැනීමට සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය අඩු කොට සාධාරණ අගය මත ආරම්භයේ දී තක්සේරු කොට තදනන්තරව සඵල පොලී අනුපාතික විධික්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. නිකුතුව මත යම් වට්ටමක් හෝ අධිමිලක් වේ නම් එය සහ සඵල පොලී අනුපාතිකයේ ඒකාබද්ධ කොටසක් ලෙස පවත්නා පිරිවැයවල් වේ නම් ඒවා සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

4.11.2. මූල්‍ය බැරකම් හඳුනා ගැනීම ඉවත් කිරීම

බැරකමක් යටතේ ඇති වන බැඳීම පියවා දැමෙන හෝ අවලංගු කෙරෙන හෝ කල් ඉකුත් වන විට එම මූල්‍ය බැරකම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත එක ම ණය හිමියාගෙන් ලබා ගන්නා වෙනත් මූල්‍ය බැරකමකින් දැනට පවත්නා මූල්‍ය බැරකමක් ප්‍රතිස්ථාපනය කෙරෙන විට හෝ පවත්නා මූල්‍ය බැරකමක කොන්දේසි සැලකිය යුතු ලෙස සංශෝධනය කෙරෙන විට එම හුවමාරුව හෝ සංශෝධනය කිරීම මුල් බැරකම හඳුනා ගැනීම ඉවත් කිරීමක් සහ නව බැරකමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය බැරකමේ ධාරණ අගය සහ ගෙවන ලද මුදල අතර වෙනස ලාභය හෝ අලාභය යටතේ හඳුනා ගනු ලැබේ.

4.12. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස උද්ගත වූ වර්තමාන (නෛතික හෝ සම්ප්‍රයුක්ත) බැඳීමක් සමාගම සතු නම් සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය නම් සහ බැඳීමේ අගය පිළිබඳව විශ්වසනීය තක්සේරුවක් කළ හැකි නම් එවිට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. යම් ප්‍රතිපාදනයකට අදාළව දැරිය යුතු වියදම කවර හෝ ප්‍රතිපූරණයක් වේ නම් බැහැර කොට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දක්වනු ලැබේ.

4.13. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

LKAS 7 - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය තුළ දී නියම කෙරෙන පරිදි වක්‍ර විධික්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මුදල් සහ මුදල් හා සමාන වත්කම් අතේ ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකු අයිරාවලින් සමන්විත වේ.

4.14. ආංශික තොරතුරු

අංශයක් යනු සේවා සම්පාදනයේ නිරත සහ සෙසු අංශවලට වෙනස් අවදානම් හා ප්‍රතිලාභවලට යටත් වන වෙන් කර හඳුනා ගත හැකි සංරචකයකි. සමාගමේ සියලු මෙහෙයුම් එක ම අංශයක් ලෙස සලකනු ලබන බැවින් අංශයක් වශයෙන් වෙන් කර හඳුනා ගත හැකි සංරචක සමාගම සතු නොවේ.

4.15. නිකුත් කරන ලද නමුත් තවමත් බලාත්මක වී නැති ප්‍රමිති

2021 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කර ඇති සියලු අදාළ ප්‍රමිතීන් හා අර්ථ නිරූපණයන් සමාගම විසින් යොදා ගනු ලැබ ඇත.

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
5. ගනුදෙනුකරුවන් සමග ඇති කර ගත් ගිවිසුම්වලින් ලද ආදායම		
5.1. ගනුදෙනුකරුවන් සමග ඇති කර ගත් ගිවිසුම්වලින් ලද දළ ආදායම	**1,190,331**	1,092,264
අඩු කළා: සංචාරක කර්මාන්ත සංවර්ධන බද්ද	**(11,950)**	(11,128)
ගනුදෙනුකරුවන් සමග ඇති කර ගත් ගිවිසුම්වලින් ලද ශුද්ධ ආදායම	**1,178,381**	1,081,135

ආදායම ගණනය කරන විට රු. මිලියන 104 ක් (2020 - රු. මිලියන 85) වූ අගය එකතු කළ බද්ද අඩු කර ඇත.

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
5.2. ආදායම		
කාමර ආදායම	**236,944**	313,080
ආහාර පාන ආදායම	**925,077**	742,928
වෙනත් මෙහෙයුම් දෙපාර්තමේන්තු	**16,360**	25,127
	1,178,381	1,081,135

6. ආයෝජන ආදායම		
පොලී ආදායම - ණය හා අය විය යුතු මුදල්		
භාණ්ඩාගාර බිල්පත් මත පොලිය	**2,439**	1,812
කාර්ය මණ්ඩල ණය මත පොලිය	**7**	6
නේවාසික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් මත පොලිය	**1,068**	741
ස්ථාවර තැන්පතු මත පොලිය	**7,708**	7,709
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිස්ථාපන සංචිතය මත පොලී ආදායම	**-**	604
	11,222	10,873

7. වෙනත් ලාභ හා අලාභ		
දේපළ හා උපකරණ අලෙවි කිරීම මත ලාභය	**12,560**	2,317
කඩ කුලී	**1,676**	4,896
උපලබ්ධි නොවූ විනිමය ලාභය/(අලාභය)	**(358)**	113
උපලබ්ධි වූ විනිමය ලාභය	**14,407**	2,691
විවිධ ආදායම	**2,906**	15,374
	31,191	25,391

8. මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	**31,118**	23
අයිරා පොලිය	**80,258**	32,794
සහන ණය පහසුකම	**5,125**	7,799
කාලීන ණය පහසුකම	**16,176**	-
කල්බදු වත්කම්	**1,800**	1,953
	134,477	42,569

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
9. කාල පරිච්ඡේදය සඳහා ලාභය		
පහත දැක්වෙන ඒවා ද ඇතුළු සියලු වියදම් පියවීමෙන් පසුව කාල පරිච්ඡේදය සඳහා ලාභය ප්‍රකාශ කර ඇත:		
අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්	**3,725**	4,065
විගණකවරුන්ගේ චේතන - සමාගම	**600**	1,200
- කළමිබු හිල්ටන්	**1,915**	1,669
ක්ෂය කිරීම	**386,618**	378,443
කාර්ය මණ්ඩල පිරිවැය (පහත දැක්වෙන සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැයවල් ද ඇතුළුව)	**506,207**	456,114
- නිර්වාචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික	**5,991**	23,415
- නිර්වාචිත දායකත්ව සැලසුම් පිරිවැයවල් - සේ.අ.අ. සහ සේ.භා.අ.	**66,972**	59,668
කළමනාකරණ ගාස්තු	**-**	-
සමූහ සේවා සහ ප්‍රතිලාභ භාරය - හිල්ටන් ඉන්ටර්නැෂනල්	**23,864**	5,473
නෛතික ගාස්තු	**611**	158
10. ආදායම් බදු වියදම		
කාල පරිච්ඡේදය සඳහා ප්‍රතිපාදනය	**1,260**	1,153
පූර්ව වර්ෂයේ ඌන ප්‍රතිපාදනය	**16,610**	17,211
විලම්බිත බදු (ආදායම) වියදම	**(37,060)**	22,400
	(19,190)	40,764

10.1. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සහ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ බදු අය කළ හැකි ලාභය සහ ගිණුම්ගත ලාභය අතර සංසන්දනාත්මක විග්‍රහයක් පහත දැක්වේ:,

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
ආදායම් බදුවලට පෙර ගිණුම්ගත ලාභය	**(976,414)**	(877,343)
සමාහාර ප්‍රතික්ෂේපිත අයිතම	**385,798**	382,544
සමාහාර අනුදත හැකි වියදම	**(467,976)**	(505,112)
වෙළඳ ලාභ හා වෙනත් ආදායම් මූලාශ්‍ර @ 12%	**(1,058,592)**	(999,911)
වෙනත් ආදායම් මූලාශ්‍ර @ 24%	**5,251**	4,805
මුළු බදු අය කළ හැකි ලාභය	**5,251**	4,805
අලාභ අයකරගැනීම්	**-**	-
බදු අය කළ හැකි ලාභය	**5,251**	4,805
බදු අය කළ හැකි වෙනත් ආදායම් මූලාශ්‍ර @ 24%	**1,260**	1,153
ප්‍රවර්තන වර්ෂයේ මුළු බදු වියදම	**1,260**	1,153

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
10.2. විලම්බිත බද්ද		
විලම්බිත බදු හට ගැනීමට හේතුව:		
- තාවකාලික වෙනස ඇති වීම හා ආපසු හැරවීම (24 සටහන)	**(37,060)**	22,400
මුළු විලම්බිත බදු භාරය	**(37,060)**	22,400
10.3. ඉදිරියට ගෙන ගිය බදු අලාභ		
ඉදිරියට ගෙනා බදු අලාභ	**11,244,658**	10,244,747
වර්ෂය තුල ඇතිවූ බදු අලාභ	**1,058,592**	999,911
ඉදිරි කාල පරිච්ඡේද සඳහා ඉදිරියට ගෙන ගිය බදු අලාභ	**12,303,250**	11,244,658

11. කොටසකට ඉපැයීම - මූලික

වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට හිමි විය යුතු ලාභය වර්ෂය තුළ දී නොගෙවන ලද සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන් කොටසකට මූලික ඉපැයීම ගණනය කරනු ලැබේ.

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
සාමාන්‍ය කොටසකට ලාභය	**(0.46)**	(0.45)

ලවය ලෙස යොදා ගන්නා ලද මුදල	31.12.2021 Rs. '000	31.12.2020 Rs. '000
සාමාන්‍ය කොටස් හිමියන්ට හිමි විය යුතු ලාභය	**(934,596)**	(926,194)

හරය ලෙස යොදා ගන්නා ලද මුදල	Nos. '000	Nos. '000
කොටසකට මූලික ලාභය ගණනය කිරීම සඳහා බර තබන ලද සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය අගය	**2,046,646**	2,046,646

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

12. දේපළ, පිරියත හා උපකරණ

	බදුකර ඉඩම මත පිහිටි ගොඩනැගිලි	පිරියත හා යන්ත්‍රෝපකරණ	හෝටල් ගෘහ භාණ්ඩ හා සවි කිරීම්	මෝටර් රථවාහන	ශීතකරණ හා මුළුතැන්ගේ උපකරණ	රූපවාහිනී හා පරිගණක	මෙහෙයුම් උපකරණ	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/ප්‍රත්‍යාගණනය								
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**7,309,000**	**270,465**	**538,744**	**56,020**	**402,324**	**45,687**	**106,000**	**8,728,240**
බැහැර කිරීම්	-	(4,988)	(2,428)	-	(1,095)	(26)	-	(8,537)
වර්ෂය තුළ දී එකතු කිරීම්	28,207	4,783	25,272	-	1,603	4,901	-	64,766
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	7,337,207	270,259	561,588	56,020	402,832	50,562	106,000	8,784,469
බැහැර කිරීම්	(3,527)	(7,140)	(6,454)	-	(24)	(121)	-	(17,265)
වර්ෂය තුළ දී එකතු කිරීම්	287,975	140,883	14,510	-	71,942	999	45,330	561,639
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**7,621,655**	**404,002**	**569,644**	**56,020**	**474,750**	**51,440**	**151,330**	**9,328,842**
සමුච්චිත ක්ෂය කිරීම්								
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	2,788,845	487,270	1,278,688	92,938	478,815	293,555	163,262	5,583,375
ප්‍රත්‍යාගණන සංචිතයට පවරන ලදි	(2,788,845)	(487,270)	(1,278,688)	(92,938)	(478,815)	(293,555)	(163,262)	(5,583,375)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා භාරය	133,197	20,279	55,335	14,005	30,206	9,865	35,333	298,220
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	133,197	20,279	55,335	14,005	30,206	9,865	35,333	298,220
වර්ෂය සඳහා භාරය	134,818	23,249	56,100	14,005	31,564	10,187	39,788	309,711
බැහැර කිරීම්	(64)	(535)	(645)	-	(2)	(24)	-	(1,271)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	267,950	42,992	110,790	28,010	61,768	20,028	75,122	606,660
අඩු කළ අගය								
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	7,309,000	270,465	538,744	56,020	402,324	45,687	106,000	8,728,240
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	7,204,010	249,981	506,253	42,015	372,626	40,697	70,667	8,486,249
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	7,353,705	361,010	458,855	28,010	412,982	31,413	76,208	8,722,182

හෝටලයේ දේපළ, පිරියත හා උපකරණවල පූර්ණ හිමිකාරත්වය හා පාලනය හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම සතු ය.

12.2. 1998 වසරේ දී ඇමරිකානු ඩොලර් 360,000ක පිරිවැයක් දරමින් ලෝක වෙළඳ මධ්‍යස්ථානය සහ හිල්ටන් හෝටලය යා කර පාලමක් ඉදි කරනු ලැබිණ. ඒ සඳහා ඕවර්සීස් රියල්ටි සමාගම සහ හිල්ටන් ඉන්ටර්නැෂනල් සමාගම පිළිවෙළින් ඇමරිකානු ඩොලර් 180,000ක් සහ ඇමරිකානු ඩොලර් 90,000ක් දායක කළ අතර ඉතිරි මුදල සමාගම විසින් දරන ලදි. සමාගම විසින් දරන ලද ඇමරිකානු ඩොලර් 90,000ක මුදල ගොඩනැගිලි යටතේ මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රාග්ධනිත කර ඇත.

12.3. සමාගම 2019 දෙසැම්බර් 31 දින සිට බලපවත්වන පරිදි දේපළ, පිරියත හා උපකරණ සඳහා ප්‍රත්‍යාගණන තක්සේරු ආකෘතිය යොදා ගනියි. සමාගම සතු දේපළ, පිරියත හා උපකරණවල සාධාරණ අගය තීරණය කිරීම සඳහා සමාගම විසින් බලය ලත් ස්වාධීන තක්සේරුකරුවෙකු වන ජී.ඩබ්ලිව්.ජී. අබේගුණවර්ධන සම්බන්ධ කර ගැනිණ. සාධාරණ අගය තීරණය කර ඇත්තේ වෙළ පදනම් කර ගත් සාක්ෂි ඇසුරිනි. තක්සේරු පදනම් වන්නේ විශේෂිත දේපලේ ස්වභාවය, ස්ථානය හෝ තත්ත්වයෙහි සිදුවිය හැකි කවර හෝ වෙනසක් සඳහා ගලපන ලද විවෘත වෙළඳපොලේ මිළ ගණන් මතය. තක්සේරු සියල්ලම සාධාරණ අගය පිළිබඳ තක්සේරු ධුරාවලියේ 3 වෙනි මට්ටමට අයත් වේ. තක්සේරු දිනය 2019 දෙසැම්බර් 31 විය.

දේපල	තක්සේරු විධික්‍රමය	තක්සේරුව බලාත්මක වන දිනය	දේපළ තක්සේරුකරු
ගොඩනැගිලි (පැතිරීම - වර්ග අඩි 431,286) අංක 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 සහ වෙනත් චංචල වත්කම්	ක්ෂය කරන ලද ප්‍රතිස්ථාපන පිරිවැය ප්‍රවිෂ්ටය මත පදනම් වේ	2019 දෙසැම්බර් 31	ජී.ඩබ්ලිව්.ජී. අබේගුණවර්ධන මහතා, වරලත් තක්සේරුකරු

දේපළ, පිරියත හා උපකරණ ඉදිරිපත් කරනු ලබන්නේ ක්ෂය කිරීම අඩු කොට පිරිවැය මත නම් ධාරණ අගය පහත දැක්වෙන පරිදි වනු ඇත:

	31.12.2021	31.12.2020
	රු. '000	රු. '000
පිරිවැය	**13,546,265**	12,984,626
සමුච්චිත ක්ෂය කිරීම	**(6,418,641)**	(6,108,930)
අඩු කළ අගය	**7,127,624**	7,336,485

13. බදුකර ඉඩම

	ප්‍රධාන දේපළ 99 අවුරුදු කල් බද්ද	ලන්දේසි රෝහලේ වෙළඳ සැල	නාගරික සංවර්ධන අධිකාරියේ රථ ගාල	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
2020.01.01 දිනට ශේෂය	6,469,116	14,789	30,485	6,514,390
ක්‍රමක්ෂය	(70,707)	(8,337)	(14,020)	(93,064)
ගෙවීම්	-	-	-	-
IFRS 16 ට අනුව වර්ෂය තුළ දී ප්‍රාග්ධනීත අගය	-	-	-	-
2020.12.31 දිනට ශේෂය	6,398,409	6,453	16,465	6,421,326
ක්‍රමක්ෂය	(70,707)	-	(6,200)	(76,907)
ලියා හල අගය	-	(6,453)	-	(6,453)
IFRS 16 ට අනුව වර්ෂය තුළ දී ප්‍රාග්ධනීත අගය	-	-	-	-
2021.12.31 දිනට ශේෂය	6,327,702	-	10,264	6,337,966

බදුකර ඉඩම 99 අවුරුදු බදු පදනම මත ලබා ගෙන ඇති අතර 2012 ජූනි 28 දින සිට බලාත්මක වේ. බදුකර ඉඩමේ තක්සේරු වටිනාකම වන රු. බිලියන 7ක මුදල ප්‍රාග්ධනකරණය කර ඇති අතර ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කරනු ලැබ ඇත. එපමණක් නොව ක්‍රීඩා සංකීර්ණය ඉදි කෙරෙන ඉඩම කුලී රහිත පදනම මත 2012 ජූනි 28 දින සිට වසර 5ක කාල පරිච්ඡේදයක් සඳහා බදු දීමට 2012 ඔක්තෝබර් 3 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබිණ. 2016/12/13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ඉඩමේ කල් බද්ද ප්‍රධාන ගොඩනැගිල්ලේ කල් බද්ද හා සම්පාත වන පරිදි 2111 ජූනි මාසය දක්වා දීර්ඝ කර ඇති අතර බදු කොන්දේසි නිශ්චය කිරීම මෙතෙක් සිදු වී නැත.

හිල්ටන් කළම්බු හෝටලයේ ඉකොයි ටෙයි අවන් හල පිහිටා ඇති බදුකර ඉඩම අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන ලද මුදල 2016.12.02 දිනෙන් ආරම්භ කර වසර 5ක කල් බදු කාල පරිච්ඡේදය තුළ දී ක්‍රමක්ෂය කරනු ලැබේ. කෙසේ වෙතත්, පවතින වෙළඳපල තත්ත්වය හේතුවෙන්, 2021.01.01 දින සිට ඉහළ කුලී පිරිවැය හේතුවෙන් ඉකොයි ටෙයි අවන්හලේ ක්‍රියාකාරිත්වය නතර කර පරිශ්‍රය නැවත භාර දීමට සමාගම තීරණය කළේය. තවද, 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වසර 4 ක කාල පරිච්ඡේදයක් සඳහා හෝටලය ඉදිරිපිට පිහිටි පර්චස් 30 ක ඉඩම, රථ ගාලක් සඳහා බදු දීමට සමාගම UDA සමඟ බදු ගිවිසුමකට එළඹෙන ලදී.

	31.12.2021	31.12.2020
	රු. '000	රු. '000
14. භාණ්ඩ තොග		
ආහාර	**23,483**	13,880
පාන	**27,937**	21,980
පොදු ගබඩාව	**1,614**	11,981
	53,033	47,841
15. අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්		
අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	**76,640**	34,170
අඩු කළා: ණය ගැතියන්ගේ ඌනකරණය	**(1,900)**	(6,358)
	74,740	27,813
16. සම්බන්ධිත පාර්ශ්වයෙන් ලැබිය යුතු මුදල්		
හිල්ටන් කළම්බු රෙසිඩන්ස්	**1,030**	564
හිල්ටන් වීරවිල	**1,161**	2,870
හිල්ටන් යාල	**51**	17
හිල්ටන් වර්ල්ඩ්වයිඩ් මැනේජ් සමාගම එක්සත් රාජධානිය	**-**	7,038
	2,242	10,489

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
17. වෙනත් වත්කම්		
තැන්පතු, පෙර ගෙවුම් හා අත්තිකාරම්	**68,823**	82,411
අය විය යුතු වෙනත් මුදල්	**64,855**	39,565
අත්තිකාරම් - ප්‍රතිසංස්කරණ වියදම්	**418,847**	71,451
අය විය යුතු ආදායම් බදු	**26,463**	44,333
	578,988	237,759
18. ජංගම මූල්‍ය වත්කම්		
කෙටි කාලීන ආයෝජන		
කැඳවුම් තැන්පතු	**110,111**	150,970
මූළු කෙටි කාලීන ආයෝජන	**110,111**	150,970
19. මුදල් හා බැංකු ශේෂ		
ඉතිරි කිරීමේ ගිණුම - ඇමරිකානු ඩොලර්	**99,844**	4,770
ක්‍රියාත්මක බැංකු ගිණුම	**22,510**	42,336
	122,354	47,106

ඇමරිකානු ඩොලර් ඉතිරි කිරීමේ ගිණුමේ වර්ෂ අවසාන ශේෂය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ශේෂ පත්‍ර දිනයේ අවසන් අනුපාතිකයට අනුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ව්‍යවහාර මුදල වන රුපියල් බවට පරිවර්තනය කර ඇත.

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
20. ප්‍රකාශිත ප්‍රාග්ධනය		
20.1. නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවූ		
සාමාන්‍ය කොටස් 2,046,645,686	**20,466,456**	20,466,456
21. සංචිත		
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිස්ථාපන සංචිතය (21.1 සටහන)	**53,801**	1,649

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
21.1. ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිස්ථාපන සංචිත		
වර්ෂය ආරම්භයේ දී ශේෂය	**1,649**	43,864
එකතු කළා: වර්ෂය තුලදී සම්පාදිත ප්‍රතිපාදන	**68,629**	21,577
අඩු කළා: ස්කන්ධ ප්‍රකාශයට පැවරූ මුදල් ගෘහ භාණ්ඩ හා සවි කිරීම් මිල දී ගැනීම හා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා උපයෝග කර ගත් මුදල	**(16,477)**	(63,792)
වර්ෂය අවසානයේ දී ශේෂය	**53,801**	1,649

වර්ෂය තුළ දී ඇමරිකානු ඩොලර් 700,000කට සමාන මුදලක් ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ සංචිතයට පවරා ඇත.

22. පොලී සහිත ණය ගැනීම්

	2021			2020		
	වසරක් ඇතුළත ගෙවිය යුතු මුදල්	වසරකට පසු ගෙවිය යුතු මුදල්	එකතුව	වසරක් ඇතුළත ගෙවිය යුතු මුදල්	වසරකට පසු ගෙවිය යුතු මුදල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
DFCC බැංකුව- සහන ණය පහසුකම - පශ්චාත් පාස්තු ප්‍රහාරය	-	-	-	170,080	55,556	225,636
මහජන බැංකුව, පශ්චාත් කොවිඩ් කාරක ප්‍රාග්ධන ණය	**16,600**	-	**16,600**	8,400	16,600	25,000
කාලීන ණය - මහජන බැංකුව	-	**1,098,372**	**1,098,372**	-	-	-
	16,600	**1,098,372**	**1,114,972**	178,480	72,156	250,636

22.1. කාලීන ණය

	2021.01.01 දිනට ශේෂය	නව ණය ලබා ගැනීම්	ආපසු ගෙවීම	ශේෂය
	රු. '000	රු. '000	රු. '000	රු. '000
DFCC බැංකුව- සහන ණය පහසුකම - පශ්චාත් පාස්තු ප්‍රහාරය	**225,636**	-	**(225,636)**	-
මහජන බැංකුව, පශ්චාත් කොවිඩ් කාරක ප්‍රාග්ධන ණය	**25,000**	-	**(8,400)**	16,600
කාලීන ණය - මහජන බැංකුව	-	**1,098,372**	-	1,098,372
	250,636	**1,098,372**	**(234,036)**	1,114,972

ඇපකර සහ ආපසු ගෙවීමේ කොන්දේසි

මූල්‍ය ආයතනය	මහජන බැංකුව	DFCC බැංකුව	මහජන බැංකුව
පහසුකමේ ස්වභාවය	කාලීන ණය	කාලීන ණය	කාලීන ණය
ණය මුදල	රු. මිලියන 25	රු. මිලියන 250	රු. මිලියන 2,000
පොලී අනුපාතය	වාර්ෂිකව 4%	වාර්ෂිකව 3.46%	AWPLR + 1.5%
ඇපකරය	නැත	නැත	දේපල උකස් කර ඇත
ආපසු ගෙවීමේ කාලය	වාරික 18	වාරික 18	වසර 2ක සහන කාලයක් ඇතුළුව වසර 7ක්

මහජන බැංකුවෙන් රුපියල් මිලියන 2,000 ක නව ණය පහසුකම ලබා ගන්නා විට DFCC බැංකුවෙන් ලබා ගත් රුපියල් මිලියන 250 ක ණය පහසුකම 2021 දී සම්පූර්ණයෙන්ම පියවා ඇත.

23. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

	31.12.2021	31.12.2020
	රු. '000	රු. '000
වර්ෂය ආරම්භයේ දී ශේෂය	**148,198**	134,550
වර්ෂය සඳහා භාරය	**(4,383)**	9,959
සංක්‍රාන්තික බැරකම්/(වත්කම්) සහ ආයුගණක අලාභය/(ලාභය) හඳුනා ගැනීම	**3,250**	14,636
උපකල්පනවල සිදු වූ වෙනස් වීම් හෝ පූර්ව වර්ෂවල ලබා දුන් (අධි)/ඌන ප්‍රතිපාදන නිසා හට ගත් අලාභය/(ලාභය)	**(25,880)**	(6,548)
වර්ෂය සඳහා පොලී පිරිවැය	**10,374**	13,456
වර්ෂය තුළ දී කරන ලද ගෙවීම්	**(33,577)**	(17,855)
වර්ෂය අවසානයේ දී ශේෂය	**97,982**	148,198

පියල් එස්. ගුණතිලක ඇසෝසියේට්ස් ආයතනය විසින් කරන ලද ආයුගණක තක්සේරුව මත සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව පදනම් වී ඇත. වට්ටම් අනුපාතික උපකල්පනය සහ වාර්ෂික මූලික වැටුප් වැඩි වීම හැර සෙසු සියලු ම උපකල්පන එලෙසින් ම පවතින අතර ඉදිරි වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ දී නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්මට ලබා දෙන දායකත්වයේ කිසිදු සැලකිය යුතු වෙනසක් අපේක්ෂා නොකෙරේ. භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික නියෝජනය වන පරිදි වට්ටම් අනුපාතික (පසු ගිය වර්ෂයේ පැවති 7.00% සිට) 11.21% දක්වා සංශෝධනය කරන ලදි. සේවක ප්‍රතිලාභවල පිරිවැය නිශ්චය කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන උපකල්පන යොදා ගන්නා ලදි:

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

	31.12.2021	31.12.2020
වට්ටම් අනුපාතිකය	**11.21%**	7.00%
අනාගත වැටුප් වැඩි වීම	**3.00%**	3.00%
විශ්‍රාමික වයස	**60 Years**	55 Years

සංවේදිතාව හා කල් පිරීම	වට්ටම් අනුපාතිකය		වැටුප් වර්ධකය	
	2021	**2020**	**2021**	**2020**
ප්‍රතිශත අංක එකකින් වැඩි වීම	**(4,628)**	(5,326)	**5,243**	5,603
ප්‍රතිශත අංක එකකින් අඩු වීම	**5,126**	5,853	**(4,799)**	(5,179)

	31.12.2021 රු. '000
2021 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පිළිබඳ කල් පිරීම් විශ්ලේෂණය - වට්ටම් නොකළ	
ඊළඟ මාස 12 තුළ	**13,542**
වසර 1 සහ 2 අතර	**327**
වසර 2 සහ 5 අතර	**25,746**
වසර 5 සහ 10 අතර	**77,668**
මුළු අපේක්ෂිත ගෙවීම්	**117,283**

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
24. විලම්බිත බදු බැරකම		
වර්ෂය ආරම්භයේ දී ශේෂය	**433,198**	410,798
විලම්බිත බදු වියදම/(ආදායම)	**(37,060)**	22,400
වර්ෂය අවසානයේ දී ශේෂය	**396,138**	433,198
24.1. අවසන් විලම්බිත බදු බැරකම් ශේෂය පහත දැක්වෙන දෑට අදාළ වේ		
බදු කටයුතු සඳහා කඩිනම් ක්ෂය කිරීම	**805,209**	781,229
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	**3,862**	(20,748)
ඉදිරියට ගෙනා බදු අලාභ උපයෝග කර ගැනීමට අදාළ විලම්බිත බදු වත්කම	**(412,932)**	(327,284)
	396,139	433,198

විලම්බිත බද්ද 14% අනුපාතිකයට ගණනය කර ඇත.

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
25. ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල්		
වෙළඳ කටයුතු සඳහා ගෙවිය යුතු මුදල්	**166,864**	68,358
උපචිත වියදම් ඇතුළු විවිධ ණය හිමියන්	**110,126**	78,652
ගෙවිය යුතු කළමනාකරණ ගාස්තුව*	**(14,239)**	(14,239)
වෙනත් බැරකම්	**33,488**	114,610
කැඩුණු බිඳුණු දෑ ප්‍රතිස්ථාපනය	**4,492**	2,398
ගෙවිය යුතු ව්‍යවස්ථාපිත මුදල්	**118,204**	48,556
	418,936	298,335

*ඍණ ශේෂයෙන් හිල්ටන් ඉන්ටර්නැෂනල් මැනේජ්මන්ට් (එල්.එල්.සී.) සමාගමට ගෙවන ලද අධිකළමනාකරණ ගාස්තු නියෝජනය වේ.

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
26. සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල්		
හිල්ටන් ඉන්ටනැෂනල් LLC	**26,475**	10,080
	26,475	10,080
27. ගිවිසුම් බැරකම්		
අමුත්තන්ගේ අත්තිකාරම් තැන්පතු හා අත්තිකාරම්	**158,114**	59,892
	158,114	59,892
28. කොටසකට ශුද්ධ වත්කම්		
ශුද්ධ වත්කම් අගය (රු.)	**13,164,918**	14,099,514
සාමාන්‍ය කොටස් සංඛ්‍යාව "000"	**2,046,646**	2,046,646
කොටසකට ශුද්ධ වත්කම්	**6.43**	6.89
29. ආදායම් බදු බැරකම		
ආරම්භක ශේෂය	**(44,333)**	(62,696)
කාල පරිච්ඡේදය සඳහා ප්‍රතිපාදනය	**1,260**	-
පූර්ව වර්ෂයේ ඌන ප්‍රතිපාදනය	**-**	-
බදු බැර		
ආර්ථික සේවා භාරය	**16,610**	18,363
රැඳවුම් බද්ද	**-**	-
කල්පිත බද්ද	**-**	-
ස්වයං තක්සේරු ගෙවීම	**-**	-
වර්ෂය අවසානයේ දී ශේෂය (වෙනත් වත්කම්වලට පැවරූ ප්‍රවර්තන වර්ෂයේ ශේෂය)	**(26,463)**	(44,333)
30. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන		
30.1. වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන වත්කම්		
මුදල් හා බැංකු ශේෂය	**47,106**	141,548
කැඳවුම් තැන්පතු	**150,970**	109,990
බැංකු අයිරාව	**(946,040)**	(254,492)
ඇමරිකානු ඩොලර් ඉතිරි කිරීමේ තැන්පතුව මත උපලබ්ධි නොවූ විනිමය	**(358)**	113
	(748,323)	(2,841)
30.2. වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන වත්කම්		
මුදල් හා බැංකු ශේෂය	**122,354**	47,106
කැඳවුම් තැන්පතු	**110,111**	150,970
බැංකු අයිරාව	**(1,332,328)**	(946,040)
	(1,099,863)	(747,964)

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

31. දෙසැම්බර් 31 දිනට තක්සේරු පදනම අනුව මූල්‍ය සාධන පත්‍ර පිළිබඳ විශ්ලේෂණය

කාණ්ඩ අනුව මූල්‍ය වත්කම්	ණය සහ අය විය යුතු මුදල්	
	31.12.2021	**31.12.2020**
	රු. '000	රු. '000
ජංගම වත්කම් ආශ්‍රිත මූල්‍ය සාධන පත්‍ර		
අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	**74,740**	27,813
වෙනත් වත්කම්	**578,988**	237,759
සම්බන්ධිත පාර්ශ්වයෙන් ලැබිය යුතු මුදල්	**2,242**	10,489
වෙනත් ජංගම මූල්‍ය වත්කම්	**110,111**	150,970
අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති මුදල්	**122,354**	47,106
එකතුව	**888,435**	474,137

කාණ්ඩ අනුව මූල්‍ය බැරකම්	ක්‍රමක්ෂය කළ පිරිවැය අනුව තක්සේරු කරන ලද මූල්‍ය බැරකම්	
	31.12.2021	**31.12.2020**
	රු. '000	රු. '000
ජංගම බැරකම් ආශ්‍රිත මූල්‍ය සාධන පත්‍ර		
ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල්	**418,936**	298,335
සම්බන්ධිත පාර්ශ්වයට ගෙවිය යුතු මුදල්	**26,475**	10,080
බැංකු අයිරා	**1,332,328**	946,040
එකතුව	**1,777,739**	1,254,455

32. මූල්‍ය අවදානම් කළමනාකරණය

සමාගමේ ව්‍යාපාරික කටයුතු (ව්‍යවහාර මුදල් අවදානම, පොලී අනුපාතික අවදානම සහ මිල අවදානම ඇතුළු) වෙළඳ පොළ අවදානම, ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම යනාදි විවිධ මූල්‍ය අවදානම්වලට පාත්‍ර වේ. සමාගමේ සමස්ත අවදානම් කළ නොහැකි බව කෙරෙහි අවධානය යොමු කරන අතර සමාග මේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ඉන් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කර ගැනීමට උත්සාහ කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති යටතේ මුදල් දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණ කාර්යය ඉටු කරනු ලැබේ.

සමාගමේ ප්‍රධාන මූල්‍ය සාධන පත්‍ර අතරට කෙටි කාලීන තැන්පතු, මූල්‍ය වෙළ ආයෝජන, සහ මුදල් අයත් වේ. මෙම මූල්‍ය සාධන පත්‍රවල ප්‍රධාන අභිප්‍රාය සමාගමේ මෙහෙයුම්වල ද්‍රවශීලතාව ඉහළ නැංවීම හා පවත්වා ගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිතවල ප්‍රතිලාභ උපරිම කිරීම යි. ස්වකීය ව්‍යාපාරික කටයුතුවලින් සෘජුව පැන නගින අය විය යුතු වෙළඳ මුදල් ඇතුළු වෙනත් විවිධ මූල්‍ය සාධන පත්‍ර ගණනාවක් ද සමාගම සතුව ඇත.

32.1. ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය සාධන පත්‍රයක් හෝ ගනුදෙනුකරු ගිවිසුමක් යටතේ සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට යම් ප්‍රතිපාර්ශ්වයක් අසමත් වීම නිසා අනාගතයේ මූල්‍ය අලාභයක් සිදු වීමට ඇති හැකියාව යි. හෝටලය ස්වකීය මෙහෙයුම් කටයුතු (ප්‍රධාන වශයෙන් අය විය යුතු වෙළඳ මුදල්) මගින් සහ ස්වකීය මූල්‍ය කටයුතු මගින් ණය අවදානමට පාත්‍ර වේ.

හෝටලය වෙළඳ කටයුතුවල නිරත වන්නේ පිළිගත්, විශ්වසනීය, ණය ලැබීමට සුදුසු තෙවන පාර්ශ්වයන් සමග පමණකි. ණය කොන්දේසි මත ගනුදෙනු කිරීමට අපේක්ෂා කරන සියලු ම සේවාලාභීන් ණය සත්‍යායන ක්‍රියාවලියකට යටත් කිරීම හෝටලයේ ප්‍රතිපත්තිය යි. මීට අමතරව අය විය යුතු ශේෂයන් අඛණ්ඩ පදනමකින් නිරීක්ෂණය කෙරෙන අතර හෝටලයේ බොල් ණය පාත්‍රතාව ඉතා අවම මට්ටමක පැවතීම එහි ප්‍රතිඵලය යි.

මුදල් සහ මුදල් හා සමාන වත්කම්, වෙනත් මූල්‍ය නොවන වත්කම් සහ අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල් යනාදි හෝටලයේ අනෙක් මූල්‍ය වත්කම්වලින් පැන නගින ණය අවදානම සම්බන්ධයෙන් ගත් විට හෝටලයේ ණය අවදානම් පාත්‍රතාව පැන නගින්නේ ප්‍රතිපාර්ශ්වය ණය ගෙවීම පැහැර හැරීම මගිනි. හෝටලය ප්‍රතිපාර්ශ්වීය අවදානම පමණ ඉක්මවා සංකේන්ද්‍රණය වීම වළක්වා ගැනීමට හැකි වන පරිදි සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යන අතර ප්‍රතිපාර්ශ්වයන් සිය බැඳීම් නොපිරිහෙළා ඉටු කරන බව සහතික කිරීම සඳහා සියලු යුක්ති සහගත පියවරයන් ගනියි.

32.2. ණය අවදානම් පාත්‍රතාව

සාමාන්‍යයෙන් ණය අවදානමට පාත්‍ර වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් මට්ටම් (ඇපකර තිබෙන්නේ ද යන්න නොතකා) ඒවායේ ධාරණ අගයන්ට සමාන වේ. පහත දැක්වෙන වගුව උපරිම අවදානම් මට්ටම් පෙන්වා දෙයි:

රු. "000"වලින්	2021.12.31 දිනට				
	අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති මුදල්	කෙටි කාලීන ආයෝජන	අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල් අදාළ	අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්	එකතුව
බැංකුවේ ඇති තැන්පතු	-	**110,111**	-	-	**110,111**
අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	-	-	**74,740**	-	**74,740**
සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්	-	-	-	**2,242**	**2,242**
අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති මුදල	**22,510**	**99,844**	-	-	**122,354**
මුළු ණය අවදානම් පාත්‍රතාව	**22,510**	**209,955**	**74,740**	**2,242**	**309,447**

රු. "000"වලින්	2020.12.31 දිනට				
	අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති මුදල්	කෙටි කාලීන ආයෝජන	අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල් අදාළ	අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්	එකතුව
බැංකුවේ ඇති තැන්පතු	-	150,970	-	-	150,970
අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්	-	-	27,813	-	27,813
සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්	-	-	-	10,489	10,489
අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති මුදල	42,336	4,770	-	-	47,106
මුළු ණය අවදානම් පාත්‍රතාව	42,336	155,740	27,813	10,489	236,378

32.3. අය විය යුතු වෙළඳ හා වෙනත් මුදල්

රු. "000"වලින්		2021.12.31 දිනට	2020.12.31 දිනට
හිඟ හිටීමක් හෝ ඌනකරණයක් සිදුව නැති		**112,244**	56,793
හිඟ හිටීමක් නමුත් ඌනකරණයක් සිදුව නැති	30-60	**18,228**	349
	61-90	**1,629**	1,184
	91-120	**-**	174
	121-150	**-**	827
	151>	**1,184**	7,131
දළ ධාරණ අගය		**76,640**	34,170
අඩු කළා: ඌනකරණ ප්‍රතිපාදනය			
වෙන වෙනම තක්සේරු කළ ඌනකරණ ප්‍රතිපාදනය		**(1,900)**	(6,358)
එකතුව		**74,740**	27,813

32.4. සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්

හිල්ටන් දාමයේ අනුබද්ධ සමාගම්වලින් ලැබිය යුතු මුදල්වලින් ශේෂය සමන්විත වේ.

32.5. මුදල් සහ මුදල් හා සමාන වත්කම් ආශ්‍රිත ණය අවදානම

වර්තමාන ශ්‍රේණිගත කිරීම් සහ ආර්ථික දැක්ම පදනම් කර ගෙන, ගිණුම් මූලිකාංග සහ වෙළඳ පොළ දර්ශක පිළිබඳ විශ්ලේෂණය සැලකිල්ලට ගනිමින් සමාගම විසින් පිළිගත හැකි මූල්‍ය ප්‍රතිපාර්ශ්වයන්ගේ අනුදත් ලැයිස්තුවක් පවත්වා ගෙන යනු ලැබේ. 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,099 (2020 දෙසැම්බර් 31 දිනට - රු. මිලියන 748).

32.6. ද්‍රවශීලතා අවදානම

ස්වාභාවික වර්ධනය ඇතුළු සමාගමේ කෙටි හා මධ්‍ය කාලීන අරමුදල් බැඳීම් සපුරාලීමට සහ කවර හෝ අනපේක්ෂිත බැඳීමක් හෝ අවස්ථාවක් පැන නැගුණ හොත් සපුරාලීමට සමාගම සතුව අරමුදල් පවතින බව සහතික කිරීමට ප්‍රමාණවත් මට්ටමකට මුදල් තබා ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය යි.

සමාගම විසින් දෛනික මුදල් කළමනාකරණ ක්‍රියාවලියක් යොදා ගනිමින් අරමුදල් හිඟයක් ඇති වීමේ අවදානම නිරීක්ෂණය කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේ දී සමාගමේ මූල්‍ය ආයෝජන හා මූල්‍ය වත්කම්වල (උදා: අය විය යුතු ගිණුම්, වෙනත් මූල්‍ය වත්කම්) කල් පිරීම සහ මෙහෙයුම්වල ප්‍රක්ෂිප්ත මූල්‍ය ප්‍රවාහ සැලකිල්ලට ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

ශුද්ධ (ණය)/මුදල රු. "000"වලින්	2021.12.31 දිනට	2020.12.31 දිනට
කෙටි කාලීන ආයෝජන	**110,111**	150,970
අතේ ඇති මුදල් හා බැංකුවේ ඇති මුදල්	**122,354**	47,106
මුළු ද්‍රවශීල වත්කම්	**232,465**	198,076
බැංකු අයිරා	**1,332,328**	946,040
මුළු ණය ගැනීම්	**1,332,328**	946,040
ශුද්ධ (ණය)/මුදල	**(1,099,863)**	(747,964)

32.7. කල් පිරීම් විශ්ලේෂණය

පහත දැක්වෙන වගුව ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් පදනම් කර ගෙන 2021 දෙසැම්බර් 31 දිනට හෝටලයේ මූල්‍ය බැරකම් කල් පිරීම් සංක්ෂිප්තව දක්වයි:

	2021.12.31 දිනට		2020.12.31 දිනට	
රු. "000"වලින්	වර්ෂය තුල	එකතුව	වර්ෂය තුල	එකතුව
ගෙවිය යුතු වෙළඳ හා වෙනත් මුදල්	**418,936**	**418,936**	298,335	298,335
සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල්	**26,475**	**26,475**	10,080	10,080
රඳවා ගත් ගාස්තු - ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	**48,252**	**48,252**	26,220	26,220
බැංකු අයිරා	**1,332,328**	**1,332,328**	946,040	946,040
	1,825,991	**1,825,991**	1,280,675	1,280,675

32.8. වෙළඳ පොළ අවදානම

වෙළඳ පොළ අවදානම යනු මූල්‍ය සාධන පත්‍රයක අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි සාධාරණ අගය වෙළ මිල ගණන්වල සිදු වන වෙනස් වීම් හේතුවෙන් උච්චාවචනය වීමේ අවදානම යි. හෝටලය සිය මූල්‍ය සාධන පත්‍ර භාවිතය හේතුවෙන් වෙළඳ පොළ අවදානමට විශේෂයෙන් ම ව්‍යවහාර මුදල් අවදානමට සහ සමහර වෙනත් මිල අවදානම්වලට නිරාවරණය වේ.

33. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

පහත දැක්වෙන ඒවා හැර මූල්‍ය ප්‍රකාශවල දී ගැළපීම් සිදු කිරීමට හෝ අනාවරණය කිරීමට හේතු වන වැදගත් සිදුවීම් කිසිවක් වාර්තාකරණ දිනට පසුව සිදු වී නොමැත.

කොවිඩ්-19 පැතිර යාම පෘථිවි ගෝලය පුරා බොහෝ දේශීය ආර්ථිකයන්ට දැඩි ලෙස බලපා ඇත. බොහෝ රටවල දී දීර්ඝ හෝ අනියත කාල පරිච්ඡේදයකට මෙහෙයුම් නතර කිරීමට හෝ සීමා කිරීමට ව්‍යාපාරවලට බල කෙරී ඇත. මේ මොහොත වන විට කොවිඩ්-19 වසංගතය පවත්නා කාල සීමාව හෝ එහි බලපෑම පැහැදිලි නැත. එම නිසා මෙම ප්‍රතිවිපාක පවත්නා කාල සීමාව හා ඒවායේ දරුණුකම සහ අනාගත කාල පරිච්ඡේදවල දී සමාගමේ මූල්‍ය තත්ත්වය හා ප්‍රතිඵල කෙරෙහි ඒවායින් ඇති වන බලපෑම විශ්වසනීය අන්දමින් ඇස්තමේන්තු කළ නොහැකි ය. මෙම සිදුවීම් ගැළපිය නොහැකි තදනන්තර සිදුවීම් යැයි සමාගම තීරණය කර ඇත. එම නිසා 2021 දෙසැම්බර් 31 දිනට සහ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵල ගළපා නැත.

කොවිඩ්-19 පැතිරීම හා සම්බන්ධ සමාජ දුරස්ථ ප්‍රයත්නයන්, නිරෝධායන සහ දේශසීමා වසා දැමීම් හේතුවෙන් ඇති වූ ඉල්ලුමේ සැලකිය යුතු අඩුවීමට ප්‍රතිචාර වශයෙන්, සමාගම 2020 සිට මෙහෙයුම් පාඩු ලබා ඇත. කෙසේ වෙතත්, මෙය තාවකාලික පසුබෑමක් ලෙස සලකා කළමනාකාරිත්වය විසින් මෙම තීරණාත්මක කාල පරිච්ඡේදය තුළ ව්‍යාපාරය පවත්වාගෙන යාමට හදිසි සැලැස්මක් සකස් කළේය. වත්මන් ශක්තිය මත පදනම්ව සමාගමට මෙම තත්වයට සාර්ථකව මුහුණදීමට හැකි බව කළමනාකාරිත්වය විශ්වාස කරයි.එබැවින් 2022 සිට උච්චතම ව්‍යාපාරික කාල සීමාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා, දැනට පවතින ව්‍යාපාරික කටයුතු අඩු කාල සීමාව තුල මෙහෙයුම් කටයුතු වලට බාධා අවම වන පරිදි ප්‍රතිසංස්කරණ වැඩසටහන වේගවත් කිරීමට තීරණය කර ඇත.

34. ප්‍රාග්ධන බැඳීම්

පහත දැක්වෙන ඒවා හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශ තුළ දී අනාවරණය කිරීමට හේතු වන ප්‍රාග්ධන බැඳීම් හෝ අසම්භාව්‍ය බැරකම් කිසිවක් නොවී ය.

34.1. සමාගම විසින් 2014 ඔක්තෝබර් මාසයේ සිට හෝටලයේ මහා පරිමාණ අලුත්වැඩියාවක් ආරම්භ කරනු ලැබ ඇත. එම නිසා 2014 වර්ෂයේ සිට හිල්ටන් කළම්බු හෝටලය සුවිශාල අලුත්වැඩියාවන්ට ලක් වෙමින් පවතින අතර කාමර, ආහාර පාන අලෙවි සල් සහ රැස්වීම් අවකාශ යනාදි සියලු ම දේපළ ඒ යටතේ වැඩි දියුණුවට ලක් වනු ඇත. මෙම අලුත්වැඩියා වැඩසටහන තීරු බදු සහිතව ඇමරිකානු ඩොලර් මිලියන 10ක අයවැයකට ඌනනය කර ඇති අතර දීර්ඝ කාලීන ණය මුදලක් මගින් ද දේශීය වශයෙන් උත්පාදනය කර ගැනෙන අරමුදල් මගින් ද මූල්‍යකරණය කිරීමට නියමිත ය. ප්‍රාග්ධන බැඳීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය ලැබී ඇති නමුත් ඇමරිකානු ඩොලර් මිලියන 10කට ආසන්න මුදලක් සඳහා මෙතෙක් ගිවිසුම්වලට එළඹී නැත.

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
34.2. කල් බදු බැඳීම්		
අවලංගු කළ නොහැකි මෙහෙයුම් කල් බදු සඳහා ගෙවිය යුතු බදු කුලී:		
වසරක් ඇතුළත	**5,458**	7,984
වසර එකත් පහත් අතර	**4,805**	14,934
	10,264	22,918

කල්බදු බැඳීම පැරණි ලන්දේසි රෝහල් පරිශ්‍රයේ පිහිටි Ikoi Tei අවන්හල සහ නාගරික සංවර්ධන අධිකාරිය සතු වසර 5කට බදු දී ඇති පර්චස් 30 රථගාල හා සම්බන්ධ වේ. 2021 දෙසැම්බර් 31 වන දිනට ඇති ශේෂය නාගරික සංවර්ධන අධිකාරිය සතු රථ ගාලේ කල්බදු කුලිය පිළිබිඹු කරයි.

35. අසම්භාව්‍ය බැරකම

සේවා නියුක්තිය අවසන් කිරීම සහ උත්සව අවස්ථාවක විදුලිය බිඳ වැටීම හේතුවෙන් සිදු වූ අලාභ හානි සඳහා වන්දි ලබා ගැනීම සම්බන්ධයෙන් පවරන ලද නඩු කිහිපයක වගඋත්තරකරු බවට හෝටලය පත්ව සිටී. මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලබන දින වන විට එම නඩුකරවල ප්‍රතිඵල පිළිබඳව පුරෝකථනය කිරීමට කළමනාකාරිත්වයට හැකියාවක් නොමැත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශවල දී එවැනි බැරකම් කිසිවක් සඳහා ප්‍රතිපාදන වෙන් කර නැත.

කොළඹ මහ නගර සභාව 2007 ජූලි 6 දින දරන ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයක් මගින් 2007 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන අදාළ කාල පරිච්ඡේදය සඳහා හෝටල්, අවන් හල් හා නවාතැන් පොළවල් සම්බන්ධයෙන් වූ බලපත්‍ර ගාස්තුව ප්‍රතිශෝධනය කර ඇත. හිල්ටන් කළම්බු ඇතුළු කොළඹ නගරයේ පිහිටි හෝටල් උක්ත බලපත්‍ර ගාස්තු වැඩි කිරීමට එරෙහිව විරෝධය පළ කළ අතර ඒ අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරී ය. 2021 දෙසැම්බර් 31 දිනට එකී නඩු කටයුත්තට අදාළව හෝටලය විසින් රු.101,057,380/- (2020: රු. 48,974,858/-) ප්‍රතිපාදනයක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම නඩුවේ ප්‍රතිඵල පිළිබඳව මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලබන දින වන විට පුරෝකථනය කිරීමට කළමනාකාරිත්වයට හැකියාවක් නොමැත.

36. ඇපකර වශයෙන් ඔඩපනය කරන ලද වත්කම්

සමාගම විසින් නවීකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් මහජන බැංකුව සමඟ අත්සන් කළ රු.මිලියන 2000 ණය ගිවිසුමට එරෙහිව හෝටලයේ ප්‍රධාන දේපළ උකස් කර ඇත.

37. සම්බන්ධිත පාර්ශ්වීය අනාවරණ

37.1. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමග කරනු ලබන ගනුදෙනු

සම්බන්ධිත පාර්ශ්වයන් අතරට ඇතුළත් වන්නේ සමාගමේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් අධිකාරය හා වගකීම දරන පුද්ගලයන් ලෙස අර්ථ නිරූපණය කෙරෙන ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය යි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සහ 2011 අංක 43 දරන ඌන කාර්ය සාධිත හෝ ඌන උපයෝජිත වත්කම් පුනර්ජීවන පණතේ විධිවිධාන ප්‍රකාරව පත් කරන ලද නිසි බලධාරියාගෙන් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමන්විත වේ.

කාල පරිච්ඡේදය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ගෙවන ලද වැටුප් සහ නිසි බලධාරියාට කරන ලද ගෙවීම්වල එකතුව රු. 3,725,000/- කි (2020 - රු. 4,065,000/- කි).

37.2. සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු මුදල් (16 සටහන බලන්න)

37.3. සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදල් (26 සටහන බලන්න)

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

37.4. සම්බන්ධිත පාර්ශ්වයන් සමග කරන ලද ගනුදෙනු

	31.12.2021 රු. '000	31.12.2020 රු. '000
කළමනාකරණ සමාගම - හිල්ටන් ඉන්ටර්නැෂනල් කළමනාකරණ සමායතනය සේවාවන් ලැබීම		
සේවාවන් ලැබීම	**23,864**	5,473
අනුබද්ධ සමාගම්/ගෘප් හොටෙල්		
i. හිල්ටන් වර්ල්ඩ්වයිඩ් මැනේජ් සමාගම එක්සත් රාජධානිය - ස්වාවන් ලැබීම	**29,586**	44,506
ii. හිල්ටන් කළම්බු නිවාස - සම්පාදන සේවා	**7,342**	564
iii. හිල්ටන් යාල නිකේතනය - සේවා සම්පාදනය	**34**	17
iv. හිල්ටන් වීරවිල - සේවා සම්පාදනය	**5,830**	20,640

සම්බන්ධිත පාර්ශ්වයන් සමග කරන ලද ගනුදෙනුවල නියමයන් හා කොන්දේසි

සම්බන්ධිත පාර්ශ්වයන් සමග කරන ලද ගනුදෙනු සිදු වූයේ ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවල කොටසක් ලෙස ය. වර්ෂය අවසානයට හිඟ ජංගම ගිණුම් ශේෂ සුරැකුම් රහිත, පොලී රහිත ඒවා වන අතර පියවීම් සිදු වන්නේ අත්පිට මුදලිනි.

38. වාර්තාකරණ දිනට පවත්නා නඩු කටයුතු

38.1 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක HCCA LA 225/16

මෙම නඩුකරය අංක HCCA LA 69/14 දරන නඩුවට අදාළව 2016 මාර්තු 31 දින ලබා දුන් අධිකරණ නියෝගයට එරෙහිව සීමාසහිත කෝර්නෙල් සහ සමාගම විසින් ගොනු කරන ලද අභියාචනයකි. මෙම නඩුව 2022 මාර්තු 24 වැනි දින කැඳවීමට නියම කර ඇත.

38.2.මහාධිකරණ [සිවිල්] නඩු අංක 1/98 [2] [ගොනු කළ දිනය 1998/3/31]

මෙම නඩුකරය සීමාසහිත මිටිසුයි සහ සමාගම, තායිසෙයි කොපරේෂන් සහ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් (5 වන වගඋත්තරකරු) සහ තවත් වගඋත්තරකරුවන් 9 දෙනෙකුට එරෙහිව සීමාසහිත කෝර්නෙල් සහ සමාගම විසින් ගොනු කරනු ලැබ ඇත.

පැමිණිලිකරු බස්නාහිර පළාත් මහාධිකරණයේ මෙම නඩුකරය ගොනු කොට අධිකරණය වෙත කරුණු සැල කරමින් පැමිණිල්ලේ [m] සහ [n] ඡේද යටතේ වූ ආයාචනා ප්‍රකාරව ඒක පාර්ශ්වීය වාරණ නියෝගයක් ලබා ගත්තේ ය.

මෙම නඩුව 2003.10.29 දින සිට සමථකරණයක් [වෙතොත්] ඇති කර ගැනීමට යටත් කොට පසෙක තබනු ලැබ ඇත.

38.3. කොළඹ දිසා අධිකරණ නඩු අංක 21819/MR

නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් පළමු වෙනි විත්තිකාර ගාමිණී ලක්ෂ්මන් පීරිස් මහතාට එරෙහිව රු. 35,938,000/- ක සහ රු. 36,071,000/- ක මුදලක් උදෙසා තීන්දුවක් ලබා ගැනීම පිණිස මෙම නඩුකරය ගොනු කරනු ලැබ ඇත. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් 2 වෙනි වගඋත්තරකරු වේ.

මෙම නඩුව 2004 මාර්තු 17 දින සිට සමථකරණයක් [වෙතොත්] ඇති කර ගැනීමට යටත් කොට පසෙක තබනු ලැබ ඇත.

38.4. කොළඹ දිසා අධිකරණ නඩු අංක 15322/MR

[ගොනු කළ දිනය 1994/8/4]

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම මෙම නඩුකරයේ පැමිණිලිකරු වේ.

රුපියල් 26,626,613/- ක මුදලක් ඒ මත නෛතික පොලිය ද සමග අය කරවා ගැනීමට නඩු තීන්දුවක් ලබා ගැනීම පිණිස මෙම නඩුකරය විත්තිකාර නිහාල් ශ්‍රී අමරසේකර මහතාට එරෙහිව ගොනු කරනු ලැබ ඇත.

මෙම නඩුව 2007 පෙබරවාරි 28 දින සිට සමථකරණයක් [වෙතොත්] ඇති කර ගැනීමට යටත් කොට පසෙක තබනු ලැබ ඇත.

38.5. මහාධිකරණ [සිවිල්]නඩු අංක 754/2018/MR

සමාගම සහ සමාගමේ ලේකම්වරුන් සමාගමේ කොටස් පවරා දීමට කවර හෝ පියවරක් ගැනීම වැළැක්වීම සඳහා වාරණ නියෝගයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් මෙම නඩුකරය ගොනු කරනු ලැබ ඇත.

38.6. S.C. Case No 182/2021 (FR)

කපිල රේණුක පෙරේරා මහතා (පෙත්සම්කරු) ගරු නීතිපති, සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්, සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්, අග්‍රාමාත්‍යවරයා, මුදල් අමාත්‍යවරයා, භාණ්ඩාගාර ලේකම්, සීමාසහිත හෝටල් සංවර්ධක (ලංකා) ඇතුළු සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ තවත් කිහිප දෙනෙකුට එරෙහිව 2021 ජූලි 7 වැනි දින මූලික අයිතිවාසිකම් අයදුම්පතක් (ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ලෙස එනම් මහජන අවශ්‍යතා නඩුවක්) ගොනු කර ඇත. එම මූලික අයිතිවාසිකම් අයදුම්පත අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වගන්තිය යටතේ ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බව පැවසේ. ඔහු විසින් කරන ලද චෝදනාව වන්නේ රජය සතු වත්කම් කිහිපයක් ක්‍රමානුකූලව සහ/හෝ උපාය මාර්ගිකව පුද්ගලික අංශයට (එනම් පෞද්ගලීකරණය) ලබා දීමයි. ශේෂ්ඨාධිකරණය විසින් අතුරු නියෝග/අත්හිටුවීම් කිසිවක් ලබා දී නොමැති අතර, මෙම දිනය වන විට එම කාරණය ඉදිරියට කරගෙන යාමට අවසර ලබා දී නොමැත. එකී ක්‍රියාවේ වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇති ඇතැම් රාජ්‍ය නිලධාරීන්ගේ/ඇමතිවරුන්ගේ තනතුරු / විෂය පථයන් වෙනස් වීම සැලකිල්ලට ගෙන මෙම ක්‍රියාවේ ශීර්ෂ පාඨය සංශෝධනය කිරීම සඳහා කරුණු කැඳවනු ලැබේ.

පස් අවුරුදු මූල්‍ය සාරාංශය සහ ප්‍රධාන දර්ශක

රු. '000	2021	2020	2019	2018	2017
ආදායම					
කාමර ආදායම	**236,944**	313,080	1,171,875	1,219,736	1,317,248
ආහාර පාන ආදායම	**907,480**	732,119	1,614,671	1,597,494	1,593,286
වෙනත් ආදායම්	**33,957**	35,936	92,206	93,310	104,828
	1,178,381	1,081,135	2,878,752	2,910,540	3,015,362
විකුණුම් පිරිවැය	**(922,695)**	(811,092)	(1,403,693)	(1,427,161)	(1,214,204)
දළ ලාභය	**255,686**	270,043	1,475,059	1,483,379	1,801,158
ආයෝජන ආදායම	**11,222**	10,873	10,708	15,627	25,533
වෙනත් ලාභ සහ අලාභ	**31,191**	25,391	20,807	54,355	29,429
පරිපාලන වියදම්	**(585,498)**	(591,036)	(910,514)	(854,539)	(828,206)
වෙනත් වියදම්	**(167,921)**	(171,603)	(281,942)	(283,429)	(383,491)
මෙහෙයුම් ලාභය	**(455,319)**	(456,330)	314,118	415,394	644,424
ක්ෂය	**(386,618)**	(378,443)	(515,265)	(500,861)	(461,542)
ප්‍රත්‍යාගණය අලාභය	**-**	-	(61,223)	-	-
මූල්‍ය වියදම්	**(134,477)**	(42,569)	(50,078)	(40,994)	(9,905)
බදුකරණයට පෙර ලාභය / (අලාභය)	**(976,414)**	(877,342)	(312,448)	(126,461)	172,976
ආදායම් බදු වියදම	**19,190**	(40,764)	(13,182)	(1,046)	85,041
කාල පරිච්ඡේදය සඳහා බදුකරණයට පසු ලාභය/(අලාභය)	**(957,224)**	(918,106)	(325,630)	(127,507)	258,017
වෙනත් විස්තීරණ ආදායම්					
ප්‍රත්‍යාගණන සංචිතය	**-**	-	1,452,978	-	-
සේවක ප්‍රතිලාභ බැරකම් මත ආයුගණක ලාභය/(අලාභය)	**22,630**	(8,088)	(22,455)	14,996	2,415
කාලච්ඡේදය සඳහා මුළු විස්තීරණ ආදායම/(වියදම)	**(934,594)**	(926,193)	1,104,893	(112,512)	260,432
කොටසක ඉපැයීම - මූලික (රු.)	**(0.46)**	(0.45)	0.54	(0.05)	0.13

රු. '000	2021	2020	2019	2018	2017
මෙහෙයුම් ප්‍රතිඵල					
මුළු ආදායම	**1,178,381**	1,081,135	2,878,752	2,910,540	3,015,362
විකුණුම් වර්ධනය %	**9%**	(62%)	(1%)	(3%)	19%
මෙහෙයුම් ලාභය	**(455,319)**	(456,330)	314,118	415,394	644,424
මූල්‍ය වියදම්	**134,477**	42,569	50,078	40,994	9,905
ක්ෂය සහ ක්‍රමක්ෂය	**386,618**	378,443	515,265	500,861	461,542
බදුකරණයට පෙර ලාභය / (අලාභය)	**(976,414)**	(877,342)	(312,448)	(126,461)	172,976
කොටස් හිමියන්ගේ අරමුදල්					
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**20,466,456**	20,466,456	20,466,456	20,466,456	20,466,456
ප්‍රත්‍යාගණන සංචිතය	**1,452,978**	1,452,978	1,452,978	-	-
ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ ප්‍රතිස්ථාපන සංචිත	**53,801**	1,649	43,864	187,217	161,348
සමුච්චිත අලාභය	**(8,808,317)**	(7,821,569)	(6,937,588)	(6,732,856)	(6,594,476)
	13,164,918	14,099,514	15,025,710	13,920,817	14,033,328
සේවයේ යොදවා ඇති වත්කම්					
දේපළ, පිරියත උපකරණ	**8,722,182**	8,486,249	8,728,240	7,485,222	7,818,434
බදුකර ඉඩම	**6,337,966**	6,421,326	6,514,390	6,541,834	6,613,547
නොනිමි ප්‍රාග්ධන කටයුතු	**766,764**	865,477	659,487	591,537	243,414
ශුද්ධ ජංගම වත්කම්	**(1,059,237)**	(997,068)	(43,767)	(193,901)	(122,915)
	14,767,675	14,775,984	15,858,350	14,424,692	14,552,480
අඩු කළා					
දිගු කාලීන වගකීම්					
පොලී සහිත ණය සහ ණය ගැනීම්	**1,098,372**	72,156	250,000	-	-
විශ්‍රාම ප්‍රතිලාභ බැරකම්	**97,982**	148,198	134,550	106,259	122,581
භාවිතය සඳහා ඇති අයිතිය - කල් බදු ඉඩම් බැරකම	**10,264**	22,918	37,291	-	-
විලම්බිත බදු බැරකම	**396,138**	433,198	410,798	397,616	396,570
ශුද්ධ වත්කම්	**13,164,918**	14,099,514	15,025,710	13,920,817	14,033,328
ප්‍රධාන දර්ශක					
ජංගම අනුපාතය	**0.47**	0.34	0.94	0.79	0.86
කොටසකට ශුද්ධ වත්කම් (රු.)	**6.43**	6.89	7.34	6.80	6.86
කොටසකට ඉපැයීම්/(අලාභය) (රු.)	**(0.46)**	(0.45)	0.54	(0.05)	0.13
සංඛ්‍යානමය සාරාංශය					
කාමර නේවාසික අනුපාතය	**10%**	11%	49%	48%	57%
සාමාන්‍ය කාමර ගාස්තු (රු.)	**16,754**	20,681	21,562	22,944	21,077

රැස්වීම කැඳවීමේ නිවේදනය

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2022 සැප්තැම්බර් මස 12 දින ප.ව. 4.00 ට කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ, අංක 2 දරන ස්ථානයේ පිහිටි හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ ඔනික්ස් ශාලාවේදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

න්‍යාය පත්‍රය

1. රැස්වීම කැඳවීමේ නිවේදනය පිළිගැනීම සඳහා පහත සඳහන් යෝජනාව සම්මත කර ගැනීම:

   සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ 2022 සැප්තැම්බර් 07 දිනැති නිවේදනය සමාගම් රෙගුලාසි වල සහ 2007 සමාගම් පනතේ අංක 07 වගන්තිය යටතේ දක්වා ඇති නියමයන්ට වඩා කෙටි දැනුම්දීමකින් නිකුත්කර ඇති නමුත්, එය වලංගු නිවේදනයක් ලෙස පිළිගන ලැබේ.

2. 2021 දෙසැපම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ ගිණුම් වාර්තාව සමඟ විගණක වාර්තාව ලබා ගැනීම සහ සලකා බැලීම.

3. සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස වයස අවුරුදු 78 ක් වන පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා නැවත පත්කිරීම සඳහා පහත දක්වා ඇති සාමාන්‍ය යෝජනාව සම්මත කිරීම:

   වයස අවුරුදු 78 ක් වන පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා සඳහා 2007 අංක 07 දරන සමාගම් පනතේ 210 වන වගන්තියේ දක්වා ඇති වයස් සීමාව අදළ නොවන බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව ඔහු සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබ ඇති බවත් මෙයින් තීරණය කරනු ලැබේ.

4. සමාගමේ අධ්‍යක්ෂ වරයෙකු ලෙස වයස අවුරුදු 76 ක් වන වේලුපිල්ලේ කනගසබාපති මහතා පත්කිරීම සඳහා පහත දක්වා ඇති සාමාන්‍ය යෝජනාව සම්මත කිරීමට

   වයස අවුරුදු 76 ක් වන වේලුපිල්ලේ කනගසබාපති මහතා සඳහා 2007 අංක 07 දරන සමාගම් පනතේ 210 වන වගන්තියේ දක්වා ඇති වයස් සීමාව අදළ නොවන බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව ඔහු සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබ ඇති බවත් මෙයින් තීරණය කරනු ලැබේ.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වන සංශෝධන අනුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය එක්ව, සමාගමේ විගණක ලෙස විගණකාධිවරයා අබණ්ඩව කටයුතු කරන බව සටහන් කර ගැනීම.

සටහන

- තමන් වෙනුවෙන් රැස්වීම් වලට සහභාගී වීමට සහ ඡන්දය පාවිච්චි කිරීමට පෙරකලාසිකරුවකු පත් කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට හිමිකම ඇත.
- පෙරකලාසිකරු සමාගමේ කොටස් හිමියකු වීම අවශ්‍ය නොවේ.
- මේ සමග අමුණා ඇති ප්‍රොක්සි පෝරමය රැස්වීම පැවැත්වීමට පැය 36කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ
පී. ඩබ්ලිව්.සමාගම් ලේකම්වරු (පුද්ගලික) සමාගම
අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ලේකම්වරු

2022 සැප්තැම්බර් 07
කොළඹදී

ප්‍රොක්සි (පෙරකලාසි) ආකෘති පත්‍රය

.....

ස්ථානයේ පදිංචි .....
වන මම/අපි හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්හි සාමාජිකයෙකු/සාමාජිකාවක/සාමාජිකයන් වන අතර, 2022 සැප්තැම්බර් මස 12 දින ප.ව. 4.00 ට පැවැත්වීමට නියමිත සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී සහ එහි යම් කල් තැබූ සැසි වාරයකදී මා/අප නියෝජනය කරමින් ඊට සහභාගි වීමට සහ එම රැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමකදීම මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට මාගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන්

..... යන ස්ථානයේ පදිංචි

..... යන අය පත් කරන අතර ඔහු/ඇය අපොහොසත් වේ නම්.

පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා	කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම්
ධීෂනා S. අමරසේකර මහත්මිය	කොළඹ, හෝ ඇය අපොහොසත් වන්නේ නම්
වේලුපිල්ලේ කනගසභාපති මහතා	කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම්
පුංචි හේවගේ ප්‍රියන්ත දෙණියාය මහතා	කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම්
ලාල් රංජිත් සහබන්දු වීරසිංහ මහතා	කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම්
පැටිකිරි ආරච්චිගේ සුසන්ත අතුල කුමාර මහතා	කොළඹ, හෝ ඔහු අපොහොසත් වන්නේ නම්
ආචාර්ය මද්දුමගේ කපිල චන්දිම සේනානායක	කොළඹ

න්‍යායපත්‍ර කරුණු		පක්ෂව	විපක්ෂව
1.	රැස්වීම කැඳවීමේ නිවේදනය පිළිගැනීමට	☐	☐
2.	2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ ගිණුම් වාර්තාව සමඟ විගණක වාර්තාව ලබා ගැනීමට සහ සලකා බැලීමට	☐	☐
3.	රැස්වීම කැඳවීමේ නිවේදනයේ අංක 3 යටතේ සඳහන් කර ඇති පරිදි P.A.I.S. පෙරේරා මහතා නැවත පත්කිරීමේ සාමාන්‍ය යෝජනාව සම්මත කිරීමට	☐	☐
4.	රැස්වීම කැඳවීමේ නිවේදනයේ අංක 4 යටතේ සඳහන් කර ඇති පරිදි V. කනගසබාපති මහතා නැවත පත්කිරීමේ සාමාන්‍ය යෝජනාව සම්මත කිරීමට	☐	☐
5.	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සහ 20 වන සංශෝධන අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය එක්ව සමාගමේ විගණක ලෙස විගණකාධිවරයා අබණ්ඩව කටයුතු කරන බව සටහන් කර ගැනීමට	☐	☐

වර්ෂ 2022 ක් වූ ..... වන මෙදින අත්සන් තබන්නට යෙදිණ.

කොටස්කරුගේ අත්සන .....

සටහන:

1. ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් 56 වන පිටුවේ දක්වා ඇත.
2. පෙරකලාසිකරු සමාගමේ කොටස් හිමියෙකු වීම අවශ්‍ය නොවේ.
3. ඡන්දය ලබා දීම සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් ලබා දීමට කරුණාකර අදාළ කොටුවේ “X” සලකුණු යොදන්න.

ප්‍රොක්සි (පෙරකලාසි) ආකෘති පත්‍රය

පෙරකලාසිය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. අදාළ හිස් තැනෙහි ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය පැහැදිලිව ලියා අත්සන හා දිනය යොදා පෙරකලාසි ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

2. පෙරකලාසිය නීතිඥයෙකු විසින් අත්සන් කරනු ලබන්නේ නම් හා ඒ සඳහා වන ඇටෝර්නි බලය සමාගමේ ලියාපදිංචි කර නොමැති නම් පෙරකලාසිය සමග අදාළ ඇටෝර්නි බලපත්‍රයද ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සමාගමක්/ සමායතනයක් සම්බන්ධයෙන් නම්, පෙරකලාසිය නීත්‍යානුකූලව නියම කර ඇති ආකාරයෙන් සම්පූර්ණ කර සහතික කළ යුතුය.

4. සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය රැස්වීම ආරම්භ වීමට යටත් පිරිසෙයින් පැය 36 කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

5. රැස්වීම සඳහා සහභාගි වීමට (සමාගමේ අධ්‍යක්ෂවරයෙකු නොවන) පෙරකලාසිකරුවෙකු පත් කරන කොටස් හිමියෙකු එම පෙරකලාසිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය පෙරකලාසි ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු අතර රැස්වීමට පැමිණෙන විට තම ජාතික හැඳුනුම්පත රැගෙන එන ලෙස පෙරකලාසිකරුගෙන් ඉල්ලා සිටිය යුතුය.

සමාගම පිළිබඳ තොරතුරු

සමාගමේ නම:
හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්

නෛතික ස්වරූපය:
සීමිත බැරකම් සහිත පොදු සමාගමකි

සංස්ථාපිත දිනය:
1983 මාර්තු 15

සමාගමේ ලියාපදිංචි අංකය:
PB 143

අධ්‍යක්ෂවරු:
පලිහවඩන ආරච්චිගේ ඉරේනියස් සිරිනිමල් පෙරේරා මහතා - සභාපති
දීෂනා අමරසේකර මහත්මිය
වේලුප්පිල්ලෙයි කනගසබාපති මහතා
පුංචි හේවගේ ප්‍රියන්ත දෙනියාය මහතා
පැටිකිරි ආරච්චිගේ සුසන්ත අතුල කුමාර මහතා
ලාල් රංජිත් සහබන්දු වීරසිංහ මහතා
ආචාර්ය මද්දුමගේ කපිල චන්දිම සේනානායක
ඉහත සඳහන් අධ්‍යක්ෂවරුන් සතුව සමාගමේ කොටස් නොමැත.

ලියාපදිංචි කාර්යාලය:
හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්
අංක 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02
දුරකථනය: +94 112433435
ෆැක්ස්: +94 112446545
විද්‍යුත් තැපෑල: hdl_hilton@sltnet.lk | admin@hdl.lk
වෙබ් අඩවිය: www.hoteldevelopers.lk

ලේකම්වරුන් හා රෙජිස්ට්‍රාර්වරු:
පී. ඩබ්. කෝපරේට් සෙක්‍රටේරියල් (පෞද්ගලික) සමාගම
අංක 3/171, කිංසි පාර
කොළඹ 08

බැංකුකරුවෝ:
මහජන බැංකුව - ආයතනික ශාඛාව

නීතිඥවරු:
ඩී.එල්. ඇන්ඩ් එෆ්. ද සේරම් සමාගම නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු
47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස
කොළඹ 07

විගණකවරු:
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය, පොල්දූව පාර, බත්තරමුල්ල

This Annual Report is conceptualised, designed and produced by Redworks.

REDWORKS
Member of the Ogilvy Group

www.hoteldevelopers.lk